# 5. ආර්ථික හා සමාජ පොදු කාර්ය පිරිවැය

## 5.1 සමස්ත නිරීක්ෂණ

තිරසාර, ඉහළ ආර්ථික වර්ධනයක් සාක්ෂාත් කර ගැනීමටද, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමටද, කාර්යක්ෂම සහ විශ්වාසදායී ආර්ථික හා සමාජ යටිතල ව්‍යුහ පද්ධතියක් (බලශක්ති, විදුලි සංදේශ සේවා, ගමනාගමනය, වරාය, ජලසම්පාදන හා සනීපාරක්ෂක සේවා, සෞඛ්‍ය සහ අධ්‍යාපනය) අත්‍යවශ්‍ය වේ. ආර්ථික කටයුතු වලදී යටිතල ව්‍යුහ සේවාවන්ගේ ප්‍රමුඛ කාර්යභාරය රජයේ ප්‍රතිපත්ති වල නිසි ලෙස හඳුනා ගෙන ඇති අතර, යටිතල ව්‍යුහ කළමණාකරණ ආයතනවල අයිතිය හා පාලන ව්‍යුහ ප්‍රතිසංස්කරණ පිළිබඳ අවශ්‍යතාවයද අවධාරණය කෙරුණි. රජය මුහුණපාන ලද සම්පත් හිඟතාවයන් සලකා බලන කළ යටිතල ව්‍යුහ ආයෝජනයේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය අත්‍යවශ්‍ය වී ඇත. 1996 අයවැයෙන් යටිතල ව්‍යුහ ආයෝජන රුපියල් දශලක්ෂ 55,533 දක්වා ඉහළ නැංවීම මගින් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.2 ක ඉලක්කයක් කරා එළඹීමටද, රජය අපේක්ෂා කළේය. කෙසේ වුවද, සැබෑ ක්‍රියාකාරීත්වය අපේක්ෂිත ඉලක්කයට වඩා පහතින් පැවති අතර, මෙයට හේතු වූයේ ක්‍රම වේදයේ හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රමාදයන් සහ දේශීය ප්‍රතිපාර්ශවීය අරමුදල් සඳහා පැවැති සම්පත් අවහිරතා විදේශීය අරමුදල් ඌණ උපයෝජනයකට තුඩු දීමත්ය. 1995 වර්ෂය හා සසඳන කළ 1996 දී යටිතල පහසුකම් සඳහා නියම වශයෙන් රජය දැරූ වියදම වූ රුපියල් දශලක්ෂ 45,704 වෙතින් සුළු අඩුවීමක් වාර්තා කරණ ලදී. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව යටිතල පහසුකම් මත ආයෝජන 1995 දී සියයට 6.5 සිට 1996 දී සියයට 5.9 දක්වා පහත වැටුණි.

**සංඛ්‍යා සටහන 5.1**
**යටිතල ව්‍යුහ සඳහා වූ රාජ්‍ය ආයෝජන**

| | ආර්ථික සේවා | | සමාජ සේවා | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | රු. දල | දදේනි. % | රු. දල | දදේනි. % | රු. දල | දදේනි. % |
| 1991 | 26,022 | 7.0 | 2,964 | 0.8 | 28,986 | 7.8 |
| 1992 | 20,444 | 4.8 | 6,137 | 1.4 | 26,581 | 6.2 |
| 1993 | 29,600 | 5.9 | 6,075 | 1.2 | 35,675 | 7.1 |
| 1994 | 29,304 | 5.1 | 7,677 | 1.3 | 36,981 | 6.4 |
| 1995 | 33,711 | 5.0 | 9,854 | 1.5 | 43,565 | 6.5 |
| 1996 (අ) | 34,522 | 4.5 | 11,185 | 1.5 | 45,704 | 5.9 |

(අ) තාවකාලික
මූලය ශ්‍රී ලංකා මහ බැංකුව

යටිතල පහසුකම් සඳහා වූ ඉල්ලුම තවදුරටත් පුළුල් වෙමින් දැනට පවත්නා යටිතල ව්‍යුහ පද්ධතිය මත පීඩනයක් ඇති කළේය. වර්ධනය වෙමින් පවත්නා ඉල්ලුම සපුරාලීමට විදුලි බල සැපයුම ප්‍රමාණවත් නොවූ අතර, ජල විදුලිබලය මත වූ දැඩි රැඳියාව නිසා ස්ථාවර විදුලිබල සැපයුමක් පිළිබඳව පුරෝකථනය කළ නොහැකි විය. කාලාන්තරයක් පුරා පැවති ක්‍රම පද්ධති හා කළමණාකරණ දුර්වලතාවයන්ගෙන් සැදුම්ලත් ගමනාගමන අංශය, එහි වාණිජමය පැවැත්ම පිළිබඳ ගැටළුවට තවදුරටත් මුහුණ පෑ අතර, එම අංශය ප්‍රවාහන සේවා සඳහා වැඩෙමින් පවත්නා ඉල්ලුම සපුරාලීමට සරිලන අයුරින් සැදුම් ගෙන නොතිබුණි. දියුණු ප්‍රවාහණ පද්ධතියක් නොමැතිවීම සහ මාර්ග පද්ධතිය අයහපත් මට්ටමක පැවතීම මධ්‍යයේ, මාර්ගස්ථ රථවාහන සංඛ්‍යාවේ ශීඝ්‍ර වර්ධනය, මාර්ග පද්ධතියේ දැඩි තදබදයට හේතු විය. විදුලි සංදේශ සේවාවන්හි කැපී පෙනෙන වැඩි දියුණුවීමක් තිබියදීත් 1996 අවසානය වන විට දුරකථන ඉල්ලුමෙන් සියයට 50 ක් (දුරකථන 254,500) පමණක් සපුරාලනු ලැබුණි. භාණ්ඩ මෙහෙයවීම් ප්‍රමාණ සඳහා වර්ධනය වෙමින් පැවති ඉල්ලුම සපුරාලීම පිණිස වරාය පද්ධතිය පුළුල් කිරීම සහ නවීකරණය කිරීම කඩිනමින් කළ යුතුව ඇත. දැනට ජල සම්පාදන සහ සනීපාරක්ෂක අංශ පහසුකම් සපයනු ලබන්නේ ජනගහනයෙන් සියයට 60 කටත්, අඩු ප්‍රමාණයකටය. ඉහත කී උප අංශ ප්‍රමුඛතා පදනමක් මත පෙළ ගැස්ම දුෂ්කර වන අතර, වේගවත් වර්ධනය සඳහා අඩිතාලමක් සැපයීමට එම පහසුකම් සියල්ල අත්‍යවශ්‍ය වේ. මේ අනුව, යටිතල ව්‍යුහ පද්ධතිය පුළුල් කිරීම සහ දියුණු කිරීමට අවශ්‍ය සම්පත් ප්‍රමාණය බෙහෙවින් ඉහළ මට්ටමක පවතින අතර, මෙම කාර්ය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය අතිශයින් වැදගත් වේ.

1996 දී යටිතල ව්‍යුහ සේවාවන්හි ව්‍යුහාත්මක අනම්‍යශීලී බව ආශ්‍රිත ගැටළු විසදීම සඳහා හිමිකම පිළිබඳ ප්‍රතිසංස්කරණ, සංවිධාන සැකැස්ම ප්‍රතිව්‍යුහගත කිරීම සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම ආදී කටයුතු මගින් ප්‍රයත්නයන් දරන ලදී. බලශක්ති අංශය අධික ලෙස ජල විදුලිය බලය මත රඳා පැවැත්ම අඩු කිරීම සඳහා ද පියවර ගනු ලැබින. ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම්, අත්පත්කර ගැනීම, ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම හා අයිතිය පැවරීම් (BOO/BOT) පදනම යටතේ මෙගවොට් 51 (කේ.එච්.ඩී.) ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම සඳහා ගිවිසුම් අත්සන් කිරීම සමගම බලශක්ති අංශයෙහි පෞද්ගලික සහභාගිත්වය ආරම්භ විය. අයිතිය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලෙහි පූර්ව නිමිත්තක් ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, රජය සතු සීමිත වගකීම් සමාගමක් ලෙස ප්‍රතිව්‍යවස්ථාපිත කරන ලදී. විදුලි සංදේශ අංශය හා අදාලව විධිවිධාන යන්ත්‍රණය වැඩි දියුණු කිරීම සඳහා විදුලි සංදේශ නියාමක කොමිසම ස්ථාපනය කරන ලදී. වරාය අංශයේ ඇතැම් ක්‍රියාකාරකම් ප්‍රතිව්‍යුහගත කිරීම ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අත්පත් කර ගැනීම සහ ඉදිකිරීම ක්‍රියාත්මක කිරීම හා පැවරීම (BOO/BOT) පදනම යටතේ සලකා බලන ලදී. "ජනතා සන්තක සමාගම් සහ පෞද්ගලික බස්රථ සේවා ප්‍රතිසංවිධානය කිරීම" සඳහා පත්කල කමිටුවෙහි නිර්දේශ හා අනුකූලව මගී ප්‍රවාහන සේවාව ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුනින් ඒ සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන 1996 දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

1996 දී සමාජ යටිතල පහසුකම් සඳහා දැරූ රාජ්‍ය ආයෝජනය රුපියල් දශලක්ෂ 11,185 ක් හෙවත්, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.5 ක් විය. දැඩි සම්පත් හිඟතාවයන් සලකා බලන කල, විශේෂයෙන්ම අධ්‍යාපන සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි අවම වශයෙන් මීට පෙරදී ලඟා කරගත් තත්ත්වයන් සුරැකීම රජය මුහුණ පෑ අභියෝගය විය. ප්‍රශස්ත රාජ්‍ය/ පෞද්ගලික අංශ සම්මිශ්‍රනයක ඇති අවශ්‍යතාවයද, විකල්ප සෞඛ්‍ය සේවා කළමනාකරණ ක්‍රම ස්ථාපනය කිරීමද, සෞඛ්‍ය සේවාවන් සඳහා වර්ධනය වෙමින් පවත්නා ඉල්ලුම් වෙතින් අවධාරණය කෙරුණි. පුළුල් වෙමින් පවත්නා පෞද්ගලික අංශයේ අවශ්‍යතා හා සරිලන පරිදි කුසලතා මත පදනම්වූ අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීම වසර තුලදී සැලකිල්ලට බඳුන් වූ ප්‍රධාන කරුණු අතරින් එකකි. ගුණාත්මක බවින් පහත් මට්ටමක පැවති අධ්‍යාපනය සහ අධ්‍යාපනික පහසුකම් වල ප්‍රාදේශීය විෂමතා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පැවැති ප්‍රධාන බාධක විය. විශේෂයෙන්ම, පවත්නා සුභසාධන වැඩපිළිවෙලවල් තවදුරටත් ඉලක්ක ගත කිරීමෙන්, අධීක්ෂණ කටයුතු නිසි ලෙස මෙහෙයවීම සහ අනෙකුත් වැඩපිළිවෙලවල් ඒකාබද්ධ කිරීම මගින් සුභසාධන වැඩ සටහන් තවදුරටත් විධිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

## 5.2 සෞඛ්‍ය

සෞඛ්‍ය සේවා සඳහා වූ ඉල්ලුම 1996 දී තවදුරටත් වර්ධනය විය. ජනතාව තුළ සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳව දැනුවත් කම සහ අවධානය වැඩිවීමද, මරණ හා සාඵල්‍ය අනුපාතිකය පහත වැටීමේ හේතුවෙන් වයස්ගත සංඛ්‍යාවේ සාපේක්ෂ වර්ධනයද, මෙයට ප්‍රධාන හේතු විය. පවත්නා ජනවාර්ගික අර්බුදය හේතුවෙන් අවතැන් වූවන් සහ අනතුරට පත් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් ඇතිවීම මගින් සෞඛ්‍ය අංශය මත අමතර බරක් පටවනු ලැබිණි. සැපයුම් අංශයෙන් සලකන කල, 1996 දී අභ්‍යන්තර රෝගී සේවාවන්ගෙන් විශාල කොටසක් රජය සැපයූ අතර, පෞද්ගලික අංශයේ දායකත්වය මූලික වශයෙන් බාහිර රෝගී සේවාවන් සඳහා විය. කෙසේ වුවද, සෞඛ්‍ය සේවා, ඖෂධ සහ රෝග විනිශ්චය කිරීමේ නවීන ක්‍රම සඳහා වූ අධික ගාස්තු නිසා පෞද්ගලික අංශයෙන් සැපයූ සෞඛ්‍ය පහසුකම් විශේෂයෙන්ම අඩු ආදායම් ලබන ජන කොටස් වලට ලබාගැනීම පහසු නොවිය.

1996 දී වයස අවුරුදු 5 ට අඩු ළමයින්ගේ සෞඛ්‍ය තත්ත්වය තවදුරටත් වැඩි දියුණු විය. ප්‍රතිශක්තිකරණ එන්නත් මගින් වළකාගතහැකි රෝග 6 හා ආශ්‍රිත රෝගීන් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙසින් පහත වැටුණි. කෙසේ වුවද මෙම යහපත් තත්ත්වය තරමක් දුරට යටපත් කෙරෙමින් 1996 දී රටෙහි සාමාන්‍ය සෞඛ්‍ය තත්ත්වය සංක්‍රාමික රෝග මෙන්ම සංක්‍රාමික නොවන රෝග වල බලපෑමටද ලක් විය. දිළිඳු බව සහ අසතුටුදායක සනීපාරක්ෂක පරිසරය හේතුවෙන් සංක්‍රාමික රෝග වැලඳෙන අතර ආර්ථික සංවර්ධනය, වෙනස් වන ජීවන රටා සහ ජනගහන සංයුතියේ ඇතිවන වෙනස්කම් ආදිය සංක්‍රාමික නොවන රෝග වලට තුඩු දේ. 1996 දී ඇතැම් දිස්ත්‍රික්කවල ඩෙංගු රක්තපාත උණ, ජැපනීස් එන්සෙපලයිටිස් සහ මැලේරියා ආදී බෝවන රෝග සීඝ්‍ර ලෙස පැතිරයාම මගින් පොදුජන සෞඛ්‍ය තත්ත්වය අනතුරුදායක තත්ත්වයකට පත්විය. මේ අතර, හදවත් රෝග, මොලය ආශ්‍රිත රුධිර වාහිණී රෝග, ආහාර මාර්ග පද්ධතියේ රෝග, පිළිකා රෝග, ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග ආදී සංක්‍රාමික නොවන රෝග මෑත කාලයේදී මරණ සංඛ්‍යාවට තුඩුදුන් ප්‍රධාන හේතුන් විය. මේ අතර, ජනගහණ සංයුතියෙහි පරිවර්තිතාවය හේතුවෙන්, වයස්ගත කාණ්ඩ හා ආශ්‍රිත රෝගාබාධ මෑත වර්ෂවලදී වැඩෙමින් පැවැතුනි. මෙයට අමතරව එච්. අයි. වී./ ඒඩ්ස් වැනි අළුතින් පැන නැගුන රෝග ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට තර්ජනයක් වූ අතර, එම රෝග වැලැක්වීම සහ මර්ධනය පිණිස පුළුල් වැඩ පිළිවෙලක දැඩි අවශ්‍යතාවයද එමගින් අවධාරණය කෙරුණි.

පවත්නා සම්පත් සීමාවන් මධ්‍යයේ, රෝග වැළැක්වීමේ සේවාවන් සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යෙදවීමේ අවශ්‍යතාවයද, දිගින් දිගටම පාගේ වැඩිවන ඉල්ලුමට සරිලන සෞඛ්‍ය සේවා සැපයීම ද 1996 වසරේ සෞඛ්‍ය අංශය මුහුණ දුන් මූලික අභියෝග විය. මෙම තත්ත්වය යටතේ, සෞඛ්‍ය අංශය ආශ්‍රිතව රජයේ අනාගත කාර්යභාරය පැහැදිලි ලෙස නිර්වචනය කෙරෙමින් ප්‍රශස්ත රාජ්‍ය/පෞද්ගලික අංශ සම්මිශ්‍රණය තීරණය කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වේ.

සංක්‍රාමික සහ සංක්‍රාමික නොවන රෝග වැළැක්වීම හා පවත්නා රෝග නිවාරණ සේවාවේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම 1996 දී සෞඛ්‍ය ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් අරමුණු කොට ගත්තේය. රෝග වැළැක්වීමේ සේවා ශක්තිමත් කිරීම, ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුවෙන් ලබාගැනීමට ඉඩකඩ සැලසීම සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආවරණය පුළුල් කිරීම, සෞඛ්‍ය යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, ප්‍රාදේශීය මට්ටමේ සෞඛ්‍ය සේවාවන් වැඩිදියුනු කිරීම, ළමා මන්දපෝෂණය අඩුකිරීම සහ ඖෂධ සැපයුම සහ බෙදාහැරීම වැඩි දියුණු කිරීම අනුගමනය කළ ප්‍රධාන උපාය මාර්ග විය. නොමිලයේ සපයන සෞඛ්‍ය සේවාවන් මත ඇතිවන මූල්‍යමය බර අඩු කිරීම සහ සීඝ්‍රයෙන් වර්ධනය වන සෞඛ්‍ය සේවා ඉල්ලුම සපුරාලීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සාමූහික හා සහයෝගී පැවැත්ම වැඩිදියුණු කිරීම, රෝග නිවාරණ ක්ෂේත්‍රය හා අදාලව රජයේ ප්‍රධාන අරමුණ විය. සෞඛ්‍ය අංශයේ කටයුතු පාලනය සහ විධිමත් කිරීමේ වැදගත් පියවරක් වශයෙන් පෞද්ගලික වෛද්‍ය ආයතන පනත වසර තුළදී කෙටුම්පත් කරන ලදී. ජාතික සෞඛ්‍ය සේවා කමිටුව, ජාතික සෞඛ්‍ය සංවර්ධන කමිටුව සහ උපදේශක කමිටුව, සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේදී සහභාගී විය.

1996 දී සෞඛ්‍ය අංශය සඳහා වූ රජයේ මුළු වියදම සියයට 10 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 12,028 ක් විය. මුළු වියදමින් සියයට 77 ක් සෞඛ්‍ය කටයුතු නඩත්තු කිරීම සඳහා වූ අතර, ඉතිරිය නව ආයෝජන සඳහා විය. අදාල දෙවසර තුළදී සෞඛ්‍ය සඳහා දැරූ මුළු වියදම දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 1.6 ක නොවෙනස්ව පැවතුනි. කෙසේ වුවද රජයේ වියදමෙහි සෞඛ්‍ය සේවා වියදම 1996 දී සියයට 5.5 දක්වා ඉහළ ගියේය. සෞඛ්‍ය අංශය තුළ උද්ගත වෙමින් පවත්නා අභියෝග හමුවේ රෝග වැළැක්වීමේ සේවාවන් සඳහා සම්පත් වැඩි වශයෙන් බෙදාහැරීම අවශ්‍ය වේ. මෙම තත්ත්වය යටතේ, රෝග නිවාරණ සේවා සඳහා අතිරේක සම්පත් උත්පාදනයේදී විකල්ප සෞඛ්‍ය සේවා පාලන ක්‍රම පිළිබඳ අවධාරණය කළ යුතු වේ. පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා සඳහා දැනට පවත්නා ඉහළ ඉල්ලුම මගින් පැහැදිලිවම පෙන්නුම් කරනුයේ ජනගහනයෙන් ඇතැම් කොටසක් ඔවුන්ට සැපයෙන සෞඛ්‍ය සේවා සඳහා ගෙවීම් කිරීමට කැමැති බවයි. මේ අනුව රාජ්‍ය අංශය සපයනු ලබන ඇතැම් පහසුකම් සඳහා භාවිත ගාස්තුවක් අයකිරීම (නිදසුනක් සේ ගෙවන වාට්ටු පහසුකම් තවදුරටත් පුළුල් කිරීම) මතු රාජ්‍ය සෞඛ්‍ය ප්‍රතිපත්තීන්හිදී සලකා බැලිය හැක. අවම වශයෙන් මෙම භාවිත ගාස්තු වලින් කොටසක් එම අදාල සේවා නඩත්තු කිරීම සඳහා නැවත ආයෝජනය සහතික කෙරෙන ක්‍රමයක් ක්‍රියාත්මක විය යුතුය. ඉහළ නගිමින් පවත්නා සෞඛ්‍ය සේවා පිරිවැය සහ පෞද්ගලික අංශය ප්‍රමුඛ කොටගත් සෞඛ්‍ය සේවා ක්‍රමයක් කරා යොමු වීමේදී සෞඛ්‍ය සේවා මූල්‍යකරණය කිරීමේ මාර්ගයක් ලෙස සෞඛ්‍ය රක්ෂණ ක්‍රම ප්‍රවර්ධනය යෝග්‍ය වේ. වර්තමානයේදී පෞද්ගලික සෞඛ්‍ය රක්ෂණ සහතික මගින් ආවරණය වනුයේ ජනගහනයෙන් ඉතාමත් සුළු කොටසක් පමණි.

**සංඛ්‍යා සටහන 5.2**
**රජයේ සෞඛ්‍ය සේවය**

| | ශීර්ෂය | 1994 | 1995 | 1996 (අ) |
|---|---|---|---|---|
| 1. | ආරෝග්‍ය ශාලා (බටහිර වෛද්‍ය සේවය) | 510 | 535 | 540 |
| 2. | ඇඳන් ගණන | 50,091 | 52,528 | 52,613 |
| 3. | මධ්‍යම බෙහෙත් ශාලා | 370 | 386 | 377 |
| 4. | මුළු වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 3,496 | 3,986 | 4,391 |
| 5. | මුළු සහකාර වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 1,357 | 1,324 | 1,464 |
| 6. | මුළු ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 13,624 | 14,874 | 14,808 |
| 7. | මුළු හෙද සේවක සංඛ්‍යාව | 13,060 | 13,310 | 13,846 |
| 8. | මුළු උපස්ථායක සංඛ්‍යාව | 5,469 | 5,579 | 5,758 |
| 9. | ප්‍රතිකාර ලත් අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාව ('000) | 3,204 | 2,953(ආ) | ලබානො. |
| 10. | බාහිර රෝගීන්ගේ සංඛ්‍යාව ('000) | 35,276 | 32,084(ආ) | ලබානො. |
| 11. | මුළු සෞඛ්‍ය වියදම (රු.ද.ලක්ෂ) | 9,185 | 10,952 | 12,028 |
| | ජංගම වියදම (රු.ද.ලක්ෂ) | 7,666 | 8,818 | 9,260 |
| | ප්‍රාග්ධන වියදම (රු.ද.ලක්ෂ) | 1,519 | 2,134 | 2,768 |

(අ) තාවකාලික
(ආ) යාපනය, කිලිනොච්චි, මුලතිව් හා අම්පාර දිස්ත්‍රික්ක ඇතුලත් නැත

මූලය : සෞඛ්‍ය, මහාමාර්ග සහ සමාජසේවා අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂිකව, රජයේ රෝහල් 540 කදී නේවාසික රෝගීන් දශලක්ෂ 3 කටද, බාහිර රෝගීන් දශලක්ෂ 36 කටද, ප්‍රතිකාර කරනු ලැබේ. දැනට පවත්නා රෝහල් ඇඳන් සංඛ්‍යාව පුද්ගලයින් 1000 කට 3 ක් ලෙස 1996 දී නොවෙනස්ව පැවැතිණි. සෞඛ්‍ය, මිනිස්බල සම්පත් අංශය හා අදාළව 1996 සැප්තැම්බර් මස අවසාන වන විට සීමාවාසික හා පශ්චාත් සීමා වාසික වෛද්‍යවරුන් 1025 ක්ද, අනෙකුත් සේවක කාණ්ඩ යටතේ තවත් පුද්ගලයින් 2,781 ක් ද, බඳවාගන්නා ලද අතර, 1996 දී සෞඛ්‍ය සේවකයින් 3,460 කට සේවාස්ථ පුහුණුවීම් ලබා දෙන ලදී. රාජ්‍ය සේවයේ නිරත වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 1995 දී 3,986 සිට 1996 දී 4,391 දක්වා ඉහළ ගිය අතර, හෙදි සංඛ්‍යාව පුද්ගලයන් 1,00,000 කට 1995 73 සිට 1996 දී 76 දක්වා වැඩි විය. 1995 දී මෙන්ම 1996 දී ද වෛද්‍යවරුන් සහ වෛද්‍ය සහායක සේවා විසින් මෙහෙයවු වැඩ වර්ජන සහ අකුරට වැඩ ව්‍යාපාර, රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවාවට නිරන්තර බාධා පැමිණවූ අතර, එමගින් පොදු ජනතාව බෙහෙවින් අසීරු තත්ත්වයකට පත්විය. සෞඛ්‍ය සේවා කටයුතු මුළුමනින්ම අඩාලවීම දැඩි සාමාජීය බලපෑම් ඇතිකිරීමට හේතුවන බැවින් මෙම පරිපාලනමය ගැටළු සඳහා විධිමත් ප්‍රතිකර්ම යෙදීම අත්‍යවශ්‍යය. විශේෂඥ වෛද්‍ය හිගය තවදුරටත් ප්‍රධාන ගැටළුවක්ව පැවැති අතර, සේවයේ නිරත විශේෂඥ වෛද්‍ය සංඛ්‍යාව මුළු අවශ්‍යතාවයන්ගෙන් සියයට 62 ක් පමණක් විය. මෙයට ප්‍රතිවිරුද්ධව, සේවයේ යෙදවීමට අනුමත වෛද්‍ය සංඛ්‍යාව එහි උපරිමය කරා එළඹි හෙයින් විශේෂඥ නොවන වෛද්‍යවරුන්ට රාජ්‍ය අංශයේ රැකියා සැපැයීමේදී සීමාවන් පැවැති අතර, අනතුරුව, අනුමත වෛද්‍ය සංඛ්‍යාව වැඩි කරන ලදී. අනාගතයේදී, වෛද්‍යවරුන් පෞද්ගලික වෛද්‍ය සේවාවන්හි නිරත වීම දිරිමත් කිරීම හා ඒ සඳහා අවශ්‍ය දිරිගැන්වීම් ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවය මෙයින් අවධාරණය කෙරේ. සෞඛ්‍ය සේවා සැපයීම් ක්‍රමවත් කිරීම පිණිස (ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ සෞඛ්‍යය පහසුකම් ඌන උපයෝජනය සහ ද්විතීය හා තෘතීය මට්ටමේ පහසුකම් අධි උපයෝජනය) නියාමක ව්‍යාපෘතියක් යටතේ පසු යොමුකිරීමේ ක්‍රමයක් 1996 දී ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රමය යටතේ, දීර්ඝ කාලීන රෝගීන් පසු ප්‍රතිකාර සඳහා ආසන්නම ප්‍රාථමික මට්ටමේ වෛද්‍ය ආයතන කරා යොමු කරන අතර, ද්විතීය/ තෘතීය මට්ටමේ ආයතනයන්හි වෛද්‍ය උපදේශකයින් ප්‍රාථමික ආයතන වෙත නියමිත කාලසීමාවකට වරක් පැමිණෙයි.

සෞඛ්‍ය පොදු පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස, විදේශීය වශයෙන් මූල්‍යණය කළ ව්‍යාපෘති කිහිපයක්ම වසර තුළදී ක්‍රියාත්මක කරනු ලැබිණ. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සැපයු දෙවන සෞඛ්‍ය ජනගහන ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර, කුරුණෑගල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල රෝහල් 35 ක නව ඉදිකිරීම් සහ අළුත්වැඩියා කටයුතු කරනු ලැබිය. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජ්‍යායතනයේ (ජයිකා) ආධාර ඇතිව ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙහි හෙදියන් 300 ක් පුහුණු කළ හැකි හෙදි පුහුණු පාසැලක් ඉදිකිරීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මුළු වියදම රුපියල් දශලක්ෂ 500 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. චීන ආධාර ඇතිව රුපියල් දශලක්ෂ 320 ක වියදමකින් යුතුව, ඇඳන් 380 ක අතිරේක ධාරිතාවයකින් යුක්ත වන පරිදි, රිජ්වේ ආර්යා ළමා රෝහල පුළුල් කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. ගම්පහ හා මීගමුව දිස්ත්‍රික් රෝහල් සහ දකුණු කොළඹ ශික්ෂණ රෝහල සංවර්ධනය කිරීමට, කොරියන් රජය සමග ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් දශලක්ෂ 725 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. තවද, ප්‍රංශ රජයේ මූල්‍ය ආධාර ඇතිව මහනුවර ශික්ෂණ රෝහලේ හෘදරෝග ඒකකය වැඩිදියුණු කිරීම පිණිස ව්‍යාපෘතියක් අරඹන ලදී.

රෝග වැලැක්වීමේ සේවා ශක්තිමත් කිරීමේ දැඩි අවශ්‍යතාවය මධ්‍යයේ බෝවන රෝග මර්ධනය ළමා හා මාතෘ සෞඛ්‍ය සේවා හා පෝෂණ කටයුතු දියුණු කිරීම, සෞඛ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය වැනි කටයුතු කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කරන ලදී. පුළුල් ප්‍රතිශක්තිකරණ ආවරණය, උසස් තත්වයේ ප්‍රතිශක්තිකරණ එන්නත් සහ මනා දැනුවත් කිරීමේ ක්‍රම නිසා, ප්‍රතිශක්තිකරණ එන්නත් මගින් වැලැකිය හැකි රෝග හය හා ආශ්‍රිත රෝගීන් සංඛ්‍යාව 1996 දී තවදුරටත් පහත වැටුණි. පෝලියෝ සහ ගලපටල රෝගීන් පිළිබඳ වාර්තා නොවු අතර, ජන්ම ප්‍රසූති පිටගැස්ම හා අදාලව රෝගීන් කීපදෙනෙකු පිළිබඳ පමණක් වාර්තා විය. 1996 දී කක්කල් කැස්ස, සරම්ප සහ උග්‍රශීථිල පක්ෂගාත රෝග සැලකිය යුතු අන්දමින් පහත වැටුනේය. වසර 2000 වන විට බාලක පක්ෂගාත රෝගය මුලිනුපුටා දැමීමේ අරමුණින් යුතුව පිළිවලින් දෙවන වසරටත් ජාතික ප්‍රතිශක්තිකරණ දිනයක් පවත්වන ලදී. මෙම ප්‍රතිශක්තිකරණ දිනයේදී අදාල වයස් කාණ්ඩයෙහි සියයට 96 ප්‍රමාණයක් ආවරණය කිරීමට හැකි විය. ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට අනතුරු හගවමින් ඇතැම් බෝවන රෝග හා අදාළ රෝගී සංඛ්‍යාව උදා - ඩෙංගු රක්තපාත උණ, ජැපනීස් එන්සෙපලයිටිස් සහ මැලේරියා කැපී පෙනෙන ලෙසින් වර්ධනය විය. විමසුමකට ලක්වූ වසර තුලදී මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම, රෝග කාරක පරීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම, පොදු ජනතාව සහ වෛද්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ජාතික ඩෙංගු මර්ධන දිනයක් ප්‍රකාශ කිරීම වැනි කටයුතු මගින් පුළුල් ලෙස ව්‍යාප්ත වූ ඩෙංගු මර්ධන ව්‍යාපාරයක් දියත්කරන ලදී. අනුරාධපුරය, පුත්තලම, පොළොන්නරුව, මඩකලපුව වැනි රෝගය පැතිර ගිය දිස්ත්‍රික්කවල පුළුල් ප්‍රතිශක්තිකරණ වැඩ සටහනක් මගින් ජැපනීස් එන්සෙපලයිටිස් රෝගය මර්ධනය කිරීමට ප්‍රයත්න දරන ලදී. මැලේරියා රෝගය, තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන සෞඛ්‍ය ගැටළුවක්ව පැවැතිණි. නිවාස අභ්‍යන්තර මදුරු නාශක භාවිතය, රෝග කාරක මර්ධන කටයුතු, ලාවා මර්ධන ක්‍රම භාවිතය, විමධ්‍යගත මට්ටමින් වෛද්‍ය සායන පැවැත්වීම, සෞඛ්‍ය අධ්‍යාපන ප්‍රවර්ධනය සහ මිනිසුන් ගැවසෙන බාහිර ස්ථානවල මදුරු නාශක භාවිතය වසර තුලදී ක්‍රියාත්මක කළ ඇතැම් මැලේරියා මර්ධන ක්‍රියා මාර්ග වේ. මෙම ක්‍රියාමාර්ග අනුගමනය කළද, පසුගිය දෙවසර තුළදී දක්නට ලැබුණු රෝගය පහත වැටීමේ ප්‍රවනතාවයෙන් වෙනස්ව යමින් මැලේරියා රෝගයට ගොදුරු වූ රෝගී සංඛ්‍යාව සියයට 29 කින් වැඩිවී 1996 දී 184,261 ක් විය. මෙයට ප්‍රධාන හේතු වූයේ සිවිල් යුද්ධය සහ ආශ්‍රිත ප්‍රදේශවලද, සරණාගත කඳවුරු වලද, මැලේරියා මර්ධන කටයුතු වඩා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීමයි. එස්. ටී. ඩී. / එච්. අයි. වී. / ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම මර්ධනය කිරීම සඳහා දෙවන මධ්‍ය කාලීන සැලැස්මක් පිළියෙල කරන ලදී. 1995/96 දී සෞඛ්‍ය සේවාවෙහි නිරත පුද්ගලයින්, ආසන්න වශයෙන් 520 ක් පමණ පුහුණු කරන ලදී. උපදේශක සේවා සැපයීම්, තොරතුරු පතල කිරීම් හා රෝගය ආශ්‍රිත පරීක්‍ෂා කිරීම්, ඒඩ්ස් මර්ධන වැඩ සටහන යටතේ අනුගමනය කළ ඇතැම් ප්‍රධාන ක්‍රමෝපායන් වේ.

## පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා

පෞද්ගලික වෛද්‍ය සේවා ජාලයකින් සහ පෞද්ගලික රෝහල් හා සාත්තු සේවා නිවාස ආදියෙන් සමන්විත ආයතන පද්ධතියක් මගින් පෞද්ගලික අංශය සෞඛ්‍ය සේවා සපයනු ලබයි. මෙයට අමතරව, වෛද්‍ය රසායනාගාර සහ ඖෂධ සහ වෛද්‍ය සැපයුම් බෙදාහැරීම සඳහා වූ ඔසු සල් මගින්ද පෞද්ගලික අංශය විසින් ආධාරක සේවා සපයනු ලබයි.

නොමිළයේ සපයනු ලබන සෞඛ්‍ය සේවා පැවැතියද, අඩු ගුණාත්මක බව හා රජයේ වෛද්‍ය සේවාවන් ලබාගැනීමේදී පවත්නා දුෂ්කරතා නිසා මෑත වර්ෂවලදී පෞද්ගලික අංශයේ රෝග නිවාරණ සේවා සඳහා වූ ඉල්ලුම සැලකිය යුතු අන්දමින් පුළුල් විය. පෞද්ගලික අංශය, බාහිර රෝගීන්ගෙන් සියයට 50 කට පමණ සේවා සපයයි. කෙසේ වුවද, රාජ්‍ය අංශය සමග සැසැඳීමේදී පෞද්ගලික අංශය සැපයූ අභ්‍යන්තර රෝගී සේවාවන් තවදුරටත් නොවැදගත් මට්ටමක පැවැතිණි. සෞඛ්‍ය අමාත්‍යාංශ මූලාශ්‍රයන්ට අනුව, සාමාන්‍ය වැඩ කරන කාලසීමාවෙන් බාහිරව පෞද්ගලික අංශයේ සේවයේ නිරත රජයේ වෛද්‍යවරුන්ට අතිරේකව ආසන්න වශයෙන් 1000 ක් පමණ වෛද්‍යවරුන් පෞද්ගලික අංශයේ සාමාන්‍ය වෛද්‍ය සේවයේ යෙදී ඇත. නේවාසික ඇඳන් 2,467 කින් යුත් පෞද්ගලික රෝහල් 118 ක් දැනට ඇත. මෙම මුළු පෞද්ගලික රෝහල් සංඛ්‍යාවෙන් 52 ක් බස්නාහිර පළාතේ කොළඹ (26), ගම්පහ (18) සහ කළුතර (8) යන දිස්ත්‍රික්කවල පිහිටා තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෞද්ගලික රෝහල් 21 කින් එක්රැස් කළ තොරතුරු අනුව, (1993, 1994 සහ 1995 වසර සඳහා) කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රධාන රෝහල් වල රෝහල් ඇඳන් උපයෝජන අනුපාතිකය සියයට 70 ඉක්මවිය. මෙම රෝහල්වල ඇඳන් සංඛ්‍යාව 1219 ක් වූ අතර, ඔවුන් විසින් සැපයූ නේවාසික රෝගී සේවා රජය විසින් නේවාසික ප්‍රතිකාර සැලසූ රෝගී සංඛ්‍යාවෙන් සියයට 5 කටත් අඩු විය. මෙම රෝහල්වල ස්ථිර වෛද්‍යවරුන් 85 ක්ද, හෙදියන් 1,248 ක්ද, කාර්මික ශිල්පීන් 345 ක්ද, සේවයේ නිරතව සිටියහ. පෞද්ගලික රෝහල්වල සේවයේ නිරතව සිටි මුළු හෙදි කාර්ය මණ්ඩලයෙන් සියයට 63 පමණක් පුහුණු අය වූ අතර, මේ සඳහා අදාල ප්‍රමිතීන් ඇති කිරීමේ අවශ්‍යතාවයක් ඇත.

පවත්නා අයවැය සීමාවන් මධ්‍යයේ රජයේ සෞඛ්‍ය සේවා අත්‍යාවශ්‍ය ජන කොටස්වලට සීමා කිරීම හා පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. පෞද්ගලික සෞඛ්‍ය සේවාවේ, විශේෂයෙන්ම පෞද්ගලික වෛද්‍ය සේවා ජාලයෙහි සහ විශේෂඥ උපදේශක සේවාවෙහි වර්තමානයේදී දක්නට ලැබෙන තදබද කාරී තත්ත්වය තුළින් පෞද්ගලික සෞඛ්‍ය සේවා සඳහා තව දුරටත් වර්ධනය වීමට ඉඩකඩ ඇති විශාල ඉල්ලුමක් පවත්නා බව සනිටුහන් කරයි. වර්තමානයේදී රාජ්‍ය අංශයේ කුසලතා පූර්න පුද්ගලයින් පෞද්ගලික අංශයේ සෞඛ්‍ය ආයතන කරා යොමු වී ඇති අතර, මෙම තත්ත්වය රාජ්‍ය අංශ සේවාවේ ගුණාත්මක බවට බලපා ඇත. මේ අනුව, අවශ්‍ය මිනිස් බල සම්පත් පුහුණු කිරීම සහ අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය කරමින් පෞද්ගලික අංශය ස්වාධීනව වර්ධනය වීම ධෛර්යමත් කිරීම මෙන්ම ඒ සඳහා සුදුසු දිරිගැන්වීම් පිරිනැමීමද අවශ්‍ය වේ. මේ දක්වා පෞද්ගලික සෞඛ්‍ය සේවා කටයුතු පිළිබඳව සම්බන්ධීකරණය සහ අධීක්ෂණය ඉතා සුළු වශයෙන් පැවැති අතර, එම සේවාවෙහි පැවතිය යුතු ගුණාත්මක තත්ත්වය පැහැදිලි ලෙස දක්වා හෝ නියම කර නැත. මේ අනුව, පෞද්ගලික වෛද්‍ය සේවාවෙහි ගුණාත්මක බව සහතික කිරීම පිණිස එම සේවා විධිමත් කිරීමට හා අධීක්ෂණය කිරීමට නීතිමය රාමුවක් සහ සම්බන්ධීකරණ ආයතනයක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ.

## 5.3 අධ්‍යාපනය

වෙළඳපොළ අර්ථ ක්‍රමයක පුළුල් අවශ්‍යතාවයන්ට දැඩි ලෙස ප්‍රතිචාර දක්වන අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීම 1996 වසර තුල ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මූලික අවධානයට ලක්වූ කරුණකි. වත්මන් අධ්‍යාපන ක්‍රමය අවශ්‍ය කුසලතා පූර්ණ පුද්ගලයන් බිහි කිරීමට අපොහොසත්වී ඇතැයි සලකනු ලබන අතර, අධ්‍යාපන සුදුසුකම් සහ ශ්‍රම වෙළඳපල අවශ්‍යතා අතර නොගැලපීමක් පවතී. මෙය උගතුන් අතර ඉහළ සේවා වියුක්ති තත්ත්වයක් ඇති වීමට බලපාන ලද එක් කරුණක් විය. පෞද්ගලික අංශයේ පුළුල් වන අවශ්‍යතාවන්ට සරිලන පරිදි තාක්ෂණමය, භාෂාමය, කළමනාකරණ සහ ව්‍යවසායක කුසලතා යනාදිය වැඩි දියුණු කිරීම පදනම් කොට ගත් තිරසාර අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීම දැඩි ලෙස අවශ්‍ය විය. මෙම අංශයේ අඛණ්ඩව දක්නට ලැබුණු බාධාවන් වූයේ සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක බව පිරිහීම, ගුණාත්මක ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක් ලබාගැනීමේදී භූගෝලීය වශයෙන් හා සමාජ කාණ්ඩ අතර සමාන අවස්ථා නොපැවතීම, ලබාගත් අධ්‍යාපන සුදුසුකම් ශ්‍රම වෙළඳපල අවශ්‍යතාවයනට සුළු වශයෙන් පමණක් ගැලපීම සහ සීමිත අයවැය සම්පත් ප්‍රමාණයන්ය.

1996 වර්ෂයේදී ජාතික අධ්‍යාපන කොමිසම විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරන ලදී. මෙම වාර්තාවේ සඳහන් නිර්දේශ පරිදි සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳව විශේෂ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරනු ලැබින. පාසැල් යන වයස් සීමාවේ සිටින ළමුන්ට විධිමත් අධනපනය අනිවාර්ය කිරීමට දෙමව්පියන්ට බලකෙරෙන නව අධ්‍යාපන නීතියක් මෙම වාර්තාවෙන් යෝජනා කර තිබෙන අතර එමගින් පාසැල් යන වයස් ප්‍රමාණයේ ජනගහනයෙන් සියයට 10 ක් වන පාසල් වලට ඇතුලත් නොවන ප්‍රමාණය අවම කිරීමට බලාපොරොත්තු වේ. පාසැල් පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම, පාසැල්වල නව ඇතුලත් කර ගැනීම් විධිමත් ලෙස සිදු කිරීම, නව විෂයමාලා සංවර්ධනය, තාක්ෂණික අධ්‍යාපන සංවර්ධනය, සහ ගුරු පුහුණු කටයුතු ශක්තිමත් කිරීම ක්‍රියාත්මක සැලැස්මේ අඩංගු වන අනෙකුත් ප්‍රධාන ක්‍රමෝපායයන්ය. මේ අතර, අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහ ගත කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වසරේ අවසාන කාලයේදී ගරු ජනාධිපතිනිය විසින් කාර්ය සාධන බලකායක් පත් කරන ලදී.

1996 වර්ෂයේ දී අධ්‍යාපනය සඳහා දරණ ලද ආයෝජන ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1995 දී සියයට 2.8 සිට 1996 සියයට 2.6 දක්වා අඩු විය. කෙසේ වුවද අධ්‍යාපනය සඳහා දරණ ලද වියදම රජයේ මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 9.1 සිට සියයට 9.3 දක්වා කාල පරිච්ඡේද දෙක අතර දී ඉහළ ගියේය. සාපේක්ෂ වටිනාකම අනුව අධ්‍යාපනය සඳහා වූ වර්තන වියදම් සුළු වශයෙන් වැඩි වී ඇති අතර ප්‍රාග්ධන වියදම් සියයට 40 ක ඉහළ යාමක් වාර්තා කළේය. පාසැල් පොත් බෙදා දීමේ වැඩසටහන, නොමිලේ පාසැල් නිල ඇඳුම් ලබා දීම සහ පාසැල් ළමුන්ට සහනදායී මිළට ප්‍රවාහන පහසුකම් සැපයීමේ වැඩ සටහන් වර්ෂය තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 1,841 ක පිරිවැයක් ඒ සඳහා දරන ලදී.

1996 වසර තුලදී දිවයිනෙහි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව දශ ලක්ෂ 4.3 ක් වූ අතර, 195,203 ක ගුරු සංඛ්‍යාවකින් සමන්විත පාසැල් සංඛ්‍යාව 10,905 ක් විය. මුළු පාසැල් සංඛ්‍යාව 73 කින් වැඩි වූ අතර, යාපනය දිස්ත්‍රික්කය තුළ 1996 දී පාසැල් 457 ක් නැවත විවෘත කරන ලදී. සෑම වර්ග කිලෝ මීටර් 6 කටම පාසැලක් අයත්වීම සහ එක් පාසැලක් සඳහා සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 393 ක් පමණක් වීමෙන් පැහැදිලි වන්නේ සාමාන්‍ය අධ්‍යාපන ආවරණය බෙහෙවින් පුළුල් මට්ටමක පවත්නා බවයි. පුළුල් පාසැල් පද්ධතියක් පැවතුනද, මෙම පහසුකම් ලබා ගැනීමේදී රට තුල විවිධ විෂමතාවයන් දක්නට ලැබුණි. නිදසුනක් සේ 355,936 ක ශිෂ්‍ය සංඛ්‍යාවකින් යුතු කොළඹ දිස්ත්‍රික්කයේ උසස්

**සංඛ්‍යා සටහන 5.3**
**සාමාන්‍ය සහ විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය**

| ශීර්ෂය | 1994 | 1995 | 1996 (අ) |
|---|---|---|---|
| **සාමාන්‍ය අධ්‍යාපනය** | | | |
| 1. මුළු පාසල් සංඛ්‍යාව | 10,779 | 10,832 | 10,905 |
| 1.1 රජයේ මුළු පාසල් සංඛ්‍යාව | 10,191 | 10,239 | 10,280 |
| ජාතික පාසල් සංඛ්‍යාව | 164 | 198 | 238 |
| 1.2 වෙනත් පාසල් | 588 | 593 | 625 |
| පෞද්ගලික | 79 | 79 | 80 |
| පිරිවෙන් | 509 | 514 | 545 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 4,327,959 | 4,351,022 | 4,289,110 (ආ) |
| 2.1 රජයේ පාසල් | 4,193,971 | 4,216,571 | 4,155,184 |
| 2.2 වෙනත් පාසල් | 133,988 | 134,451 | 133,926 |
| පෞද්ගලික | 87,674 | 87,674 | 88,306 |
| පිරිවෙන් | 46,314 | 46,777 | 45,620 |
| 3. අළුතෙන් ඇතුළත් කර ගැනීම් | 339,006 | 342,386 | ලැ. නො. |
| 4. මුළු ගුරුවරු සංඛ්‍යාව | 195,182 | 195,210 | 195,203 (ඇ) |
| 4.1 රජයේ ගුරුවරු | 187,586 | 187,574 | 187,451 |
| 4.2 වෙනත් | 7,596 | 7,636 | 7,752 |
| 5. ශිෂ්‍ය ගුරු අනුපාතය | 22 | 22 | 22 |
| 6. අධ්‍යාපනය සඳහා වූ මුළු වියදම (රු. දශලක්ෂ) (ඈ) | 17,713 | 18,908 | 20,402 |
| 6.1 වර්තන | 14,836 | 15,784 | 16,018 |
| 6.2 ප්‍රාග්ධන | 2,877 | 3,124 | 4,384 |
| **විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය** | | | |
| 1. විශ්ව විද්‍යාල සංඛ්‍යාව | 9 | 10 | 12 |
| 2. ශිෂ්‍ය සංඛ්‍යාව | 30,764 | 32,004 | 33,948 |
| 3. කථිකාචාර්ය වරුන් සංඛ්‍යාව (ඉ) | 2,122 | 2,524 | 2,747 |
| 4. උපාධිලත් සංඛ්‍යාව | 5,493 | 5,342 | ලැ. නො. |
| 4.1 කලා සහ සෞන්දර්ය අධ්‍යයනය | 2,077 | 1,999 | ලැ. නො. |
| 4.2 වානිජ සහ කළමණාකරණ අධ්‍යයනය | 1,044 | 982 | ලැ. නො. |
| 4.3 නීතිය | 183 | 140 | ලැ. නො. |
| 4.4 විද්‍යාව | 829 | 958 | ලැ. නො. |
| 4.5 ඉංජිනේරු විද්‍යාව | 652 | 458 | ලැ. නො. |
| 4.6 වෛද්‍ය විද්‍යාව | 385 | 442 | ලැ. නො. |
| 4.7 දන්ත ශල්‍ය | 41 | 66 | ලැ. නො. |
| 4.8 කෘෂිකාර්මික | 183 | 210 | ලැ. නො. |
| 4.9 පශු වෛද්‍ය විද්‍යාව | 31 | 31 | ලැ. නො. |
| 4.10 ගෘහනිර්මාන ශිල්පය | 47 | 23 | ලැ. නො. |
| 5. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුල්වීම් | 7,849 | 8,015 | 9,284 |

(අ) තාවකාලික
(ආ) ප්‍රක්ෂේපිත
(ඇ) ඇස්තමේන්තු
(ඈ) සාමාන්‍ය සහ උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම
(ඉ) වසර ආරම්භයේදී

මූලය : අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම
ශ්‍රී ලංකා මහ බැංකුව

පෙළ විෂය ධාරාවන් සහිත පාසැල් සංඛ්‍යාව 59 ක් වන අතර 197,989 ක ශිෂ්‍ය සංඛ්‍යාවකින් යුක්ත අනුරාධපුර දිස්ත්‍රික්කයේ උසස් පෙළ විෂය ධාරාවන් සහිත පාසැල් ඇත්තේ 16 ක් පමණි.

මේ අතර අළුතින් බඳවාගත් ගුරුවරුන් 6,194 ක් ද ඇතුළුව රජයේ සේවයේ නිරත මුළු ගුරුවරු සංඛ්‍යාව 187,451 ක් විය. මේ අනුව ගුරු - ශිෂ්‍ය අනුපාතය 1996 දී 22 ක්ව පැවතුනි. දකුණු ආසියාතික රටවල් වල තත්වය හා සසඳන කළ මෙම අනුපාතය සතුටුදායක මට්ටමක පවතී. කෙසේ වුවද සේවයේ නිරත වන ගුරුවරුන් සංඛ්‍යාවෙහි ප්‍රාදේශීය විෂමතාවය මෙම අනුපාතයෙන් පිළිබිඹු නොකිරීම ප්‍රධානතම ගැටළුවකි. උදාහරණයක් වශයෙන් බස්නාහිර සහ දකුණු පළාත් වල විද්‍යා - ගණිත ගුරුවරුන් සංඛ්‍යාව අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩියෙන් සිටින වන අතර අනෙකුත් පළාත්වල මෙම විෂයයන් සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාවේ හිඟයක් පැවතුනි. මෙයට අමතරව 1996 වර්ෂය සඳහා අනුමත ගුරු සංඛ්‍යාව 4268 කින් වැඩි වුවද විවිධ විෂය ධාරාවන් හා සළකා බලන විට 13,161 ක ගුරු හිඟයක් පැවතුනි. ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ ඌනතාවයන් මෙම වර්ධනයන්ගෙන් පැහැදිළිව පෙන්නුම් කරයි. මේ අතර ගුරුවරුන්ගේ කුසලතාවයේ ගුණාත්මක භාවය ගැන සලකන කළ මුළු ගුරු මණ්ඩලයෙන් හතරෙන් එකක් පමණ උපාධි ගුරුවරුන් වූ අතර අ.පො.ස. (සා.පෙ) සහ අ.පො.ස (උ.පෙ) විභාග සමත් ගුරු සංඛ්‍යාව හතරෙන් එකකි.

මේ අනුව මුළු ගුරු සංඛ්‍යාවෙන් අඩක් පමණ උපාධි නොලබා පුහුණු සහ සහතික පත්‍ර ලත් ගුරුවරුන් විය. දැනට සේවයේ නිරත ගුරු සංඛ්‍යා සංයුතියෙන් සනිටුහන් කරණුයේ ගුරු කුසලතා වර්ධනය කිරීම සඳහා අදාල අංශවල පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයයි. නුපුහුණු සහ අඩු සුදුසුකම් ලැබූ පුද්ගලයින් අධ්‍යාපන ක්‍රමය තුලට ප්‍රවිශ්ඨ වීමෙන් අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මක භාවය පහත හෙළීමට සහ පුහුණු කිරීමේ වියදම් වැඩි කිරීමට හේතුවන නිසා නව ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය කෙරෙහි සුපරීක්ෂාකාරී අවධානය යොමු කළ යුතුය. පවත්නා ගුරු අසමතුලිතා තත්ත්වයන්ට පිළියම් යෙදීමේදී අනාගත බඳවා ගැනීම් ප්‍රතිපත්ති ගුරු අවශ්‍යතාවය සහ හිඟතාවය පවතින ක්‍ෂෙත්‍රයන් යන කරුණු කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුය. තවද ප්‍රමාණවත් දිරිගැන්වීම් සහිත රැකියාවේ ඉදිරි වර්ධන වැඩ පිළිවෙලක් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීමේලා අත්‍යවශ්‍ය වේ.

උසස් සාක්‍ෂරතා අනුපාතයක් පැවතුනද සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වසරක් පාසාම පිරිහී ඇති බව පවතින සාක්‍ෂි මගින් පැහැදිළිව පිළිබිඹු වේ. ජාතික අධ්‍යාපන ආයතනය, එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා සහ අධ්‍යාපන අරමුදල සහ එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය මගින් දියත් කරන ලද 5 වන වසර (1994), සිසුන්ගේ සාක්‍ෂරතාව, ගණනය කිරීමේ හැකියාව, සහ ජීවන කුසලතා පිළිබඳව අත්පත් කරගත් හැකියාවන් පිළිබඳ සමීක්‍ෂණයට අනුව සාක්‍ෂරතාව, ගණන් කිරීමේ හැකියාව සහ ජීවන කුසලතා අනුපාතයන්ගේ මධ්‍යයන අගය පිළිවෙලින් සියයට 61.8, 45.1 සහ 26.7 කි. ලිවීම සහ ගණිතය පිළිබඳ නිපුනතා මට්ටමට ලඟාවීමට හැකිවුයේ පිළිවෙලින් සියයට 21 කට සහ සියයට 13 කට පමණි. ප්‍රමාණවත් පාරිසරික කුසලතා මට්ටමක් කරා එළඹියේ සියයට 13 ක් පමණි. 1995 වර්ෂයේදී අ.පො.ස. (සා.පෙ) පරීක්‍ෂණය සඳහා පෙනී සිටි අයදුම් කරුවන්ගෙන් සියයට 10 ක් සියලු විෂයයන් ගෙන්ම අසමත් වු අතර සියයට 17 ක් අවම සුදුසුකම් සහිතව එම පරීක්‍ෂණය සම්පූර්ණ කර තිබේ. නොමිලයේ පාසැල් නිල ඇඳුම්, නොමිලයේ පාසැල් පොත් සහ පාසැල් ළමුන්ට සහනදායී මිළට ප්‍රවාහන පහසුකම් ආදිය ආවරණය කෙරෙමින් සැකසුන නිර්ලෝභී සහනාධාර වැඩ පිළිවෙල ඇතුලුව වසර 50ක කාලයක් මුළුල්ලේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් පැවතියද, උද්ගතවී ඇති මෙම තත්ත්වය බෙහෙවින් අසතුටුදායක වන අතර අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය පැහැදිළිව අවධාරනය කරයි.

පාසැල් පහසුකම් හා අදාලව පවත්නා පුළුල් ප්‍රාදේශීය විෂමතා සහ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමයේ අප්‍රමාණවත් බව සහ අඩු ගුණාත්මකභාවයට ප්‍රතිකර්ම යෙදීම උදෙසා විදේශ ආයෝජන ව්‍යාපෘති කිහිපයක් විමසුමට ලක්වූ වසර තුලදී ක්‍රියාත්මක කරනු ලැබින. ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් පාසල් 600 ක පහසුකම් වර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය කොට්ඨාශ පාසැල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ පාසැල් 548 ක් සංවර්ධනය සඳහා හඳුනාගත් අතර විමර්ශිත වර්ෂය තුලදී පැසැල් 48 ක් සංවර්ධනය කරනු ලැබිය. ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (ජා.ස.ආ) මුල්‍යනය කරනු ලබන ප්‍රාථමික අංශයේ සිසුන්ගේ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාථමික ඉංග්‍රීසි භාෂා ව්‍යාපෘති සහ ගණිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක විය. ලෝක බැංකුව/ ජාත්‍යන්තර සංවර්ධන සංගමය පාසැල් යටිතල පහසුකම් වැඩි කිරීමේ සහ ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම අරමුණු කොට ගෙන 1996 දී සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ ප්‍රාථමික ගණිත කට්ටල 3000 ක්, ප්‍රාථමික විද්‍යා උපකරණ 3000 ක් සහ ගුවන් විදුලි යන්ත්‍ර 2000 ක් ද සපයන ලදී. දුෂ්කර පලාත්වල පිහිටි තෝරාගත් කුඩා පරිමාණ පාසැල් සංවර්ධනය කිරීමේ අරමුණින් ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (සීඩා) මගින් මූල්‍යමය ආධාර සැපයූ ප්‍රාථමික පාසැල් සංවර්ධන ව්‍යාපෘතිය දියත් කරනු ලැබින. සීඩා මගින් අරමුදල් සපයන ලද වතු අංශයේ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය 1996 වර්ෂය තුළදී අඛණ්ඩවම ක්‍රියාත්මක විය. ගුරු අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යමය සහයෝගය ඇතිව නව ගුරු අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 4,332 කි. මෙම ව්‍යාපෘතිය මගින් නව ගුරු විද්‍යාපීඨ 5 ක් , ගුරු අධ්‍යාපන ආයතන 3 ක් සහ ගුරු මධ්‍යස්ථාන 80 ක් පළාත් මට්ටමින් ස්ථාපනය කිරීමට අපේක්‍ෂා කෙරේ. විවිධ ආයතන මගින් මෙහෙයවනු ලබන ගුරු අධ්‍යාපනික වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ජාතික ගුරු අධ්‍යාපන අධිකාරියක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

මෑත කාලයේදී පාසැල් සුපරීක්‍ෂන කටයුතු අතපසු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යාපන කටයුතු වල ගුණාත්මක භාවය පිරිහී ගොස් ඇති බව ප්‍රත්‍යක්‍ෂ වු හෙයින් ජාතික පාසැල් ගුරු විද්‍යාපීඨ, ගුරු පුහුනු විද්‍යාල සහ පිරිවෙන් සුපරීක්‍ෂණය කිරීම සඳහා වෙනම ශාඛාවක් අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබේ. කුසලතා සංවර්ධනය දියුණු කරලීමේ අටියෙන්, කෘෂිකාර්මික සත්ව පාලනය, ඉදිකිරීම් තාක්‍ෂණය, විදුලිය සහ ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණ, යාන්ත්‍රික තාක්‍ෂණය, ආහාර විද්‍යාව සහ තාක්‍ෂණය යනාදී වඩා ප්‍රායෝගික නැඹුරුවක් ඇති විෂයයන් ඇතුලත් කර තාක්‍ෂනික අධ්‍යාපන විෂය මාලාව 1995 /96 දී ප්‍රතිශෝධනය කරන ලදී. හඳුන්වා දෙන ලද නව විෂය ක්‍ෂෙත්‍රයන් හා අදාලව නව ගුරුවරුන් බඳවා ගැනීමට පියවර ගෙන ඇති අතර ප්‍රාදේශීය මට්ටමින් ගුරුවරුන් 1800 ක් සඳහාද ජාතික මට්ටමින් ගුරුවරු 225 ක් සඳහාද සේවාස්ථ සැසි පවත්වනු ලැබිණ. 7 සහ 8 වසර වල විෂය ධාරාවල ඇතුලත් වන ජීවන කුසලතා විෂය ඉගැන්වීම තවත් පාසැල් 1200 සඳහා හඳුන්වා දුන් අතර ඒ සඳහා ගුරුවරන් 2,036 සඳහා සේවාස්ථ පුහුණු සැසි පවත්වන ලදී. අ.පො.ස. (උසස් පෙළ) සහ සා.පෙළ සිසුන්ගේ පරිගණක කුසලතා වර්ධනය කිරීම උදෙසා පරිගණක මධයස්ථාන 300 ක් පිහිටුවීමට අපේක්ෂා කරන අතර 1996 වර්ෂය අවසානයේ දී මධ්‍යස්ථාන 15ක් පිහිටුවා තිබේ.

ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කටයුතු වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ අරමුණින් 1996 දී ගුරු විද්‍යාල සඳහා ගුරුවරුන් 1,893 ක් ඇතුලත් කර ගන්නා ලද අතර පුද්ගලයින් 1,858 දෙනෙකු සඳහා අධ්‍යාපන පීඨවල සේවයට පෙර පුහුණු කිරීම් ලබා දෙන ලදී. මේ අතර, ජාතික අධ්‍යාපන ආයතනය මගින් වර්ෂය තුලදී කෙටිකාලීන පාඨමාලා සහ උපාධි පාඨමාලා ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා මෙහෙයවනු ලැබූ අතර පාසැල් විෂයමාලා පදනම්ව ගුවන්විදුලිය සහ රූපවාහිනී වැඩ සටහන් නිෂ්පාදනය කරනු ලැබිණ. මෙයට අමතරව අ.පො.ස. (සා.පෙ) අ.පො.ස (උ.පෙ) සහ ප්‍රාථමික මට්ටමේ විෂයධාරා ප්‍රතිශෝධනය හා යාවත්කාලීන කිරීමේ කටයුතුද ගුරු අත්පොත් සකස් කිරීම ආදී කටයුතු ද වසර තුලදී තවදුරටත් කරගෙන යනු ලැබින.

රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන, අනුමත පෞද්ගලික සහ අනුමාන/සහතික කල පාසල්, ජාත්‍යන්තර පාසල්, පෞද්ගලික පංති ක්‍රමය සහ පෞද්ගලික පෙර පාසල් වශයෙන් ප්‍රධාන කොටස් 4 ට බෙදා වෙන්කළ හැකිය. 1996 දී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 88,306 කින් යුක්ත පෞද්ගලික අනුමත සහතික කළ පාසල් සංඛ්‍යාව 80 කි. මෑත වර්ෂවල සමාගම් ලියාපදිංචි


කිරීමේ නීතිය යටතේ ක්‍රියාත්මක වන සවයං ආධාර මත බිහිවූ ජාත්‍යන්තර පාසැල් වල වර්ධනයක් දක්නට ලැබෙන අතර විවිධ මට්ටමේ ගුණාත්මක භාවයෙන් යුක්ත අධ්‍යාපනයක් මෙම පාසල් මගින් සැපයේ. 1996 අවසාන වනවිට මෙබඳු ජාත්‍යන්තර පාසල් 42 ක් සමාගම් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි කර ඇත. ලියාපදිංචි පෞද්ගලික පාසල් පාලනය වන නීතිමය ව්‍යවස්ථාව ජාත්‍යන්තර පාසැල්ද ආවරණය වන පරිදි පුළුල් කළයුතු අතර එමගින් එම පාසැල් වල පවත්වා ගත යුතු අවම ගුණාත්මක මට්ටම නියම කළ යුතුය. මෙම පාසැල් වල කටයුතු රජය මගින් සුපරීක්ෂාවට ලක් කිරීම අත්‍යවශ්‍යව පවතී. රජයේ අධ්‍යාපන කටයුතු සඳහා යොදාගත හැකිව තිබූ සැලැකිය යුතු සම්පත් ප්‍රමාණය විශාල පරිමාණයේ පෞද්ගලික පංති කර්මාන්තය දෙසට යොමු විය. රාජ්‍ය අංශයේ අධ්‍යාපනය අවතක්සේරුවකට ලක් කරමින් පුළුල් වන පෞද්ගලික පන්ති කර්මාන්තය රාජ්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ මූලික ගැටළුවට විසඳුම් ලබා දෙන ප්‍රබල අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාවය ඉස්මතු කෙරේ.

සබරගමුව විශ්ව විද්‍යාලය (1996) රජරට විශ්ව විද්‍යාලය (1996) සහ ගිණිකොණ දිග විශ්ව විද්‍යාලය (1995) යනුවෙන් නව විශ්ව විද්‍යාල 3ක් ආරම්භ කිරීමත් සමගම 1996 වර්ෂයේදී ජාතික විශ්ව විද්‍යාල ගණන 12 දක්වා වැඩි විය. මෙමගින් උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගනු ලබන සිසුන්ගේ සංඛ්‍යාව වාර්ෂිකව 1250 කින් වැඩි වූ අතර උසස් අධ්‍යාපන පහසුකම් සම්බන්ධව ප්‍රාදේශීය ව්‍යාප්තිය වැඩිදියුණු කරන ලදී. මේ අතර 1996 වර්ෂයේ දී විද්‍යාවේදී පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් රටතුල ඇති පශ්චාත් උපාධි ආයතන සංඛ්‍යාව 6 දක්වා වැඩි විය. විමර්ශිත වර්ෂය තුලදී කොළඹ විශ්ව විද්‍යාලය හා අනුබද්ධිත නව අංශයක් හොරණ පිහිටුවන ලද්දේ ජන සංනිවේදන සහ සෞන්දර්ය පිළිබඳ අධ්‍යයන කටයුතු තව දුරටත් කරගෙන යාම සඳහාය. නව දෙපාර්තමේන්තු සහ පීඨයන් එක් කරමින් කැළණිය, පේරාදෙනිය සහ ශ්‍රී ජයවර්ධනපුර යන විශ්ව විද්‍යාල තව දුරටත් පුළුල් කෙරිනි. රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයක්ද, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ දන්ත විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක්ද ඉදි කිරීම පිණිස අවශ්‍ය මූලික කටයුතු කරන ලදී. විශ්ව විද්‍යාල සඳහා නව ඇතුලත් කර ගැනීම් 1,269 කින් 9,284 දක්වා වැඩිවීමෙන් මුළු විශ්ව විද්‍යාල සිසුන්ගේ සංඛ්‍යාව 1996 වර්ෂය අවසානයේදී 33,948 දක්වා වැඩිවිය. විශ්ව විද්‍යාල අධ්‍යාපන කාර්ය මණ්ඩලය 1995 දී වූ 2,248 සහ 1996 දී 2,435 දක්වා ඉහල ගියේය. අලුතින් ඇතුලත් කර ගත් සිසුන් 6,976 ත් සමග 1996 වර්ෂය අවසාන වන විට විවෘත විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 16,948 දක්වා ඉහළ ගිය අතර ඔවුහු විවිධ අංශවල විෂය මාලා 27 ක් හැදෑරූහ.

විශ්ව විද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් වල හිගය ප්‍රධාන ගැටළුවක් පැවතින. 1994 දී මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 37 කට සීමා වී තිබූ නේවාසිකාගාර පහසුකම් 1996 වර්ෂය අවසානයේදී සියයට 57 දක්වා වැඩි විය. මේ අතර ශිෂ්‍යාධාර සහ මහපොල ශිෂ්‍යත්ව ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 1500 කින් වැඩි වී 1996 වර්ෂය අවසාන වන විට 33,948 දක්වා ඉහළ ගියේය.

1988 සහ 1989 අධ්‍යයන වර්ෂ වලදී බාධා පැමිණීම සහ ඉන් පසු වර්ෂවලදී වරින්වර විශ්ව විද්‍යාල වසා දැමීම නිසා විශ්ව විද්‍යාල වලට ඇතුලත් විමට අපේක්ෂාවෙන් එක් රොක්වී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව මුදා හැරීමට අවශ්‍ය පියවර ගනු ලැබින. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව එක් වර්ෂයක් තුලදී ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් ඇතුලත් කර ගැනීමට හැකිවන පරිදි තාවකාලික පදනමක් මත අධ්‍යයන කාර්යය මංඩලය බඳවාගැනීම සහ අතිරේක පන්ති කාමර ඉදිකිරීම ආදිය සඳහා අතිරේක සම්පත් සපයන ලදී. 1996 සැප්තැම්බර් අවසානය වන විට මොරටුව, ශ්‍රී ජයවර්ධනපුර සහ කැලණිය (වෛද්‍ය පීඨය හැර) යන විශ්ව විද්‍යාල වල සිසුන් ඉවත් කර ගැනිමට පැවැති තදබදය ඉවත් කරන ලදී. 1997 අවසානය වන වට විශ්ව විද්‍යාලවලට සිසුන් ඇතුලත් කිරීම යථා තත්වයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

විශ්ව විද්‍යාල අධ්‍යාපනයට පිවිසීමට ඇති ඉඩකඩ, කාර්යක්ෂමතාවය, ගුණාත්මකභාවය සහ ආර්ථිකයේ අවශ්‍යතාවයන්ට එහි යෝග්‍ය බව යන කරුණු හා අදාල තීරණාත්මක ගැටළු කිහිපයකට උසස් අධ්‍යාපන අංශයට මුහුණ පෑමට සිදුවිය. 1995 වර්ෂයේදී විශ්ව විද්‍යාල සඳහා ඇතුලත් කර ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව අදාල වයස් කණ්ඩායම් අනුව සියයට 2 ක් වන අතර සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 17ක් සහ අ.පො.ස. (උ.පෙ) පරීක්ෂණය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 7 ක් වේ. අනෙකුත් දකුණු ආසියාතික රටවල් වන සිංගප්පූරුව (සියයට 8) සහ මැලේසියාව (සියයට 7) හා සසඳන කළ මෙම තත්වයෙන් පිළිබිඹු වන්නේ අදාල වයස් කාණ්ඩයන්හි විශ්ව විද්‍යාල අධ්‍යාපනයට පිවිසීමට ඇති ඉඩ කඩ ශ්‍රී ලංකාව තුල බොහෝ දුරට සීමිත බවය. කෙසේ වුවද විධිමත් අධ්‍යාපනය වර්ධනය වන ආර්ථික අවශ්‍යතාවයන්ට සර්ලන අයුරින් ගැලපීම පිළිබඳ දැඩි අවධානයක් යොමු කරමින් උසස් අධ්‍යාපන ආවරණය තව දුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය සැලකිලිමත්මව විග්‍රහ කළ යුතුයි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය හැර අනෙකුත් උසස් තාක්ෂණික හා වෘත්තීයමය කුසලතා වැඩි දියුනු කරන වෙනත් උසස් අධ්‍යාපන අවස්ථාවන් පුළුල් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත්තේ විශේෂයෙන්ම අ.පො.ස(සා.පෙ) සහ අ.පො.ස. (උ.පෙ) සහතික නොලබා පාසැල් වලින් පිට වන සංඛ්‍යාව (1995 දී 457,000) සහ අ.පො.ස. (උ.පෙ) සමත් නමුත් විශ්ව විද්‍යාල ප්‍රවේශය නොලැබුනු ශිෂ්‍ය සංඛ්‍යාව (47,129) ඉතා ඉහළ මට්ටමක පවතින හෙයිනි. රජයේ සම්පත් සීමාවන් සලකා බලන කල මේ සඳහා විකල්ප වශයෙන් යෝග්‍ය නීතිමය රාමුවක් තුල පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන ස්ථාපිත කිරීම පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු කළ යුතුව ඇත. මෙයට තවත් විකල්පයක් වන්නේ දැනට පවත්නා තාක්ෂණික අධ්‍යාපන පද්ධතිය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීමයි. 1996 අවසාන වන විට සිසුන් 18,135 කින් සමන්විත කාර්මික අධ්‍යාපන ආයතන 34 ක් රටතුල පැවතිනි. 1996 වර්ෂය තුල මෙම ආයතන වල නව ඇතුලත් කර ගැනීම් සංඛ්‍යාව 10,217 ක් විය.



රූප සටහන 5.1
සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම
(ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස)

## 5.4 පණිවුඩ හුවමාරු සේවාවන්

### තැපැල් සේවය

1996 වර්ෂයේ දී තැපැල් අංශය ගතානුගතික ක්‍රියා පිළිවෙත් වලින් මිදුනු ගතික ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. තැපැල් සේවය සම්බන්ධ ප්‍රතිපත්තිය, තැපැල් කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම සහ නවීකරණය කිරීමත්, තරගකාරී පරිසරයකට සුදුසු පරිදි කාර්යක්ෂමතාවය සහ වාණිජමය ශක්‍යතාවය වැඩිදියුණු කිරීමත් අරමුණු කොට ගනී. මේ අනුව, තැපැල් සේවයේ කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීම, ඉහළ ආදායම් මට්ටමක් උත්පාදනය කිරීම සහ තෝරාගත් සමහර අංශවල තරගකාරිත්වයක් ඇති කිරීම යන අරමුණු පාදක කොටගෙන තැපැල් දෙපාර්තමේන්තුව සංස්ථාවක් බවට පත්කිරීම සලකා බැලීම සඳහා කමිටුවක් පත්කරන ලදී.

1996 වර්ෂය අවසන් වන විට තැපැල් කාර්යාල පද්ධතිය, ප්‍රධාන තැපැල් කාර්යාල 573 කින්ද, උප තැපැල් කාර්යාල 3,452 කින්ද, නියෝජිත තැපැල් කාර්යාල 196 කින්ද සමන්විත විය. වර්ෂය තුළදී ප්‍රධාන තැපැල් කාර්යාල 11 ක්ද, උප තැපැල් කාර්යාල 48 ක්ද, නියෝජිත තැපැල් කාර්යාල 14 ක්ද, තැපැල් කාර්යාල පද්ධතියට අළුතින් එකතු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එක් තැපැල් කාර්යාලයක් මගින් සේවය සපයන ප්‍රදේශයේ විශාලත්වය සාමාන්‍යයෙන් වර්ග කිලෝමීටර් 15.5 දක්වා සුළු වශයෙන් පහත වැටුනි. මේ අතර, උප කාර්යාල පිහිටුවීමේදී දැරීමට සිදුවන විශාල පිරිවැය වළක්වා ගැනීමට සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව ග්‍රාමීය නියෝජිත තැපැල් කාර්යාල නමින් නව නියෝජිත තැපැල් කාර්යාල ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ, නියමු ව්‍යාපෘතියක් ලෙස සමූපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිවල (සණස) සහයෝගයෙන් මෙවැනි උප තැපැල් කාර්යාල 62 ක් වර්ෂය තුළදී විවෘත කරන ලදී. මීට අමතරව, උතුරු පළාතේ පිහිටි ප්‍රධාන තැපැල් කාර්යාල 26 ක්ද, උප තැපැල් කාර්යාල 85 ක්ද, 1996 වර්ෂය තුළදී නැවත විවෘත කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් සපයන සීඝ්‍රගාමී තැපැල් සේවය, තැපැල් ෆැක්ස් සේවය, ජාත්‍යන්තර ඍජු දුරකථන සේවය වැනි අතිරේක සේවාවන් වර්ෂය තුළදී තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. සීඝ්‍රගාමී තැපැල් සේවා සපයන රටවල් සංඛ්‍යාව 1995 දී 42 සිට 1996 දී 52 දක්වා වැඩි කරන ලදී. ජාත්‍යන්තර ඍජු දුරකථන පහසුකම් සපයන තැපැල් කාර්යාල සංඛ්‍යාව 1996 දී 36 දක්වා වැඩි කරන ලදී. තැපැල් භාණ්ඩ හැසිරවීමේ නවීන උපකරණ වලින් සමන්විත රුපියල් දශලක්ෂ 510 ක වියදමින් ඉදිකරන ලද නව මධ්‍යම තැපැල් හුවමාරු මධ්‍යස්ථානය 1996 අගෝස්තු මාසයේදී විවෘත කරන ලදී. එමෙන්ම තැපැල් සංකේත අංක ක්‍රමය භාවිතයෙන්, තැපැල් භාණ්ඩ භාවිතයෙන්, තැපැල් භාණ්ඩ තේරීම සහ බෙදාහැරීම කාර්යක්ෂමව සිදු කිරීම සඳහා සෑම ප්‍රධාන සහ උප තැපැල් කාර්යාලයකටම තැපැල් සංකේත අංක හඳුන්වා දෙනු ලැබිය.

පසුගිය වර්ෂවලදී මෙන්ම තැපැල් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය කටයුතුවල සුළු වර්ධනයක් පිළිබිඹු කලේය. තැපැල් දෙපාර්තමේන්තුව විසින් හසුරවන ලද දේශීය සහ විදේශීය මුළු තැපැල් භාණ්ඩ සංඛ්‍යාව පසුගිය වර්ෂයට වඩා සියයට 3 ක වැඩිවීමක් සනිටුහන් කරමින් දශලක්ෂ 539 ක් බවට පත්විය. මෙම ආන්තික වර්ධනය දේශීය තැපැල් භාණ්ඩවල සියයට 4 ක වර්ධනයේත්, විදේශීය තැපැල් භාණ්ඩවල සියයට 3 ක අඩුවීමේත් ශුද්ධ ප්‍රතිඵලයකි. හසුරුවන ලද තැපැල් භාණ්ඩ ප්‍රමාණයේ සුළු වර්ධනය, දුරකථන සේවා, ජාත්‍යන්තර ඍජු දුරකථන සේවා, ෆැක්ස් සේවා විද්‍යුත් තැපැල, පෞද්ගලික තැපැල් භාණ්ඩ ප්‍රවාහන සේවා වැනි සීඝ්‍රගාමී විකල්ප පණිවුඩ හුවමාරු සේවාවල ප්‍රසාරණය මගින් පැහැදිලි කෙරේ. එමෙන්ම, එක් පුද්ගලයෙකු සඳහා ලැබෙන සාමාන්‍ය ලිපි සංඛ්‍යාව 27 ක් ලෙස වර්ෂය තුළදී නොවෙනස්ව පැවැතීම මගින්ද, සම්ප්‍රදායික තැපැල් සේවයේ මන්දගාමී වර්ධනය අනාවරණය කරයි. ප්‍රධාන වශයෙන් 1996 දී රජයේ තැපැල් සේවයෙන් ලද මුළු ආදායම රුපියල් දශලක්ෂ 1326 ක්ව නොවෙනස්ව පැවති අතර මෙහෙයුම් පිරිවැය සියයට 7 කින් ඉහළ ගියේය. මේ අනුව, තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය 1995 දී රුපියල් දශලක්ෂ 233 සිට 1996 දී රුපියල් දශලක්ෂ 344 දක්වා ඉහළ ගියේය.

### විදුලි සංදේශ සේවා

ආර්ථික පොදු කාර්ය සේවා අතර, විදුලි සංදේශ සේවා අංශය ඉතාමත් ගතික වූත්, සීඝ්‍ර වර්ධනයකින් යුක්ත වූත් අංශය විය. සේවා ආවරණය සපයනු ලැබූ සේවාවන්, නව ආයෝජන සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය යන අංශ සලකා බලන කල මෙම ක්ෂේත්‍රයෙහිසැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි. විදුලි සංදේශ සේවාවන් සඳහා නොකඩවා ඉහළ යමින් පවත්නා ඉල්ලුම් කාර්යක්ෂමවත්, තරගකාරී ලෙසත්, සපුරාලනු පිණිස 1996 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීමේ ප්‍රමුඛ ආයතනය වන ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සීමාසහිත වගකීම් සමාගමක් ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. පෞද්ගලික අංශයේ විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් 1996 වර්ෂයේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලද අතර, රට දුරකථන පද්ධතිය ප්‍රසාරණය කිරීම සහ තරගකාරී මිළ ගණන් යටතේ නවීන සේවාවන් සැපයීම තුළින් ගුණාත්මක වශයෙන් ඉහළ මට්ටමක සේවා සැපයීමද ඇතුළත්ය. විදුලි සංදේශ සේවා සැපයීමෙහි ලා පෞද්ගලික අංශයේ කාර්යභාරය ප්‍රසාරණය වීමත් සමග ඵලදායී ලෙස බලපත්‍ර ලබාදීමේ, පසු විපරම් කිරීමේ සහ ක්‍රමවත් ලෙස හැසිරවීමේ නියාමක ක්‍රමයක අවශ්‍යතාවය තදබල ලෙස දැනුණි. මේ අනුව, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යාලය, ස්වාධීන විදුලි සංදේශ නියාමක කොමිසමක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන සහ විදේශීය ආයතන (ආසියානු සංවර්ධන බැංකුව ලෝක බැංකුව, ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල සහ සීමාසහිත පින්ලන්ත අපණායන ණය සමාගම) විසින් අරමුදල් සපයන ලද දෙවණ විදුලි සංදේශ සංවර්ධන යෝජන ක්‍රමය 1990 - 1997 යටතේ ආරම්භ කරන ලද යෝජනාක්‍රම වල වැඩකටයුතු 1996 වර්ෂය අවසන් වන විට නිමකර තිබුණි. ඉහත වැඩ සටහන යටතේ විදුලි සංදේශ හුවමාරු මධ්‍යස්ථානය, දේශීය දුරකථන පද්ධතිය, ප්‍රධාන හුවමාරු පද්ධතිය සහ ජාත්‍යන්තර හුවමාරු පද්ධතිය වැඩිදියුණු කිරීමට සහ පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. 1996 වර්ෂය තුළදී ගම්පහ සහ මාතර දිස්ත්‍රික්කවල විදුලි සංදේශ පද්ධති වැඩිදියුණු කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ විදුලි සංදේශ පද්ධතිය වැඩිදියුණු කිරීමේ දෙවන අදියර යන ව්‍යාපෘතීන් නිම කරන ලදී. මීට අමතරව, රුපියල් දශලක්ෂ 3,741 ක පිරිවැයක් සහිත නව ප්‍රාදේශීය විදුලි සංදේශ ව්‍යාපෘතියක් ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර යටතේ 1996 දී ආරම්භ කරන ලදී. කොළඹ නගරයේ සහ ප්‍රාදේශීය ප්‍රදේශවල හුවමාරු මධ්‍යස්ථාන පුළුල් කිරීමේ දෙවන විදුලි සංදේශ ව්‍යාපෘතිය වර්ෂය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලැබූ ප්‍රධාන සම්ප්‍රේෂණ ජාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය මුළුමනින්ම මෙන් නිමකර තිබූ අතර, එය ක්‍රියාත්මක

**සංඛ්‍යා සටහන 5.4**
**තැපැල් හා විදුලි සංදේශ සේවාවේ වර්ධනය**

| ශීර්ෂය | 1994 | 1995 | 1996 (ඇ) |
|---|---|---|---|
| **1. තැපැල් සේවය** | | | |
| තැපැල් බෙදීම් කොට්ඨාශ ගණන | 6,729 | 6,729 | 6,729 |
| තැපැල් කාර්යාල සංඛ්‍යාව | 4,105 | 4,148 | 4,221 |
| රාජ්‍ය අංශය | 3,932 | 3,966 | 4,025 |
| පෞද්ගලික අංශය | 173 | 182 | 196 |
| තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ප්‍රදේශය (ව.කි.මී.) | 16.0 | 15.8 | 15.5 |
| තැපැල් කාර්යාලයකින් සේවාව ලබන සංඛ්‍යාව | 4,365 | 4,393 | 4,339 |
| එක් පදිංචිකරුවකුට ලැබුණු ලිපි ගණන | 29 | 29 | 27 |
| **2. විදුලි සංදේශ සේවය** | | | |
| 2.1 සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | | | |
| දුරකථන මාර්ග සංඛ්‍යාව | 180,724 | 204,350 | 254,500 |
| අළුතින් දෙනු ලැබූ දුරකථන සංඛ්‍යාව | 25,322 | 24,556 | 50,150 |
| පොරොත්තු ලේඛණයේ සිටින ගණන | 186,245 | 237,800 | 256,000 |
| දුරකථන සඳහා ඉල්ලුම (සංඛ්‍යාව) | 366,969 | 442,150 | 510,500 |
| දුරකථන ඝණත්වය (පුද්ගලයින් 100 කට දුරකථන සංඛ්‍යාව) | 1.01 | 1.12 | 1.39 |
| 2.2 අනෙකුත් පෞද්ගලික අංශය | | | |
| සෙලියුලර් දුරකථන | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 3 | 4 | 4 |
| ග්‍රාහක සංඛ්‍යාව | 29,182 | 51,316 | 71,228 |
| මුළු සම්මුච්චිත ආයෝජනය (රු. දශලක්ෂ) | 3,095 | 4,139 | 5,307 |
| පොදු පේ ෆෝන් | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 3 | 4 | 4 |
| දුරකථන කුටි සංඛ්‍යාව | 905 | 1,597 | 2,152 |
| මුළු සම්මුච්චිත ආයෝජනය (රු. දශලක්ෂ) | 258 | 424 | 610 |
| රේඩියෝ පේජින් සේවා | | | |
| සැපයුම් කරුවන්ගේ සංඛ්‍යාව | 5 | 5 | 5 |
| ග්‍රාහක සංඛ්‍යාව | 6,302 | 9,565 | 10,721 |
| මුළු සම්මුචිත ආයෝජනය (රු. දශලක්ෂ) | 169 | 210 | 221 |
| දත්ත සංනිවේදන සේවා | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 6 | 6 | 7 |
| ග්‍රාහක සංඛ්‍යාව | 175 | 273 | 355 |
| මුළු සම්මුචිත ආයෝජනය (රු. දශලක්ෂ) | 401 | 434 | 574 |
| රැහැන් රහිත දුරකථන | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | - | - | 2 |
| ග්‍රාහක සංඛ්‍යාව | - | - | 527 |
| මුළු සම්මුච්චිත ආයෝජනය (රු. දශලක්ෂ) | - | - | 1743 |

(ඇ) තාවකාලික

මූලය : තැපැල් දෙපාර්තමේන්තුව
සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
විදුලි සංදේශ අධ්‍යක්ෂ ජෙනරාල්


වනවිට දුරකථන පද්ධතියේ ඇති අවහිරතා මුළුමනින්ම මගහැරෙන අතර, දුරකථන සේවයේ ගුණාත්මක බව හා විශ්වාසනීයත්වය ඉහළ යනු ඇත. තවද, වර්ෂ 2015 දක්වා විදුලි සංදේශ පද්ධතිය සංවර්ධනය කිරීමේ ප්‍රධාන සැලැස්ම අනුව යමින් තෙවන විදුලි සංදේශ සංවර්ධන වැඩ සටහන 1996 - 2000 නමින් සැලසුමක් සම්පාදනය කෙට ඇත. මෙම වැඩසටහන යටතේ හඳුනාගෙන ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් දශලක්ෂ 8000 ක් පමණ වැය වෙතැයි ඇස්තමේන්තු කර ඇත.

විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යපෘති නිමවීමත් සමග, දුරකතන යතුරු 57,852 ක ධාරිතාවයකින් යුත් දුරකථන හුවමාරු මධ්‍යස්ථාන 22 ක් විමර්ෂණය කරනු ලබන වර්ෂය තුළදී ආරම්භ කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1996 දී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ විදුලි සංදේශ පද්ධතියේ යතුරු ධාරිතාවය 310,300 දක්වා සියයට 14 කින් වැඩිවිය.

මේ අතර ටෙලිකොම් අයතනය විසින් සපයනු ලබන දුරකථන සේවා සඳාහා ප්‍රකාශිත ඉල්ලුම 1995 වර්ෂයේ වාර්තාවූ සියයට 20 ක වැඩිවීමට සාපේක්ෂව 1996 දී වැඩිවූයේ සියයට 15 ක මදක් අඩු වේගයකිනි. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් සපයන ලද නව දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව 1995 දී සම්බන්ධතා 24,556 සිට 1996 දී 50150 දක්වා දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩිවිය. මෙය තනි වර්ෂයක් තුළදී දුරකථන පද්ධතියේ මෙතක් වාර්තාවූ විශාලතම පුළුල් වීම ලෙස සටහන් වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1996 වර්ෂය අවසන් වන විට සේවා සැපයෙන

දුරකථන මාර්ග සංඛ්‍යාව 254,500 දක්වා වැඩි විය. මෙම වර්ධනය දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100 කට ඇති දුරකථන සංඛ්‍යාව) 1995 දී 1.12 සිට 1996 දී 1.39 දක්වා වැඩිවීමට හේතු විය. කෙසේ වෙතත්, මෙවැනි ප්‍රගතියක් පවතිද්දීද, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට සැපයීමට හැකිවී ඇත්තේ සමස්ත ප්‍රකාශිත ඉල්ලුමෙන් සියයට 50 ක් පමණි. විදුලි සංදේශ පහසුකම් සැපයුම, එක් දුරකථනයකට සිටින පුද්ගලයන් සංඛ්‍යාව අනුව සලකා බලන විට ශ්‍රී ලංකාවේ තත්ත්වය (88), කලාපයේ සීඝ්‍රයෙන් වර්ධනය වන මැලේසියාව (6), තායිලන්තය (18), දකුණු කොරියාව (2), සහ සිංගප්පූරුව (2) වැනි රටවල් සමග සැසඳීමේදී ඉතා පහත් මට්ටමක පවතී. සේවයේ පවතින සෙලියුලර් ජංගම දුරකථන සහ පොදු දුරකථන ස්ථානවල පිහිටි දුරකථන සැලකිල්ලට ගත් විටද ශ්‍රී ලංකාවේ දුරකථන ඝනත්වය එනම් එක් දුරකථනයකට සිටින පුද්ගලයින් සංඛ්‍යාව 56 කට වඩා අඩු නොවේ.

රූප සටහන 5.2
දුරකථන ඝනත්වය-තෝරාගත් රටවල්




1996 වර්ෂය තුලදී විදුලි සංදේශ පහසුකම් ව්‍යාප්තියේ විෂමතාවයෙහි අඩුවීමක් දක්නට ලැබේ. කොළඹ නාගරික ප්‍රදේශයෙන් බැහැරව ප්‍රාදේශීය වශයෙන් ස්ථාපිත දුරකථන යතුරු ධාරිතාවය, ජාතික දුරකථන යතුරු ධාරිතාවයේ ප්‍රතිශතයක් වශයෙන් සලකා බලන විට, පසුගිය වර්ෂයේදී සියයට 45 සිට 1996 වර්ෂයේදී සියයට 47 දක්වා සුළු වශයෙන් වැඩිවී ඇත. එමෙන්ම ප්‍රාදේශීය වශයෙන් සේවා සැපයෙන මුළු දුරකථන මාර්ග සංඛ්‍යාව, සේවා සැපයෙන සමස්ත දුරකථන මාර්ග සංඛ්‍යාවේ සමානුපාතයක් ලෙස, 1995 දී 34 සිට 1996 දී 35 දක්වා වැඩි විය. කෙසේ වෙතත් ප්‍රාදේශීය විදුලි සංදේශ සේවා පහසුකම් ද බොහෝදුරට සංකේන්ද්‍රණය වී ඇත්තේ ප්‍රාදේශීය නාගරික මධ්‍යස්ථාන වලය. එහෙයින්, නවීන විදුලි සංදේශ පහසුකම්වල ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාවට ලැබෙන පරිදි එම පහසුකම් දුෂ්කර ප්‍රදේශවලට ද ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය පවතී.

1996 වර්ෂයේදී පෞද්ගලික අංශයේ විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරීත්වයෙහි සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා විය. 1996 වර්ෂය අවසන් වන විට, බලපත්‍රලාභී පෞද්ගලික විදුලි සංදේශ පද්ධති ක්‍රියාත්මක කරනු ලබන ආයතන 21 ක් තිබූ අතර, එම ආයතන ජංගම සෙලියුලර් දුරකථන සේවා, සහ රැහැන් රහිත දුරකථන සේවා, ගුවන්දුලි පේජින් සේවා, දත්ත සන්නිවේදන සේවා, සහ පොදු ගෙවීම් දුරකථන සේවා වැනි විවිධ ප්‍රාථමික සහ අතිරේක දුරකථන පහසුකම් සපයනු ලැබීය. මෙම සේවාවන්හි යොදවන ලද සමුච්චිත ආයෝජනය 1996 වර්ෂයේදී සියයට 62 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 8,455 ක් බවට පත්විය. සෙලියුලර් දුරකථන සමාගම් 4 ක් විසින් සපයන ලද සෙලියුලර් ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 71,228 දක්වා පසුගිය වර්ෂයට වඩා සියයට 39 කින් වැඩිවිය. ගුවන්විදුලි පේජින් සේවාවන්, සමාගම් 5 විසින් සපයනු ලැබූ අතර, ග්‍රාහක සංඛ්‍යාව 1995 දී 9,565 සිට 1996 දී 10,721 දක්වා ඉහළ ගියේය. 1995 වර්ෂය අවසානයට ස්ථාපනය කරන ලද පොදු ගෙවීම් දුරකථන මධ්‍යස්ථාන සංඛ්‍යාව වූ 1,597 සමග සසඳන විට 1996 වර්ෂය අවසාන වන විට එවැනි දුරකථන මධ්‍යස්ථාන 2,152 ක් විය. 1996 වර්ෂය රැහැන් රහිත දුරකථන සේවා සැපයීම සඳහා නව සමාගම් දෙකකට බලය පවරන ලදී. වර්ෂය අවසාන වීන විට මෙම සේවාවන් සඳහා දායක වූ ග්‍රාහකයන් සංඛ්‍යාව 527 කි. මේ අතර, සමාගම් 6 ක් ග්‍රහකයන් 637 ක් සඳහා අන්තර්ජාල (Internet) සේවාවන් සැපයීමෙහි නිරත විය.

ශ්‍රී ලංකා ටෙලිකොම් සේවා සමාගම විසින් මාස 18 ක් වැනි කෙටි කාලයක් ඇතුළතදී අඩුතරමින් දුරකථන 150,000 ක් සැපයීමේ අරමුණින් යුතුව සැලසුම් කරන ලද 150 කේ විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහි නියැලෙන ලදී. කොළඹ සහ වව්නියාව දිස්ත්‍රික්ක හැර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අනෙකුත් සෑම දිස්ත්‍රික්කයක්ම පාහේ ආවරණය වන පරිදි සැපයුම්කරු ණය අරමුදල් සපයනු ලබන ක්‍රමයක් යටතේ ගිවිසුම් කරුවන් සය දෙනෙකුට අදාල කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලදී. මෙම කොන්ත්‍රාත් කරුවන් විසින් රුපියල් දශ ලක්ෂ 13,000 ක ඇස්තමේන්තුගත වියදමකින් දුරකථන මාර්ග 158,000 ක් සැපයීමට අපේක්ෂිතය.

මෑත භාගයේදී ජාත්‍යන්තර සන්නිවේදන මාර්ගවල සිදුවූ සීඝ්‍ර වර්ධනයක් සමග සම්ප්‍රදායික ජාත්‍යන්තර සන්නිවේදන මාධ්‍යවල භාවිතය පසුගිය වර්ෂ කීපය තුළදී දැඩි පරිහානියකට ලක්විය. එහෙයින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ජාත්‍යන්තර විදුලි සංදේශ සේවය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක කරන ලදී. 1994 වර්ෂයේද සී.ම්.ම්. - 11 ව්‍යාපෘතියද, 1995 වර්ෂයේදී පාදුක්ක පෘථිවිගත සංඛ්‍යාත මධ්‍යස්ථානයද ආරම්භ කළ අතර, 1996 වර්ෂයේ ජනවාරි මාසයේදී පොදු ස්විච්ගත පැකට් දත්ත ජාලය හා විද්‍යුත් තැපැල් සේවාව ආරම්භ කරන ලදී.

## 5.5 බලශක්තිය

බලශක්ති අංශය 1996 දී දැඩි අර්බුදයකට මුහුණ පෑවේය. රසාන දිග මෝසම් වැසි නිසි ලෙස නොලැබීම, නිරිත දිග මෝසම් වැසි ප්‍රමාද වීම, සහ වසරේ ප්‍රථම කාර්තුව තුළ පැවැති වියළි කාලගුණය හේතු කොට ගෙන, වසරේ ප්‍රථම කාර්තු තුන තුළදී ජල විදුලි බලය උත්පාදනයට දැඩි ලෙස බාධා පැමිණුනි. පවත්නා තාපබලය ජල විදුලි බල උත්පාදනයේ ඇතිවූ හිඟය සපුරාලීමට ප්‍රමාණවත් නොවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා විදුලිබල මණ්ඩලය (ලං. වි. ම) 1996 මාර්තු 22 දා සිට විදුලිය කපාහැරීම් සිදුකළ අතර, එය වසරේ තෙවන කාර්තුව දක්වා ක්‍රියාත්මක විය. දිගු කාලසීමාවකින් යුතු විදුලිය කපාහැරීම් වලට අමතරව, ලං. වි. ම. සේවකයින්ගේ වැඩ වර්ජන හේතුවෙන් තෙදිනක කාලයක් සම්පූර්ණයෙන්ම විදුලිබල සැපයුම අක්‍රිය වීම නිසා ආර්ථික කටයුතු බොහෝ දුරට ඇණ හිටියේය. වසරේ මුල් කාර්තු තුන තුල මුහුණ පෑ දැඩි බලශක්ති හිඟයන් සමස්ත ආර්ථික ක්‍රියාකාරීත්වයට විශේෂයෙන් පෞද්ගලික ආයෝජනය,


කාර්මික නිෂ්පාදනය සේවා නියුක්තිය, සාමාන්‍ය මිළ මට්ටම සහ ගෙවුම් තුලනයට දැඩි අහිතකර බලපෑම් ඇති කලේය. විදුලිබල හිඟයෙහිඋග්‍ර බව සමනය කිරීමට පෞද්ගලික අංශයේ ස්වයං විදුලි බල උත්පාදනය දිරි ගැන්වීම සඳහා ආකර්ෂණීය දිරිගැන්වීම් පිරිනමනු ලැබූ අතර, පවත්නා උත්පාදන ධාරිතාව පුද්ගලික අංශයෙන් උත්පාදක යන්ත්‍ර කුලියට ගැනීම මගින් පුළුල් කිරීමට ප්‍රයත්න දරන ලදී. මෙම ක්‍රියාමාර්ග සහ යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් වසරේ සිව්වන කාර්තුව තුළදී බලශක්ති සැපයුම් තත්ත්වය යහපත් අතට හැරුණි. මේ අතර, ඛණිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ මුළු ඉල්ලුම, තාප බල උත්පාදය වැඩිවීම හේතුවෙන් තියුණු ලෙසින් වර්ධනය විය. ආනයනික බලශක්ති ප්‍රභවයන් මත වූ දැඩි රැඳියාව හා එක්වුණු ඉහළ ජාත්‍යන්තර මිළ ගණන් 1996 දී තෙල් ආනයන බිල මත දැඩි බරක් පටවනු ලැබිණ.

පාරිභෝගික උපයෝගිතාවය හා ආයෝජක විශ්වාසනීයත්වය

අඩපන නොවන සේ, බාධා රහිතව, ප්‍රමාණවත් ලෙස විදුලිබලය සැපයීමට තීරණාත්මක පියවර ගැනීමේ කඩිනම් මෙන්ම වැදගත් අවශ්‍යතාවය, 1996 බලශක්ති අංශයේ ප්‍රවනතාවයන්ගෙන් පැහැදිලි වේ. බලශක්ති අර්බුදයේ ආසන්නතම හේතුව කාලගුණ විචලනයන් වුවද, බලශක්ති අර්බුදයට මුල් වූ තීරණාත්මක සාධක වූයේ පසුගිය හත් වසර තුලදී විදුලිබල ධාරිතාව පුළුල් කිරීම පිණිස ප්‍රමාණවත් ආයෝජන නොකිරීම, ජල විදුලි බලය මත දැඩි ලෙස රැඳියාව සහ දිගුකාලීන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අඩුලුහුඩුකම්ය. මේ නිසා විදුලිබල උත්පාදනය මත වූ ආයෝජන වල දැඩි හිඟතාවය යන මූලික ගැටළුව, යෝග්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ගයන් මගින් යුහුසුළුව විසඳිය යුතුවේ. කෙටි කාලීනව, මෙතෙක් භාවිතයට නොගත් පෞද්ගලික අංශයේ උත්පාදන ධාරිතාව දැඩි ලෙස උපයෝජනය සහ විකල්ප බලශක්ති ප්‍රභවයන් වැඩිදියුණු කිරීමද අවධාරණය කළේය. ක්‍රමවත් පිළිවෙතකින් තොරව කලින් කලට ක්‍රියාත්මක කරන අධික වියදම් සහිත බලශක්ති

රූප සටහන 5.3

**ප්‍රධාන බලශක්ති ප්‍රභවයන්**



## සංඛ්‍යා සටහන 5.5
## බලශක්ති අංශයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | ඒකක | 1994 | 1995 | 1996 (අ) | ප්‍රතිශත වෙනස 1995 | ප්‍රතිශත වෙනස 1996 (අ) |
|---|---|---|---|---|---|---|
| **1. ඛණිජතෙල් නිෂ්පාදන** | | | | | | |
| අපනයන කල ප්‍රමාණය | මෙ.ටො.'000 | 612 | 616 | 661 | 1 | 7 |
| අපනයන වටිනාකම | රු.දශලක්ෂ | 3,959 | 4,349 | 5,740 | 10 | 31 |
| | ඇ. ඩො. මි. දශලක්ෂ | 56.0 | 56.3 | 71.5 | 1 | 27 |
| ආනයන කළ ප්‍රමාණය | මෙ.ටො.'000 | | | | | |
| බොරතෙල් | ,, | 1,898 | 1,860 | 2,033 | -2 | 9 |
| පිරිපහදු නිෂ්පාදන | ,, | 288 | 562 | 729 | 95 | 30 |
| එල්. පී. ගෑස් | ,, | 50 | 66 | 71 | 32 | 8 |
| ආනයන වටිනාකම (මි. ගැ.) | | | | | | |
| බොරතෙල් | රු. දශලක්ෂ | 11,407 | 12,360 | 16,808 | 8 | 36 |
| | ඇ. ඩො. මි. දශලක්ෂ | 161.2 | 158.0 | 209.4 | -01 | 32 |
| පිරිපහදු නිෂ්පාදන | රු. දශලක්ෂ | 2,442 | 4,812 | 8,465 | 97 | 76 |
| | ඇ. ඩො. මි. දශලක්ෂ | 34.5 | 61.9 | 105.7 | 79 | 71 |
| එල්. පී. ගෑස් | රු. දශලක්ෂ | 704 | 1,121 | 1,447 | 59 | 29 |
| | ඇ. ඩො. මි. දශලක්ෂ | 9.9 | 14.4 | 18.0 | 46 | 25 |
| බොරතෙල් බැරලයක | රු./බැරල් | 805 | 903 | 1,116 | 12 | 24 |
| සාමාන්‍ය මිළ (මි. ගැ) | ඇ. ඩ. ඩො. | 16.22 | 17.59 | 20.19 | 8 | 15 |
| දේශීය අලෙවිය | මෙ.ටො.'000 | 1,568 | 1,721 | 2,120 | 10 | 23 |
| පෙට්‍රල් | ,, | 184 | 190 | 197 | 3 | 4 |
| සුදු ඩීසල් | ,, | 728 | 796 | 1,048 | 9 | 32 |
| බැර ඩීසල් (ආ) | ,, | 54 | 80 | 87 | 48 | 9 |
| සුපිරි ඩීසල් | ,, | 24 | 27 | 26 | 13 | -4 |
| භූමි තෙල් | ,, | 207 | 222 | 228 | 7 | 3 |
| දැවි තෙල් | ,, | 228 | 238 | 336 | 4 | 41 |
| ගුවන් යානා ඉන්ධන | ,, | 79 | 91 | 110 | 15 | 21 |
| එල්. පී. ගෑස් | ,, | 64 | 77 | 88 | 20 | 14 |
| දේශීය මිළ | | | | | | |
| පෙට්‍රල් | රු./ ලීටර | 35.00 | 40.00 | 50.00 | 14 | 25 |
| සුදු ඩීසල් | ,, | 11.40 | 12.40 | 13.20 | 9 | 6 |
| බැර ඩීසල් (ආ) | ,, | 10.70 | 11.70 | - | 9 | - |
| සුපිරි ඩීසල් | ,, | 14.20 | 15.20 | 18.50 | 7 | 22 |
| භූමි තෙල් | ,, | 9.50 | 9.50 | 10.40 | 0 | 9 |
| දැවි තෙල් | | | | | | |
| 500 | ,, | 7.10 | 7.10 | 7.80 | 0 | 10 |
| 800 | ,, | 6.80 | 6.80 | 7.50 | 0 | 10 |
| 1,000 | ,, | 6.50 | 6.50 | 7.20 | 0 | 11 |
| එල්. පී. ගෑස් | රු./ කි.ග්‍රෑ. | 19.23 | 19.23 | 23.07 | 0 | 20 |
| **2 විදුලිය** | | | | | | |
| පවත්නා ධාරිතාව | මෙගවොට් | 1,409 | 1,409 | 1,453 | 0 | 3 |
| ස්ථාපිත ධාරිතාව | ,, | 1,409 | 1,409 | 1,409 | 0 | 0 |
| ජල බලය | ,, | 1,137 | 1,137 | 1,137 | 0 | 0 |
| තාප බලය | ,, | 272 | 272 | 272 | 0 | 0 |
| පෞද්ගලික අංශයේ බලශක්තිය | ,, | - | - | 44 | - | - |
| ජනනය කළ ඒකක | ගිගවොට් පැය | 4,364 | 4,783 | 4,375 | 10 | -9 |
| ජල බලය | ,, | 4,089 | 4,514 | 3,249 | 10 | -28 |
| තාප බලය | ,, | 275 | 269 | 972 | -2 | 261 |
| පෞද්ගලික අංශයේ බලශක්තිය | ,, | - | - | 154 | - | - |
| මුළු අලෙවිය | ,, | 3,565 | 3,915 | 3,573 | 10 | -9 |
| ගෘහස්ත | ,, | 928 | 1,034 | 1,047 | 11 | 1 |
| කාර්මික (ඇ) | ,, | 1,413 | 1,527 | 1,361 | 8 | -11 |
| වාණිජ | ,, | 575 | 631 | 590 | 10 | -6 |
| පළාත් පාලන ආයතන | ,, | 609 | 683 | 535 | 12 | -22 |
| වීදි ආලෝක කිරීම | ,, | 40 | 40 | 40 | 0 | 0 |

(අ) තාවකාලික
(ආ) 1996 ජුනි මාසයේ සිට බැර ඩීසල් අලෙවිය සුදු ඩීසල් යටතේ වර්ග කර ඇත
(ඇ) 1994 පෙබරවාරි මස සිට හෝටල් සඳහා වන විදුලිය විකුණුම්ද ඇතුලත් වේ.

මූලයන්: ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා විදුලිබල මණ්ඩලය
ෂෙල් ගෑස් ලංකා ලිමිටඩ්
ලංකා මෙරයින් සර්විසස් (පෞද්ගලික) සමාගම

ප්‍රභවයන් අවසානයේදී විදුලි බල ගාස්තු ඉහළ නැංවීමට හේතුවන අතර ඒ වෙනුවට, ආර්ථිකයේ මධ්‍ය හා දිගු කාලීන අවශ්‍යතා මත නිසි ලෙස සකස් වූ දිගු කාලීන සැලැස්මකට අනුකූලව, දිගුකාලීන විදුලිබල ව්‍යාපෘති ජාතික විදුලිබල පද්ධතියට අළුතින් එක් කළ යුතුව ඇත. මතු ඇතිවිය හැකි විදුලිබල හිඟ සපුරාලීමේ අරමුනින් යුතුව, විදුලිබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, ක්‍රමවේදයේ ප්‍රමාදතා අවම කරලිය යුතු අතර, ව්‍යාපෘති නිශ්චිත කාලසටහනකට අනුව ක්‍රියාත්මක කළ යුතුයි. සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පාඩු අවම කිරීමටද අවධානය යොමු කළ යුතුවේ. ප්‍රබල බලශක්ති සංරක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීමද මෙහිදී වැදගත් වේ.

## විදුලිය බලය

මෙගවොට් 1,137 ක ජල විදුලිය සහ මෙගවොට් 272 ක තාප බලයෙන් සමන්විත ජාතික විදුලිබල පද්ධතියේ මුළු ස්ථාපිත ධාරිතාවය මෙගවොට් 1,409 ක් ලෙස පිළිවෙලින් පස්වන වසරටත් නොවෙනස්ව පැවතිනි. මෙගවොට් 44ක ඩීසල් උත්පාදක යන්ත්‍ර, ඇග්‍රිකෝ සහ කුල්එයාර් සමාගම් වෙතින් කුලියට ගැනීමෙන් උත්පාදන ධාරිතාවය පුළුල් කළේය. මෙම ක්‍රියාමාර්ග පැවැතියදීත්, ලං. වි. ම. යේ මුළු විදුලිබල උත්පාදනය වසර තුළදී ගිගවොට් පැය 4,375 දක්වා සියයට 9 කින් තියුණු ලෙස පහත වැටුනි. පෞද්ගලික අංශය විසින් උත්පාදනය කළ ගිගවොට් පැය 152 ක විදුලිය බල සඳහා ගැලපුම් කල පසු විදුලි බල උත්පාදනයේ පහත වැටීම සියයට 5 ක් පමණක් විය. ඉකුත් වසරේ පැවැති සියයට 10 ක වැඩිවීම හා සසඳන කළ අදාල වසරේ විදුලි බල උත්පාදනය තියුණු ලෙස සියයට 28 කින් පහත වැටුණි.

විදුලි බල සැපයුම් හිඟ සපුරාලීම පිණිස, පවත්නා ධාරිතාවය උපරිම ලෙස උපයෝගී කරගත් අතර තාප ජනක යන්ත්‍රද කුලියට ගනුලැබින. මෙමගින් තාප බල උත්පාදනය ඉකුත් වසර හා සසඳන කළ සිව් ගුණයකටත් වඩා වැඩි වෙමින් ගිගවොට් පැය 1,126 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස විදුලි බල උත්පාදයේ ඉන්ධන සඳහා දැරූ වියදම, 1995 පැවැති රුපියල් දශලක්ෂ 987 හා සසඳන කළ 1996 දී රුපියල් දශලක්ෂ 3,800 දක්වා ඉහළ නැගුණි. සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් පද්ධතිය වැඩිදියුණු කිරීම පිණිස ක්‍රියාත්මක කළ ව්‍යාපෘති කිපයක් තිබියදී වුවද, ලං. වි. ම. යේ උත්පාදන බෙදාහැරීම් සහ සම්ප්‍රේෂණ කටයුතු වෙතින් වූ මුළු පද්ධති පාඩුව මුළු විදුලිබල උත්පාදනයෙන් සියයට 18 ක් (ගිගවොට් පැය 802) විය. මෙම පාඩුව මාස දෙකකටත් වැඩි කාලයක දේශීය විදුලිබල පාරිභෝජනයට සමාන වේ.

දැඩි විදුලිබල හිඟයන්ට මුහුණ දෙනු පිණිස, හදිසි ක්‍රියාමාර්ගයක් ලෙස 1996 මාර්තු 22 සිට විදුලිය කපාහැරීම් ක්‍රියාත්මක කලේය. ප්‍රථමයෙන් විදුලිය කපාහැරීම අඩි ඉල්ලුමක් නොපවතින පැය 4 ක කාලයකට සීමා කරන ලදී. අනතුරුව, ජලාශයන්හි ජල මට්ටම් වෙනස්කම් සලකා බලමින් විදුලිය කපාහරින කාලසීමාව (දිනකට පැය 1 සිට පැය 8 දක්වා) කලින් කලට ප්‍රතිශෝධනය කරනු ලැබිණි. විදුලිය කපාහැරීම් සම්පූර්ණයෙන්ම නතර කරනු ලැබුයේ 1996 සැප්තැම්බර් 19 දා සිටය. වසර තුලදී ඇස්තමේන්තුගත විදුලිබල හිඟය ගිගවොට් පැය 300 ක් වූ අතර, මෙම හේතුවෙන් ලං. වි. ම. යට රුපියල් දශලක්ෂ 1,235 ක ආදායමක් අහිමි විය. බලශක්ති අර්බුදයේ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා වෙනත් බලශක්ති අර්බුද කළමණාකරණ ක්‍රියාමාර්ග කිපයක්ද හඳුන්වා දෙනු ලැබිණ. පෞද්ගලික අංශයේ ස්වයං තාපබල උත්පාදන කිහිප අයුරකින්ම දිරි ගන්වනු ලැබිණ. පෞද්ගලික අංශය විසින් උත්පාදනය කල තාප විදුලිබල ඒකකයකට රු. 2.15 සිට රු. 2.30 දක්වා වූ මුදල් ප්‍රතිදාන පිරිනැමීම, ඩීසල් විදුලි බල උත්පාදක යන්ත්‍ර ආනයන කිරීම සඳහා සහනදායි පොලී අනුපාතික යටතේ ණය පහසුකම් සැපයීම, කර්මාන්ත ව්‍යවසායකයන්හට තීරු ගාස්තු රහිත ඩීසල් විදුලිබල උත්පාදක යන්ත්‍ර ආනයනය කිරීමට අවස්ථාව ලබා දීම සහ ස්වයං උත්පාදන අමතර ධාරිතා ස්ථාපනය සඳහා මූල්‍යමය දිරිගැන්වීම් ලබාදීම්, මේ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග විය. වසර තුලදී කේ. වී. ඒ. 103,942 ක, උත්පාදන ධාරිතාවයක් ස්ථාපනය කිරීමට ව්‍යවසායකයන් 275 කට රුපියල් දශලක්ෂ 369 ක මුදලක් සපයන ලදී. ගෘහස්ත අංශයේ විදුලිබල ඉතුරුම් සඳහා ලං. වි.ම. විසින් ප්‍රසාද දීමනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි. මෙයට අමතරව, දිවා කාලය වැඩිකිරීම සඳහා වේලාව වෙනස් කිරීම, රූපවාහිනී විකාශන වේලාවන් කෙටි කිරීම, වායු සමීකරණ යන්ත්‍ර සඳහා ප්‍රධාන විදුලිබල පද්ධතියෙන් විදුලිබල භාවිතා කිරීම් තහනම් කිරීම, ආදී ක්‍රියාමාර්ගද විදුලිබල පරිභෝජනය සීමා කිරීම සඳහා හඳුන්වා දෙන ලදී.

පෞද්ගලික අංශයෙන් තාප ජනක යන්ත්‍ර කුලියට ලබාගැනීමට අමතරව, නුදුරු වර්ෂවලදී ඇතිවිය හැකි විදුලිබල හිඟයන්ගෙන් වැලැකීමට ජාතික විදුලිබල පද්ධතිය පුළුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග කිපයක්ම ගනු ලැබුවේය. අධික වියදමක් දැරීමට සිදුවුවද, 1997 දී මෙගවොට් 115 කින් ජාතික විදුලිබල පද්ධතිය පුළුල්වන සේ ගෑස්ටර්බයින් යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කරනු ලැබූ සපුගස්කන්ද ඩීසල් විදුලිබල ව්‍යාපෘතියෙහි (මෙගවොට් 40) තැනීම් කටයුතු කරගෙන යනු ලැබූ අතර, 1997 දී එය ආරම්භ වීමට නියමිතය. වසර තුලදී විදුලිබලය උත්පාදනයේ පෞද්ගලික අංශයේ සහභාගීත්වය යම් ප්‍රමාණයක දියුණුවක් පෙන්නුම් කළේය. 'ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සහ අත්පත් කරගැනීම' 'ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම' (BOO/BOT) යන පදනම යටතේ වන ප්‍රථම ව්‍යාපෘතිය වූ මෙගවොට් 51 ක තාපබලාගාරයක් (කේ. එච්. ඩී.) ස්ථාපනය කිරීම සඳහා වූ බලශක්ති මිළදී ගැනීමේ ගිවිසුම 1996 දී අත්සන් කළේය. මෙගවොට් 16.8 ක ධාරිතාවයකින් යුත් පෞද්ගලික අංශයේ නව තාප බලාගාරයක් (ලක්දනාව් සමාගම) ඉදිකිරීම සඳහාද ගිවිසුම් අත්සන් කරනු ලැබූ අතර, මෙහි වැඩකටයුතු 1997 දී ආරම්භ කිරීමට නියමිතය.

ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සහ අත්පත් කර ගැනීම (BOO) පදනම යටතේ, කොටුගොඩ ඉදිකිරීමට නියමිත මෙගවොට් 60 ක තාප විදුලිබලාගාරය සඳහා අභිප්‍රාය පළකිරීමේ ලිපිය 1996 දී කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. 1997 දී තවත් මෙගවොට් 20 ක ඩීසල් යන්ත්‍ර කුල් එයාර් සමාගමෙන් කුලියට ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කළේය. විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර ඇතිව ක්‍රියාත්මක වීමට නියමිත සංයෝග චක්‍රීය විදුලිබල ව්‍යාපෘතිය (මෙගවොට් 150) සහ කුකුලේ ජලවිදුලි බල ව්‍යාපෘතිය (මෙගවොට් 70) ජාතික විදුලි බල පද්ධතියට මධ්‍ය කාලීනව එක්වීමට නියමිත ප්‍රධාන විදුලිබල ව්‍යාපෘතීන් වේ.

ආදායම් අහිමිවීම, සහ විසඳුම් ක්‍රියාමාර්ග සඳහා දැරීමට සිදුවූ අතිරේක වියදම් මගින් විදුලි බල අර්බුදය, ලං. වි. ම. යේ මූල්‍ය කටයුතු කෙරෙහි සෘජු ලෙස බලපෑවේය. ලං. වි. ම. ට අනුව, බලශක්ති අර්බුදය නිසා, 1996 දී එම ආයතනයට දැරීමට සිදුවූ මූල්‍යමය පිරිවැය, ආදායම් අහිමිවීම් (රුපියල් දශලක්ෂ 1,200) ස්වයං උත්පාදනය ඇතුළුව අමතර ඉන්ධන පිරිවැය (රුපියල් දශලක්ෂ 3,897) සහ අනෙකුත් විසඳුම් ක්‍රියාමාර්ග සඳහා පිරිවැය (රුපියල් දශලක්ෂ 550) යනාදියෙන් සමන්විතව රුපියල් දශ ලක්ෂ 5,647 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

විශේෂ සටහන 4

# ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභවයන්

ආර්ථික වර්ධනය ඉහළ නැංවීමේ ලා බලශක්තිය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. පරිසරයට අවම බලපෑම් ඇති කෙරෙමින්, සාධාරණ මිලක් යටතේ, නිසි කලට වේලාවට බාධා විරහිතව බලශක්තිය සැපයීම, ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ. 1996 දී මුහුණ පෑ බලශක්ති අර්බුදය යෝග්‍ය බලශක්ති කළමනාකරණයක කඩිනම් අවශ්‍යතාවය කෙරෙහි ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කළේය.

1995 දී ශ්‍රී ලංකාවේ බලශක්ති සැපයුම තෙල් සමක ටොන් දශ ලක්ෂ 6.4 ක සීමාවක පැවතුණි[1]. මුළු බලශක්ති සැපයුමෙන් ආසන්න වශයෙන් සියයට 57 ක ප්‍රමාණයක් ජීව ස්කන්ධ බලශක්තියෙන් (Biomass) (ප්‍රධාන වශයෙන් දර) සමන්විත වූ අතර, ඒවා නිවෙස්වල ආහාර පිසීම් සහ කර්මාන්ත සඳහා භාවිතා කළේය. තවත් සියයට 26 ක් ආනයනිත ෆොසිලමය ඉන්ධන (බොර තෙල් සහ ගෑස්) මගින් ලබාගත් අතර මේවා ප්‍රධාන වශයෙන් ප්‍රවාහන, කර්මාන්ත කටයුතු, ආහාර පිසීම, ආලෝක කිරීම හා තාපබල උත්පාදනය සඳහා යොදා ගන්නා ලදී. ඉතිරි සියයට 17 ජල විදුලි බලයෙන් සමන්විත විය. මුළු බලශක්ති සැපයුමෙන් තුනෙන් දෙකක් පරිභෝජනය කරනු ලැබුයේ ගෘහස්ථ සහ වාණිජ අංශයන් ය. ඉතිරිය ප්‍රවාහන අංශය (සියයට 22) සහ කර්මාන්ත අංශය (සියයට 12) පරිභෝජනය කරනු ලැබිණ.

දැනට දේශීය වශයෙන් ලබාගත හැකි බලශක්ති ප්‍රභවය වනුයේ ජල විදුලි බලයයි. 1991-95 කාලය තුළ දී ජල විදුලිබලය මගින් ශ්‍රී ලංකාවේ විදුලි බල සැපයුමෙන් සියයට 91 ක් ද, 1996 දී සියයට 72 ක් ද සපයනු ලැබිය. 1996 දී පැහැදිලිවම පෙනුන අයුරු ජල විදුලි බලය මත වූ දැඩි රැඳියාව විදුලිබල සැපයුම කාලගුණික තත්ත්වයන්ගේ විචලනයන්ට භාජනය වීමට හේතු විය.

1992 සිටම විදුලිබල උත්පාදන ධාරිතාව පුළුල් නොවිය. විදුලි බලය සඳහා වූ ඉල්ලුම ඉදිරි වසර 10 තුළ දී සියයට 9-10 දක්වා ප්‍රමාණයකින් වර්ධනය වේ යයි අපේක්ෂා කෙරේ. රථවාහන තොගයේ වර්ධනය, දර සඳහා ෆොසිලමය ඉන්ධන ආදේශනය සහ අනාගත බලශක්ති උත්පාදනය තාප බලාගාර මගින් සිදු කිරීමට සැලසුම් කිරීම හේතුවෙන් ෆොසිලමය ඉන්ධන සඳහා වූ ඉල්ලුම ද සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය වේ යයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වන වගා සැලසුම (1995) ට අනුව ජීව ස්කන්ධ බලශක්ති (Biomass) ඉල්ලුමෙහි වර්ධනයක් අපේක්ෂා කරන නමුදු එම වර්ධනය වාණිජමය බලශක්ති ඉල්ලුමේ වර්ධනයට වඩා අඩුය. මේ අනුව වර්ධනය වෙමින් පවත්නා බලශක්ති ඉල්ලුම, නිසි කලට සහ කාර්යක්ෂම අයුරින් සපුරාලීමේ අභියෝගයට ශ්‍රී ලංකාව මුහුණ පා ඇත. ප්‍රධාන බලශක්ති ප්‍රභවයන්ට අමතරව ලබාගත හැකි අනෙකුත් විකල්ප බලශක්ති ප්‍රභවයන් වනුයේ සුළං බලශක්තිය, සූර්ය තාප බලශක්ති කුඩා පරිමාණ ජල විදුලි බලය, සාගර තරංග බලශක්තිය, ලී කුඩු දහයියා, කොහු බත් ආදියෙන් නිපදවෙන බලශක්තිය, ජීව වායු බලශක්ති ආදියයි. පිරිවැය, පාරිසරික බලපෑම් සහ අඛණ්ඩ සැපයුමක් පවත්වා ගැනීමේ හැකියාව යන කරුණු සලකත්ම ඉහත කී ප්‍රභවයන්ගේ බලපෑම් එකිනෙකට වෙනස් වේ.

විදුලි බලාගාර ඉදිකිරීමේ කාලසීමාව සලකා බලන කල අධික වියදම් සහිත වුව ද, පරිසරයට ඇතැම් අහිතකර බලපෑම් එල්ල කළ ද, තාපබලය වඩාත්ම සුදුසු විකල්පය වේ. ඉදිකිරීම් සහ සවි කිරීම් කාලසීමාව වසර 1 සිට වසර 4 දක්වා තෝරා ගත් ප්‍රභවයන් අනුව වෙනස් වන අතර නිදසුනක් සේ ගෑස් ටර්බයින සඳහා වසර 1 ක් ද, ඩීසල් විදුලි උත්පාදක යන්ත්‍ර සඳහා මාස 18 ක් ද, චක්‍රීය සංයෝග යන්ත්‍රාගාර සඳහා වසර 2-4 ක කාල සීමාවක් ද, ඛනිජ තෙල් ටර්බයින යන්ත්‍ර සඳහා වසර 2-3 ක කාලසීමාවක් ද වැය වේ.

මෑදි කාලීනව, ජල විදුලිබලය විදුලිබල උත්පාදනයේ ප්‍රධාන ප්‍රභවයක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වේ. වසරකට ගිගාවොට් පැය 3,785 ක බලශක්තිය නිපදවීමට හැකියාවක් ඇති මෙගාවොට් 1,137 ක ජල විදුලිබල ස්ථාපිත ධාරිතාවයක් දැනට ශ්‍රී ලංකාව සතුව පවතී. ගංගා ආශ්‍රිත ජලාශ්‍ර ප්‍රදේශ 100 කට වඩා ශ්‍රී ලංකාව සතුව පැවතුන ද, දේශගුණික හා ඒවා පිහිටි භූමි ප්‍රදේශ අනුව සලකා බලන කල ඉන් 7 ක පමණක් සැලකිය යුතු විදුලිබල ප්‍රමාණයක් ජනනය කළහැකිව ඇත. කැළණි සහ මහවැලි ගංගා ආශ්‍රිතව ලබාගත හැකි ජලවිදුලිබල ධාරිතාවය බොහෝදුරට සංවර්ධනය කර ඇති නමුදු, මහවැලි ගඟේ අතු ගංගා වන උමා ඔය සහ කොත්මලේ ඔය ආශ්‍රිතව තවදුරටත් ජල විදුලි බලය උත්පාදනය කිරීමේ හැකියාවක් ඇත. ලං.වි.ම. ට අනුව අනාගත ජලවිදුලිබල ජනනය කිරීමේ හැකියාව මෙගවොට් 870 ක් වන අතර ඉන් ගිගවොට් පැය 3,680 ක විදුලිබල ශක්තිය නිපදවිය හැක. උතුරු කොත්මලේ, බෝඩිලන්ඩ්ස්, ගිංගඟ, බෙලිහුල්ඔය, මොරගොල්ල, උමා ඔය සහ කුකුලේ, ජල විදුලිබල හැකියාව තවදුරටත් පුළුල් කළහැකි ජලාශ්‍ර ප්‍රදේශ ලෙස ලං.වි.ම. විසින් හඳුනාගෙන ඇත. විශාල ජල විදුලිබල ව්‍යාපෘතියක ස්ථාවර වියදම ඉහළ මට්ටමක පවතින නමුදු, එය සංවර්ධනය කර,විදුලිබල උත්පාදනය ආරම්භ කළ පසු එහි වර්තන වියදම ඉතා සුළු ප්‍රමාණයකි. ජලවිදුලි බලාගාරයක ජීවන කාලය තාප බලාගාරයක ජීවන කාලයට දෙගුණයකටත් වඩා වැඩි වේ. කෙසේ වුව ද, අයහපත් පාරිසරික බලපෑම්, දැනටමත් ඉහළ මට්ටමක පවතින ජල විදුලි බලය මත රැඳියාව අඩු කිරීමේ අවශ්‍යතාවය සහ සීමිත මූල්‍යමය සම්පත් යන කරුණු සලකත්ම ජල විදුලිබල උත්පාදන ධාරිතාවේ විශාල වර්ධනයක් නුදුරු අනාගතයේ දී අපේක්ෂා කළ නොහැක.

නුදුරු අනාගතයේ දී ශ්‍රී ලංකාවට විශාල වශයෙන් ෆොසිලමය ඉන්ධන නිෂ්පාදන ආශ්‍රිත ආනයනික බලශක්ති ප්‍රභවයන් මත රැඳී සිටීමට සිදුවීම නොවැලැක්විය හැකි වේ. ලං.වි.ම. යේ විදුලිබල උත්පාදන පුළුල් කිරීමේ සැලැස්ම (1996) ට අනුව වසර 2010 වනවිට තාප බල උත්පාදනය මෙගවොට් 2,262 දක්වා වැඩි කළ යුතුව ඇත. අවධානයට යොමු වී තිබෙන විවිධ බලශක්ති ප්‍රභවයන් වනුයේ ගල් අඟුරු බලාගාර, ගෑස් ටර්බයින සහ ඩීසල් බලාගාරයි. මේ අතුරින් ගල් අඟුරු වඩාත් ලාභදායී මෙන්ම දීර්ඝකාලීන විදුලිබල උත්පාදනය සඳහා වඩාත් යෝග්‍යතම ප්‍රභවය වේ. කෙසේ වුව ද, ෆොසිලමය ඉන්ධන භාවිතය එහි ඇති පාරිසරික බලපෑම් නිසා නිරන්තර විවේචනයට ලක්ව ඇත.

න්‍යෂ්ටික බලාගාර ඉදිකිරීම සඳහා අධික වියදමක් දැරිය යුතු අතර එයට හේතු වන්නේ න්‍යෂ්ටික විකිරණ ආවරණ සඳහාත් විවිධ ආරක්ෂක පියවර සඳහාත් අවම වශයෙන් කිසියම් යටිතල ව්‍යුහ පහසුකම් ප්‍රමාණයක් සැපයිය යුතු හෙයින් ය. සාමාන්‍යයෙන් අනෙකුත් වාණිජමය බලශක්ති

**විශේෂ සටහන 4 (සම්බන්ධයි)**

ප්‍රභවයන් හා ආර්ථිකමය වශයෙන් තරඟකාරී වීමට න්‍යෂ්ටික බලාගාරයක් මෙගවොට් 500 හෝ රට වඩා වැඩි ප්‍රමාණයකින් යුක්ත විය යුතු යි. කෙසේ වුවද, මෙම දශකයේ දී මුදුන් පැය ඉල්ලුම මෙගවොට් 1,500 ක් නොඉක්මවන බව පෙනෙන්නට ඇති හෙයින් (දැනට මෙගවොට් 980 ක් පමණි) ඉගත කී ප්‍රමාණයේ න්‍යෂ්ටික බලශක්ති ඒකක ශ්‍රී ලංකාවට යෝග්‍ය නොවේ.

විකල්ප බලශක්ති ප්‍රභවයන් සලකන්ම, දිවයිනෙහි ගිණිකොන දිග කොටසෙන් ලබාගත හැකි සුළං විදුලිබල ධාරිතාවය මෙගවොට් 200 ක් පමණ වේ. දිවයිනෙහි ගිණිකොන දිග කොටසට රසාන දිග සහ නිරිත දිග යන මෝසම් සුළං දෙවර්ගයම ලැබෙන හෙයින් මෙම ප්‍රදේශයන්හි සුළං විදුලි බලාගාරයක පිළිගත හැකි ක්‍රියාකාරී මට්ටමක් පවතී යයි අපේක්ෂා කෙරේ. සුළං විදුලිබල උත්පාදන පිරිවැය සුළඟෙහි වේගය සහ උපකරණ පිරිවැය අනුව වෙනස් වේ.

රට තුල මධ්‍යම කඳුකර පළාතේ කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘති ඉදිකිරීමට සුදුසු බිම් කොටස් 400 කට වඩා පැවතුණි. මෙම භූමි භාග වැඩි ප්‍රමාණයක් දැනට අත්හැර දමා ඇති අතර වාණිජමය වශයෙන් දියුණු කළහැකි භූමි භාග ඇත්තේ 100 ක් පමණය. මෙමගින් මෙගවොට් 100 ක පමණ විදුලිබල උත්පාදන ධාරිතාවක් ලබාගත හැකිවේ යයි අපේක්ෂා කෙරේ. මේ අනුව, මෙම කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘති සංවර්ධනය කිරීම මගින් අනාගත විදුලිබල ඉල්ලුම සපුරාලීමට සැලකිය යුතු දායකත්වයක් ලබාගත හැක. කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘති ජාතික පද්ධතියට සම්බන්ධ කොට එමගින් නිපදවෙන විදුලිය සඳහා ඒකකයකට රු. 2.90 බැගින් ගෙවීමට ලං.වි.ම. මගින් ගත් තීරණය එම ව්‍යාපෘති දියුණු කිරීම සඳහා සෑහෙන උනන්දුවක් ඇතිකරලීමට සමත් විය.


සූර්යකෝෂ සඳහා දැරීමට සිදුවන ඉහළ ප්‍රාග්ධන පිරිවැය නිසා ශ්‍රී ලංකාවේ සූර්ය තාප බලශක්ති භාවිතය බෙහෙවින්ම සීමිතය. සූර්ය තාප බලශක්තියෙහි ප්‍රධානතම වාසිය වනුයේ එය නොදියුණු පළාත්වල පවා භාවිතා කළ හැකි වීමයි. නොදියුණු ප්‍රදේශවල මූලික ආලෝකකරණ අවශ්‍යතාවයන් සපුරාලන, විමධ්‍යගත බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය තාප බලශක්තිය සැලකිය හැකිය.

ජීව ස්කන්ධ (Biomass) තවත් ප්‍රධාන බලශක්ති ප්‍රභවයකි. ප්‍රධාන වන වගා සැලස්මට අනුව දැනට පවත්නා ජීව ස්කන්ධ බලශක්ති ප්‍රමාණය වසරකට ටොන් දශ ලක්ෂ 11 ක්පමණ වේ. වර්තමානයේදී ගෘහ ඒක (සියයට


රූප සටහන 1

## ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභවයන්


ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභවයන් - 1991





ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභවයන් - 1995




විදුලි බල ප්‍රභවයන් 1991 - 1995




විදුලි බල ප්‍රභවයන් - 1996



**විශේෂ සටහන 4 (සම්බන්ධයි)**

80) සහ කර්මාන්ත (සියයට 20) භාවිතා කරන ජීව ස්කන්ධ බලශක්ති ප්‍රමාණය ටොන් දශ ලක්ෂ 10 ක් පමණ වේ. නිවෙස්වල ආහාර පිසීම් කටයුතු හැරුණු විට, දර භාවිතා කරන ප්‍රධාන පාරිභෝගිකයා වනුයේ තේ කර්මාන්තයයි. හෝටල්, බේකරි, උළු හා ගඩොල් කර්මාන්තය, රබර් සහ පොල් සැකසුම් කර්මාන්තය දර භාවිතා කරන අනෙකුත් ප්‍රධාන පාරිභෝගිකයන් වේ. ජීව ස්කන්ධ බලශක්තීන් ලබා ගන්නා ප්‍රධාන ප්‍රභවයන් වනුයේ ගෙවතු, බෝග වගා කරන ඉඩම්, වතු කෘෂිකර්මාන්තය සහ ස්වාභාවික වනාන්තරය. නැවත නැවත යොදාගත හැකිවීම සහ විදේශ විනිමය අවශ්‍ය නොවීම ජීව ස්කන්ධ බලශක්තිය සතු ප්‍රධාන වාසි වේ. ශුද්ධ වශයෙන් හරිතාගාර වායු නිපදවීමක් සිදු නොවන හෙයින් ජීව ස්කන්ධ බලශක්ති සැම විටම පරිසර හිතකර ප්‍රභවයක් වේ. දර ඉතා පහසු ලෙස තේ වියලීම සඳහා ද, ගඩොල් සහ උළු නිෂ්පාදනය කිරීම සඳහා ද යොදාගත හැකි අතර දර මගින් ලබා ගන්නා අගුරු ආහාර පිසීම සඳහා යොදාගත හැකි පිරිමැසුම් දායක බලශක්ති ප්‍රභවයක් වේ. ජීව ස්කන්ධ බලශක්ති අංශය හා අදළ ඇතැම් ගැටළු විසඳීම සඳහා කඩිනම් පියවර ගත යුතුව ඇත. ප්‍රධාන වන වගා සැලැසුමේ සඳහන් කළ පරිදි නුදුරු අනාගතයේ දී දැඩි සැපයුම් හිගයන් ඇති වීමට ඉඩකඩ නොමැති වුව ද, ඇතැම් පළාත්වල ලබාගත හැකි දර ප්‍රමාණය අඩු වී ගොස් ඇති අතර, මේ නිසා පළාත් බඳ හිගයන් පැන නැගී ඇත. ග්‍රාමීය ප්‍රදේශවල දර භාවිතය කාර්යක්ෂමව සිදු නොකරන අතර දර මිල අඩුවෙන් නියම කොට ඇත. වඩා කාර්යක්ෂම දර උඳුන් භාවිතය තුළින් දර භාවිතය සියයට 33 කින් පමණ අඩු කළහැකි යයි ඇතැම් අධ්‍යයන මගින් පෙන්වා දී ඇත. වර්තමානයේ දී ජීව ස්කන්ධ බලශක්ති අංශය සම්බන්ධව සම්බන්ධීකරණ සැලසුම් කිරීමක් හෝ සංවර්ධන උපාය මාර්ගයක් දක්නට නොමැත.

[1] ශ්‍රී ලංකාවේ බලශක්ති තුලනය - 1995 - බලශක්ති සංරක්ෂක අරමුදල

විදුලිය කපාහැරීමේ ප්‍රතිඵලයක් ලෙස, 1996 දී ලං. වි. ම. යේ මුළු විදුලිය අලෙවිය සියයට 9 ක පහත වැටීමක් වාර්තා කළේය. පසුගිය වසරේදී විදුලි අලෙවි වර්ධනය සියයට 10 ක් විය. කර්මාන්ත සහ වාණිජ කටයුතු සෑහෙන ප්‍රමාණයකට අඩපන කරමින් කර්මාන්ත සහ වාණිජ අංශයන්ට කළ මුළු විදුලිය අලෙවිය පිළිවෙලින් සියයට 11 කින් සහ සියයට 6 කින් පහත වැටුනේය. අවසාන කාර්තුවේදී විදුලිය පරිභෝජනයේ සිදුවු වර්ධනයත් සමගම (සියයට 12 ක වැඩිවීම) 1996 ගෘහස්ත අංශයේ විදුලිබල ඉල්ලුම පෙර වසර හා සසඳන කළ සුළු වශයෙන් පමණක් පහත වැටුනේය. ගෘහස්ත අංශයේ මුළු පාරිභෝගික සංඛ්‍යාව සියයට 7 කින් පුළුල් වී දශලක්ෂ 1.4 ක් විය. විදුලිය කපාහැරීමේ බලපෑම් පිළිබිඹු කරමින් ලංකා විදුලිබල සමාගමෙන් (ලං. වි. ස) විදුලි අලෙවිය ගිගවොට් 507 දක්වා සියයට 4 කින් පහළ ගියේය. 1996 දී ලංකා විදුලිබල සමාගමේ මුළු පාරිභෝගික සංඛ්‍යාව පුද්ගලයින් 2,67,275 දක්වා පුද්ගලයින් 11,858 කින් වැඩි විය.

1996 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි විදුලිබල ගාස්තු සියයට 8 කින් ඉහළ නැංවිය. මෙම ප්‍රතිශෝධනයේ මූලික අරමුණ වූයේ නැවත අගය කල සාමාන්‍ය ශුද්ධ වත්කම් ප්‍රමාණය මත සියයට 8 ක ඉපයීම් අනුපාතිකයක් ලබාගැනීම, ණය සේවා ආවරණය මෙන් 1.5 ගුණයකට නොඅඩු ප්‍රමාණයක අභ්‍යන්තර මූල්‍ය උත්පාදනය පවත්වා ගැනීම, සහ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන සඳහා අවශ්‍ය අරමුදල් වලින් සාධාරණ ප්‍රමාණයක් උත්පාදනය කිරීමත්ය. කර්මාන්ත සහ වාණිජ අංශයට අදාළ විදුලි බල ගාස්තු පිළිවෙලින් සියයට 7 කින් සහ සියයට 5 කින් වැඩිවිය. ගෘහස්ත අංශය සඳහා වූ විදුලි ගාස්තු කාණ්ඩ පුළුල් කළ අතර, කර්මාන්ත ව්‍යවසායකයන් මත අතිරේක බරක් පටවමින් ගෘහස්ත පාරිභෝගිකයන් වෙත සපයන ලද හරස් සහනාධාරය අඩු කිරීමේ ප්‍රථම පියවරක් වශයෙන් ගෘහස්ත අංශයේ විදුලි ගාස්තු සාපේක්ෂව සියයට 17 ක ඉහළ අනුපාතයකින් වැඩි කරනු ලැබීය.

1996 දී විදුලිබල යටිතල පහසුකම් පුළුල් කිරීම ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම සඳහා වු ආයෝජන රුපියල් දශලක්ෂ 6,444 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මේ අතරින් රුපියල් දශලක්ෂ 3,380 හෙවත් සියයට 53 ක් විදුලිබල උත්පාදන ව්‍යාපෘති සඳහා වු අතර, වසර තුලදී දියත් කළ ප්‍රධාන ව්‍යාපෘති වුයේ සපුගස්කන්ද ඩීසල් විදුලිබල ව්‍යාපෘතිය (මෙගවොට් 40) සහ මෙගවොට් 115 ක කැළණිතිස්ස ගෑස් ටර්බයින් යන්ත්‍රාගාරයයි. විදුලිබල පද්ධති පාඩු අඩු කිරීම වෝල්ටියතා ප්‍රමාණය වැඩි කිරීම හා එහි විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා මධ්‍යම හා දිගු වෝල්ටියතා බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය කිරීමේ අරමුණින් යුතුව රුපියල් දශලක්ෂ 1,687 ක් සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය කරන ලදී. වර්ෂය තුලදී ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘතීන් වූයේ ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා සංවිධානය විසින් මුල්‍යනය කළ සම්ප්‍රේෂණ සැති වැඩිදියුණු කිරීම හා සංවර්ධන ව්‍යාපෘතිය (රුපියල් දශ ලක්ෂ 698) හා සම්ප්‍රේෂණ රැහැන් සහ උප පොළ සංවර්ධන ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 374) ජාත්‍යන්තර සංවර්ධන සංගමය මුල්‍යනය කළ දෙවන විදුලි බල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 219) සහ රජය හා ලං. වි. ම. මගින් මුල්‍යනය කළ ලං. වි. ම. පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 392) යි. ග්‍රාමීය විදුලිබල විශේෂ ව්‍යාපෘතිය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් මුල්‍යනය කළ දීර්ඝ කල ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති (2) සඳහා රුපියල් දශලක්ෂ 603ක් ආයෝජනය කලේය. තවද, ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීම සඳහා තවත් රුපියල් දශලක්ෂ 224 ක් විමධ්‍යගත අයවැයෙන් සපයනු ලැබුවේය. 1996 දී ආයෝජනය සඳහා ලබාගත හැකි අරමුදල් වලින් සියයට 40 ක ඌන උපයෝජනයක් වාර්තා විය. ලං. වි. ම. ට අනුව, ක්‍රමවේදය, කොන්ත්‍රාත්තු ඇගැයීම හා පිරිනැමීම, ඉඩම් ලබාගැනීම, උපදේශක සේවා ලබාගැනීම ආදියෙහි සිදුවූ ප්‍රමාදතා, සහ ණය කාලසීමාව ඉකුත්වීම්, ඌන උපයෝජනයට හේතු වූ ඇතැම් කරුණුය. බලශක්ති අංශය මුහුණපෑ සම්පත් හිගතාවයන් සලකා බලන කල ඉහළ ඌන උපයෝජන මට්ටම දැඩි ලෙස අවධානයට ලක්විය යුතු කරුණකි.

විවරණයට ලක්වන වසර තළදී බලශක්ති සංරක්ෂණය සඳහා පියවර කිහිපයක්ම ගනු ලැබුණි. බලශක්ති සංරක්ෂණ විදුලි පහන් 100,000 ක් සවි කිරීමත්, සමගම බලශක්ති කාර්යක්ෂම ව්‍යාපෘතිය 1996 දී නිමවිය. මෙමගින් වාර්ෂික බලශක්ති පරිභෝජනය ගිගවොට් පැය 7.5 කින්ද, අධි ඉල්ලුමක් පවතින පැයවල ඉල්ලුම මෙගවොට් 5 කින්ද අඩු කරනු ලැබේ. බලශක්ති උපකරණ සවිකිරීම පිණිස ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව මගින් අඩු පොලී අනුපාතිකයන් යටතේ ණය පහසුකම් සපයන ලදී. මෙම ණය ක්‍රම යටතේ ආසන්න වශයෙන් තොග විදුලිබල පාරිභෝගිකයන් 100 ක් පමණ ප්‍රතිලාභ ලබා ගැනීමට නියමිතව සිටියහ. තවත් විදුලි පහන් 500,000 ක් සවිකිරීම පිණිස සුසංගත ප්‍රතිදීප්ත

විදුලි පහන් ව්‍යාපෘතිය, කාර්මික යන්ත්‍ර සඳහා බලශක්ති කාර්යක්ෂම ක්‍රම, වාණිජ අංශයේ වායු සමීකරණ යන්ත්‍ර සඳහා බලශක්ති කාර්යක්ෂම ක්‍රම, බලශක්ති සංරක්ෂණ විදිආලෝක කිරීමේ වැඩ සටහන් ආදිය හඳුන්වා දීම මගින් නුදුරු අනාගතයේදී බලශක්ති භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර ඇත.

විදුලි බල සැපයුමෙහි හිඟතාවයන්ට ප්‍රතිකර්ම ලෙස විකල්ප බලශක්ති සංවර්ධනය කෙරෙහි වසර තුළදී දැඩි ලෙස අවධාරණය කළේය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙගෙවොට් 3 ක නියාමක සුළං විදුලි බල ව්‍යාපෘතියක් සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ අතර, ග්‍රාමීය මට්ටමේ කුඩා පරිමාන ජල විදුලි බල ව්‍යාපෘති දෙකක් ස්ථාපනය කලේය. බටහිර වෙරළබඩ පළාත් වල පවත්නා සුළං විදුලිබල ධාරිතාව ඇගැයීම, සූර්ය බලශක්ති සංවර්ධනය සහ කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘති පිණිස ණය සැපයීම වසර තුළදී සැලකිල්ලට බඳුන් විය.

## ඛණිජ තෙල් නිෂ්පාදිත

විචරණයට ලක්වන වසර තුලදී බොරතෙල් ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් දශලක්ෂ 2.0 දක්වා සියයට 9 කින් වැඩි විය. තාපබල උත්පාදනය වැඩිවීම හේතුවෙන් පිරිපහදු නිෂ්පාදන ආනයන 1995 මට්ටමට වඩා සියයට 30 කින් වැඩි විය. ආනයන මිළ ඉහළ නංවමින් බොරතෙල් බැරලයක් සඳහා වූ සාමාන්‍ය ජාත්‍යන්තර මිළ ගණන් 1995 දී ඇමරිකානු ඩොලර් 17.59 සිට 1996 දී ඇමරිකානු ඩොලර් 20.19 දක්වා සියයට 15 කින් වැඩිවිය. 1990 සිට වාර්තා වූ වැඩිම මිළ මෙය වේ. එල්පී ගෑස් ආනයන පරිමාව මෙට්‍රික් ටොන් 71,000 දක්වා සියයට 8 කින් පහත වැටුණු අතර, ගෑස් සඳහා වූ ජාත්‍යන්තර මිළ ගණන් ඉහළ යාම පිළිබිඹු කෙරෙමින් ආනයනය වටිනාකම රුපියල් දශලක්ෂ 1447 දක්වා සියයට 29 කින් ඉහළ ගියේය. ආනයනික බලශක්ති ප්‍රභවයන් මත වූ දැඩි රැඳියාව පිළිබිඹු කරමින් ඛණිජ තෙල් ආනයන වියදම රුපියල් දශලක්ෂ 6,697 සිට රුපියල් දශලක්ෂ 26,525 දක්වා ඉහළ ගිය අතර, එය මුළු ආනයන බිලෙන් සියයට 10 කට දායක විය.

1996 සැප්තැම්බර් 29 දින සිට බලපැවැත්වෙන පරිදි, සියළුම වර්ගයේ ඛණිජ තෙල් නිෂ්පාදිත මිළ ගණන් ඉහල නංවනු ලැබිය. ඉහළ ජාත්‍යන්තර මිළ, ඇතැම් ඛණිජ තෙල් නිෂ්පාදිත මත වූ හරස් සහනාධාර අඩු කිරීම සහ රජයේ ආදායම ඉහළ නැංවීම මෙම ප්‍රතිශෝධනයට ප්‍රධාන හේතූන් විය. පෙට්රල් සඳහා වූ නිෂ්පාදන බදු ලීටරයකට රුපියල් 7 සිට රුපියල් 12.38 දක්වා ඉහළ නංවමින් පෙට්රල් මිළ ලීටරයකට රුපියල් 10 කින් වැඩි කළේය. සුදු ඩීසල් සඳහා වූ ඍණ ලාභ ආන්තිකය ලීටරයකට රුපියල් 1.94 සිට රුපියල් 1.43 දක්වා අඩු කරමින් ඩීසල්වල මිළ ලීටරයකට ශත 80 කින් වැඩි කලේය. 1994 සිටම නොවෙනස්ව පැවැති භූමිතෙල් මිල ලීටරයකට ශත 90 කින් වැඩි කළ අතර, එහි විකුණුම් අලාභය ලීටරයකට රු. 4.13 සිට රුපියල් 2.72 දක්වා අඩු විය. මිල ප්‍රතිශෝධන ඇති වුවද, ඩීසල් සහ භූමිතෙල් සඳහා වූ හරස් සහනාධාර 1996 දී තවදුරටත් ක්‍රියාත්මක විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ මූල්‍ය අලාභය 1996 දී රුපියල් දශලක්ෂ 1000 ක්ලෙස ඇස්තමේන්තු කර ඇත. මේ අතර, එල්පී ගෑස් මිළ වසර තුලදී සියයට 20 කින් වැඩි විය.

1996 දී දේශීය ඛණිජ තෙල් නිෂ්පාදිත පාරිභෝජනය සියයට 23 කින් තියුණු ලෙස වැඩිවිය. මෙය පසුගිය වසර 10 තුළදී වාර්තාගත වූ ඉහළම වර්ධනයයි. තාපබල උත්පාදනය සඳහා වූ අතිරේක අවශ්‍යතා පිළිබිඹු කරමින් සුදු ඩීසල්, බැර ඩීසල් සහ දැවි තෙල් සඳහා වූ ඉල්ලුම කැපී පෙනෙන ලෙසින් වැඩි විය. ඩීසල් සඳහා වූ ඉල්ලුම (බැර ඩීසල්ද ඇතුළුව) ඉකුත් තෙවසර තුල පැවැති සියයට 10 ක සාමාන්‍ය වාර්ෂික වර්ධනය හා සසඳන කළ සියයට 30 කින් පුළුල් විය. ඩීසල් රථවාහන ඇනිය වැඩිවීම, තාපබල උත්පාදනය සඳහා වැඩිවූ ඉල්ලුම, 1996 ජූනි 1 දායින් පසුව බැර ඩීසල්, සුදු ඩීසල් යටතේම වර්ග කිරීම යන කරුණු තුනෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් සේ ඩීසල් සඳහා වූ ඉල්ලුම වැඩිවීම සැලකිය හැකිය. පෙට්‍රල් මිළ සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියද, පෙට්‍රල් සඳහා ඉල්ලුම සාමාන්‍ය ලෙස සියයට 4 කින් වර්ධනයවූ අතර, භූමිතෙල් අලෙවිය 1996 දී සියයට 3 කින් වර්ධනය විය. ආහාර පිසීම සඳහා ගෑස් භාවිතා කිරීම වැඩිවීම පිළිබිඹු කරමින් එල්පී ගෑස් සඳහා වූ ඉල්ලුම 1996 දී සියයට 14 කින් වර්ධනය විය.

පසුගිය වසරෙහි ත්‍රස්තවාදී ප්‍රහාර නිසා හානි සිදුවූ කොළොන්නාව සහ ඔරුගොඩවත්ත තෙල් ගබඩා සංකීර්ණ ප්‍රතිශ්ඨාපනය කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක 1996 දී ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව (ලං. ඛ. තෙ. සං.) නිරත විය. මෙයට අමතරව, අනාගත ඉල්ලුමෙහි වැඩිවීම සපුරාලීමට සහ පිටපළාත්වල බෙදාහැරීමේ කටයුතු පහසු කිරීමට සපුගස්කන්දෙහි නව තෙල් බෙදාහැරීමේ මාර්ගයක් ඉදිකිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 24 ක පිරිවැයක් යටතේ ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය කරනු ලබයි. කොලොන්නාව ගබඩා සංකීර්ණයේ ගබඩා ධාරිතාව තවදුරටත් පුළුල් කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගනු ලැබූ අතර, නව ගබඩා ටැංකි 13 ක් පළාත්බද ඩිපෝ තුළ ඉදිකිරීමේ කටයුතු, වසර තුළදී කරගෙන යනු ලැබින. උතුරු පළාතේ ඉන්ධන සැපයීම සහ බෙදාහැරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු කරගෙන යනු ලැබූ අතර, 1997 ප්‍රථම කාර්තුව වන විට මෙම පහසුකම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. ගුවන් යානා ඉන්ධන සැපයීම් පහසුකම් කටුනායක ස්ථාපිත කිරීම, බොරතෙල් වාෂ්ප යන්ත්‍රාගාරයක් සවි කිරීම, ෆලැට්ෆෝමර් ඒකකය නවීකරණය කිරීම, තාර නිෂ්පාදන ඒකකය නවීකරනය කිරීම ආදිය ඛණිජ තෙල් අංශයේ යටිතල පහසුකම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමට, නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඇතැම් ව්‍යාපෘතීන් වේ.

## 5.6 ප්‍රවාහනය

### ප්‍රවාහන පද්ධතිය

ජාතික ප්‍රවාහන පද්ධතිය ප්‍රධාන වශයෙන් මාර්ග හා දුම්රිය යටිතල පහසුකම්වලින්ද, මගී හා භාණ්ඩ ප්‍රවාහන වාහන වලින්ද වරාය සේවා සහ ගුවන් ප්‍රවාහන සේවා වලින්ද සමන්විත වේ. ලංකාවේ කිලෝමීටර් 100,000 කට ආසන්න මාර්ග පද්ධතියක් ඇති අතර ඉන් කිලෝමීටර් 11,147 ක් ජාතික මාර්ග වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය (මා. සං. අ.) යටතේද ඉතිරිය පළාත් සභා, පළාත් පාලන ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන යටතතේද පවතී. ජනතාසන්තක බස් සමාගම් සහ පෞද්ගලික බස් හිමියන් සතුව 21,000 ක පමණ බස් රථ ඇනියක් ඇත. කෙසේ වෙතත්, දිනකට සාමාන්‍ය යෙන් ධාවනය වූයේ මුළු බස් රථ ඇනියෙන් සියයට 65 ක් පමණි. පසුගිය වර්ෂ පහ තුළදී මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සාමාන්‍යයෙන් වර්ෂයකට මෝටර් බයිසිකල්ද ඇතුළුව මගී ප්‍රවාහන මෝටර් රථ 71,244 ක් ලියාපදිංචි කර ඇත. කි.මී. 1982 ක් පමණ දිර්ඝ වූ දුම්රිය මාර්ග පද්ධතියක් ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී. ලං. දු.) සතුවේ. දුම්රිය එන්ජින් 134 ක්ද දුම්රිය මැදිරි 1,312 ක්ද භාණ්ඩ ප්‍රවාහන ගැල් 2,575 ක්ද ශ්‍රී ලංකා දුම්රිය සේවය

### සංඛ්‍යා සටහන 5.6
## ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | ඒකක | 1994 | 1995 | 1996 (අ) | ප්‍රතිශත වෙනස 1995 | ප්‍රතිශත වෙනස 1996 |
|---|---|---|---|---|---|---|
| **1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම** | | | | | | |
| 1.1 පෞද්ගලික මාර්ග ප්‍රවාහන බස්රථ (ආ) | සංඛ්‍යාව | 3,347 | 1,653 | 1,364 | -51 | -17 |
| 1.2 පෞද්ගලික මෝටර් රථ (ඇ) | ,, | 22,517 | 30,046 | 31,921 | 33 | 6 |
| 1.3 මෝටර් බයිසිකල් | ,, | 36,791 | 34,207 | 31,955 | -7 | -7 |
| 1.4 භාණ්ඩ ප්‍රවාහන වාහන | ,, | 5,213 | 7,293 | 5,660 | 40 | -22 |
| 1.5 ඉඩම් වාහන | ,, | 7,160 | 9,294 | 8,340 | 30 | -10 |
| 1.6 පෞද්ගලික බස්රථ | ,, | 476 | 47 | 115 | -90 | 145 |
| 1.7 වෙනත් | ,, | 34 | 30 | 65 | -12 | 117 |
| **2. ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය (ශ්‍රී. ල. දු. සේ.)** | | | | | | |
| 2.1 ධාවන කිලෝමීටර් | දශ ලක්ෂ | 8 | 8 | 7 | 0 | -13 |
| 2.2 මගී කිලෝමීටර් | ,, | 3,202 | 3,321 | 3,478 | 4 | 5 |
| 2.3 බඩු ටොන් කිලෝමීටර් | ,, | 154 | 136 | 124 | -12 | -9 |
| 2.4 මුළු ආදායම | රු. දශ ලක්ෂ | 916 | 947 | 938 | 3 | -1 |
| 2.5 වර්තන වියදම් | ,, | 1,675 | 1,735 | 1,826 | 4 | 5 |
| 2.6 මෙහෙයුම් අලාභය | ,, | 759 | 788 | 888 | 4 | 13 |
| 2.7 ප්‍රාග්ධන වියදම් | ,, | 2,584 | 3,117 | 4,624 | 21 | 48 |
| 2.8 සමස්ත අලාභය | ,, | 3,343 | 3,905 | 5,512 | 17 | 41 |
| **3. ප්‍රාදේශීය බස් සමාගම්** | | | | | | |
| 3.1 ධාවන කිලෝමීටර් | දශ ලක්ෂ | 307 | 353 | 349 | 15 | -1 |
| 3.2 මගී කිලොමීටර් | ,, | 15,613 | 19,390 | 20,267 | 24 | 5 |
| 3.3 මුළු ආදායම | රු. දශ ලක්ෂ | 3,944 | 4,702 | 5,181 | 19 | 10 |
| 3.4 මෙහෙයුම් වියදම් | ,, | 4,509 | 5,337 | 5,964 | 18 | 12 |
| 3.5 මෙහෙයුම් අලාභය | ,, | 565 | 635 | 783 | 12 | 23 |

(අ) තාවකාලික
(ආ) ප්‍රාදේශීය බස් සමාගම්වල ලියාපදිංචි කරන ලද බස් රථද ඇතුළත්ය
(ඇ) ද්විත්ව කාර්ය වාහන ඇතුළත් වේ

මූලයන් : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ජාතික ප්‍රවාහන කොමිෂම

සතුය. කෙසේ වෙතත් දුම්රිය එන්ජින් 134 න් ධාවන තත්ත්වයේ පවතින්නේ 76 ක් පමණි. 1996 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය සේවය භාණ්ඩ ටොන් කිලෝ මීටර් දශලක්ෂ 124 ක් ප්‍රවාහනය කළ අතර එය රටේ සමස්ත භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 6 ක් පමණ වේ. භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධව ප්‍රධාන කාර්යභාරයක් පෞද්ගලික අංශයේ භාණ්ඩ ප්‍රවාහකයන් විසින් ඉටු කරනු ලබයි. පසුගිය වර්ෂ 5 තුළ සාමාන්‍යයෙන් වර්ෂයකට භාණ්ඩ ප්‍රවාහන වාහන 5,448 ක් පමණ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබ ඇත. වරාය කටයුතු සම්බන්ධයෙන් සලකා බැලීමේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රධාන කාර්යභාර ඉටුකරනු ලබන අතර, එය විසින් කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරේ යන වරායන් 4 මෙහෙයවනු ලබයි. වරායවල හසුරුවන සහ මුළු භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් කොළඹ වරායේදී හසුරුවනු ලැබේ. කොළඹ වරාය සතුව බහාලුම් පර්යන්ත දෙකක්ද, බහාලුම් හසුරවන ගැන්ට්‍රි දොඹකර 13 ක්ද, වියලි භාණ්ඩ පර්යන්ත 5 ක්ද, ද්‍රව භාණ්ඩ හසුරුවනු ලබන පර්යන්තයක්ද පවතී. බහාලුම් පර්යන්තවල වාර්ෂික ධාරිතාවය අඩි 20 ට සමාන බහාලුම් ඒකක දශ ලක්ෂ 1.6 ක් හැසිරවීමේ හැකියාවට සමානය.

1996 වර්ෂය තුලදී ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් ගණනාවක් හඳුන්වා දීම මගින් රටෙහි ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විශාල ප්‍රයත්නයක් දරන ලදී. බස් ප්‍රවාහනයේ සහ දුම්රිය ප්‍රවාහනයේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් විශේෂඥයන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීමට ප්‍රවාහන බලධාරීන් උනන්දු විය. මේ අතර දැනට ක්‍රියාත්මක කරනු ලබන මාර්ග පුනරුත්ථාපන වැඩ සටහන්වලට අමතරව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නව දකුණු අධිවේගී මාර්ගය සහ කොළඹ කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. එමෙන්ම, කොළඹ වරාය සහ ගාලු වරාය ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අත්පත් කර ගැනීම ක්‍රියාත්මක කිරීම පැවරීම (BOO/BOT) පදනම යටතේ පුළුල් කිරීමේ යෝජනාද සලකා බලමින් පවතී.

## මාර්ග සංවර්ධනය

"ඒ" සහ "බී" පංතියේ ජාතික මහාමාර්ග නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම මාර්ග සංවර්ධන අධිකාරියේ (මා. සං. අ.) වගකීමක් වන අතර අනෙක් මාර්ග නඩත්තු කිරීම පළාත් සභා සහ වෙනත් ආයතන වල වගකීමකි. 1996 වර්ෂයේදී "ඒ" සහ "බී" කාණ්ඩවල මහාමාර්ග කිලෝමීටර් 11,147

දක්වා කිලෝමීටර් 16 කින් වැඩිවිය. මීට අමතරව, මා. සං. අ. විසින් පාලම් 4,422 ක්ද වර්ෂය තුලදී නඩත්තු කරන ලදී. පවත්නා මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ ඉදිකිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ප්‍රබල අවශ්‍යතාවයක් පවතිද්දී, ජාතික මහා මාර්ග ඉදිකිරීම්/ පුනරුත්ථාපනය කිරීම සඳහා දරන ලද මුළු ආයෝජන වියදම රුපියල් දශ ලක්ෂ 3,330 දක්වා සියයට 8 කින් අඩු විය. මෙම අඩුවීමට, විදේශීය අරමුදල් සපයන ලද සමහර ව්‍යාපෘති සම්බන්ධයෙන්වූ නොවැලැක්විය හැකි වූ මූලික ක්‍රියාමාර්ග ඉටුකිරීමේ ප්‍රමාදයන් තරමක් දුරට බලපෑවේය. මේ අතර, මහාමාර්ග සඳහා දරන ලද සමස්ත ආයෝජනයෙන් සියයට 7 ක් හෙවත් රුපියල් දශලක්ෂ 236 ක් මාර්ග නඩත්තු කටයුතු සඳහා වෙන් කෙරිණි. කෙසේ වෙතත්, මෙම ප්‍රමාණය පසුගිය වර්ෂය හා සමග සැසඳීමේදී සියයට 20 ක වැඩිවීමකි. පළාත් සභා විසින් නඩත්තු කරනු ලබන මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීමේ හදිසි අවශ්‍යතාවය අවධාරනය කරමින් මහා මාර්ග අමාත්‍යාංශය පළාත් සභාවලට අරමුදල් සැපයීම මගින් ඊට ආධාර කරනු ලබන අතර මේ සඳහා 1995 දී වෙන් කරන ලද රුපියල් දශලක්ෂ 600 සමග සැසඳීමේදී 1996 දී රුපියල් දශලක්ෂ 800 ක් වෙන් කරන ලදී.

1996 දී මා.සං.අ. පවත්නා ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන විදේශ ආධාරද සහිතව මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ප්‍රධාන ව්‍යාපෘති 4 ක් යටතේ ක්‍රියාත්මක කළේය. ආසියානු සංවර්ධන බැංකුවේ (ආ.සං.බැ) මූල්‍යමය සහයෝගය සහිතව අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගයේ අවිස්සාවේල්ල සිට හැටන් දක්වා කොටස (කි. මී. 72.5) 1996 වර්ෂය තුලදී නිම කරන ලදී. තෙවන ලෝක බැංකු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ දකුණු, බස්නාහිර සහ වයඹ යන පළාත්වල මාර්ග කිලෝ මීටර් 397 ක් පුනරුත්ථාපනය කිරීමේ සහ පාළම් 19 ක් නැවත ඉදිකිරීමේ කටයුතු 1996 වර්ෂය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතිනි. මෙම ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් දශලක්ෂ 2,370 ක් වන අතර ඉන් රුපියල් දශලක්ෂ 753 ක් 1996 දී දරන ලදී. තෙවන ආ.සං.බැ මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ කිලෝ මීටර් 81 ක් සහ රුපියල් දශ ලක්ෂ 1,308 ක පිරිවැයකින් යුත්, කුරුණෑගල - පාදෙනිය, කටුගස්තොට - මාතලේ, පේරාදෙනිය - ගම්පොල, මහනුවර - තැන්නේකුඹුර යන මාර්ග කොටස් පුනරුත්ථාපනය කිරීමේ වැඩකටයුතු ක්‍රියාත්මක කළේය. මෙම ව්‍යාපෘතින් යටතේම, කිලෝමීටර් 103 කින් යුත් කටුනායක - පුත්තලම මාර්ග කොටස පුනරුත්තාපනය කිරීම 1997 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. තවද ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කළ කාලීන මාර්ග නඩත්තු ව්‍යාපෘතිය යටතේ මාර්ග කිලෝ මීටර් 1,687 ක් රුපියල් දශලක්ෂ 754 ක වියදමින් 1996 වර්ෂය තුලදී තාර සහ වැලි අතුරා පිළිසකර කරන ලදී.

ඉහත සඳහන්කල මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිවලට අමතරව, විදේශීය ආධාර ලබන පහත සඳහන් ව්‍යාපෘති සම්බන්ධයෙන්ද මාර්ග සංවර්ධන අධිකාරිය අවශ්‍ය කටයුතු සම්පාදනය කලේය. බේස්ලයින් මාවත සංවර්ධන කිරීමේ ව්‍යාපෘතියේ පළමු පියවර යටතේ ඇති ඉදිකිරීමේ වැඩකටයුතු සඳහා කොන්ත්‍රාත්තු 1996 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ප්‍රදානය කළ අතර එම ව්‍යාපෘතියේ දෙවන පියවර යටතේ ගැනෙන වැඩකටයුතු සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සම්පාදනය නිම කලේය. එමෙන්ම, ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර ඇතිව ඉදිකිරීමට නියමිත ශ්‍රී ලංකා - ජපන් මිත්‍රත්ව පාලමේ දෙවන අදියර යටතේ වන පුළුල් කිරීම් සඳහාද විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස්කිරීමද ආරම්භ කරන ලදී. මේ අතර අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන ක්වේට් අරමුදලේ ආධාර ඇතිව පාලම් 28 ක් පුනරුත්ථාපනය කිරීම/ නැවත ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘතියද 1996 වර්ෂයේදී ආරම්භ කරන ලදී. එමෙන්ම රත්නපුර - බෙරගල - බණ්ඩාරවෙල (කි. මී. 98) මාර්ගය රුපියල් දශ ලක්ෂ 1,775 ක පිරිවැයකින් පුනරුත්ථාපනය කිරීම සඳහා කොරියාවේ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල සමග ගිවිසුමකට එළඹෙන ලදී.

පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය පුළුල්වීම පහසු කරවීම පිළිබඳව දීර්ඝකාලයක් තිස්සේ පැවැති අවශ්‍යතාවයට අනුව විශේෂයෙන්ම විකල්ප මහාමාර්ග ඉදිකිරීම හඳුන්වා දෙමින් 1996 වර්ෂයේදී මාර්ග පද්ධතිය පුළුල්කිරීම සම්බන්ධ වැදගත් තීරණ කීපයක් ගනු ලැබීය. ප්‍රධාන නව මහාමාර්ග ව්‍යාපෘති දෙකක, එනම් කොළඹ - මාතර මහා මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීමේ කටයුතු 1996 වර්ෂයේදී ආරම්භ කෙරින. මෙම මහාමාර්ග ව්‍යාපෘති දෙක සම්බන්ධයෙන්ම, ආර්ථික ශක්‍යතා අධ්‍යයනය සහ පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ අධ්‍යයන වර්ෂය තුලදී කරගෙන යන ලදී. දකුණු මහාමාර්ගය සම්බන්ධයෙන් විස්තරාත්මක ඉන්ජිනේරු සැලසුමෙන් කොටසක් වර්ෂය තුලදී නිමකරන ලදී. මහාමාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත්කර ගැනීම ක්‍රියාත්මක වෙමින් පවතී. මේ අතර කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් ප්‍රාථමික භූමි සැලසුම, ඉඩම් පවරා ගැනීම සහ තාක්ෂණික සැලසුම සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය විසින් මූලිකව ආවරණය කරන ප්‍රමාණය තරමක සතුටුදායක මට්ටමක පවතින අතර එය පුද්ගලයන් 10,000 කට කිලෝ මීටර් 54 ක මාර්ග ඝනත්වයකින් හෙවත් වර්ග කිලෝමීටර් 1,000 කට කිලෝ මීටර් 1,558 ක මාර්ග පද්ධතියකින් යුක්ත වේ. කෙසේ වෙතත්, පවත්නා මාර්ග පද්ධතියෙන් විශාල ප්‍රමාණයක, විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා සහ පළාත් පාලන සභා ආයතන යටතේ ඇති මාර්ග වල (කිලෝමීටර් 88,000 පමණ) අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ල යොමුවිය යුතුව ඇත. ඉහළ නගින පිරිවැය හමුවේ ජාතික මහාමාර්ග නඩත්තු කිරීම සඳහා වෙන් කෙරෙන සම්පත් ප්‍රමාණයද ප්‍රමාණවත් නොවේ. මේ අතර, පසුගිය වර්ෂවල මහාමාර්ග සඳහා කළ ආයෝජනයන් ප්‍රධාන වශයෙන්, මුළු මාර්ග පද්ධතියෙන් සියයට 10 ක් පමණ වන ජාතික මහාමාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා යොමු කරන ලදී. රාජ්‍ය ආයෝජන වැඩසටහනට 1996 - 2000 ප්‍රකාශනයට අනුව, දශවර්ෂයකට ආසන්න කාලයක සිට ලැබුන විදේශ ආධාර යටතේ මෙතෙක් පුනරුත්ථාපනය කිරීමට හැකිවී ඇත්තේ මාර්ග කි. මී. 1000 කට ආසන්න ප්‍රමාණයකි. ප්‍රවාහන සේවාවන් සඳහා වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි මාර්ග නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම මෙන්ම නව ඉදිකිරීම්ද සිදුවී නොමැති නිසා විශේෂයෙන්ම නාගරික මධ්‍යස්ථානවල උග්‍ර රථවාහන තදබදයක් දක්නට ලැබුනු අතර එය නිෂ්පාදන අලාභ ඇතිකිරීමටත්, ආයෝජකයන්ගේ අපේක්ෂාවන් අධෛර්‍යමත් කිරීමටත් හේතුවිය. කාලීන නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි සම්පත් වෙන්කිරීමත්, නඩත්තු කටයුතු සුපරීක්ෂනය සඳහා යහපත් කළමනාකරණයක් ඇතිකිරීමත් අත්‍යාවශ්‍ය කරුණක් වී ඇති මාර්ග විනය ආරක්ෂා කිරීම සහ නවීන සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම ඇතුලත් වන පරිදි කාර්යක්ෂමව රථවාහන කළමණාකරන ක්‍රමයක් අප්‍රමාදව පිහිටවිය යුතුව ඇත. ප්‍රවාහන සේවාවන් සඳහා ඉහළ යන ඉල්ලුම සැපිරීම සඳහා නව මහා මාර්ග විකල්ප මාර්ග, සහ පාලම් ඉදිකරීමද අත්‍යාවශ්‍ය කාර්යයක් බවට පත්ව ඇත.

## මගී ප්‍රවාහනය

මාර්ග සහ දුම්රිය මගී ප්‍රවාහන සේවාවන්, කළමනාකරණය, සංවිධානාත්මක ව්‍යුහය, ආයෝජනය යන මූල්‍යමය සීමා යන ක්ෂෙත්‍රවල පැවැති විවිධ ඌනතා හේතුකොට ගෙන තව දුරටත් පීඩාවට ලක්විය. ජනතාසන්තක සමාගම් අයෝග්‍ය ලෙස බෙදා තිබීම, එම සමාගම්වල සම්පත් අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට හේතුවී ඇති අතර එය තවදුරටත් ප්‍රවාහන ව්‍යාපාරයේ පවත්නා කළමණාකරන සහ මූල්‍ය පාලනය පිළිබඳ වෘත්තීය විශේෂඥතාවය පොදුවේ ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවද වලක්වා ඇත. බස්රථ අයිතිය පුද්ගලයන් රාශියක් සතුවීම සහ බස්රථ හිමියන් පණවා ඇති නීතිරීති නොපිළිපැදීම, ගුණාත්මක වශයෙන් ඉහළ මට්ටමක සේවයක් සැලසෙන පරිදි පෞද්ගලික මගී ප්‍රවාහන සේවාව සංවිධානය කිරීමට බාධාවක්ව පවතී. එමෙන්ම, ප්‍රධාන වශයෙන් පසුගිය කාලය තුල ප්‍රමාණවත් පරිදි ආයෝජන නොකිරීම නිසා ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු ප්‍රවාහන උපකරණවල පැවැති හිඟකමත් දුම්රිය මාර්ග නිසි ලෙස නඩත්තු නොකිරීමත් නිසා දුම්රිය සේවය විවිධ පීඩාවන්ට ලක්විය. ප්‍රවාහන අංශයේ පවත්නා මෙවැනි අඩුපාඩු මගී ප්‍රවාහන අංශයේ වාණිජ පැවැත්ම බරපතල අභියෝගයක් වී ඇති අතර, දිගින් දිගටම මූල්‍ය අලාභ වාර්තා කිරීමටද හේතු වී ඇත. මෙම තත්ත්වය තවදුරටත් බැරෑරුම් වූයේ සියලුම ප්‍රවාහන සේවා සපයන්නන්ට සුබසාධන හේතු මත වෙළෙඳපොල මිලට වඩා අඩු මට්ටමක මිලක් තීරණය කෙරෙන මිල ප්‍රතිපත්තියකට අවනත වීමට සිදුවූ හෙයිනි. කෙසේ වෙතත් වර්තමාන ආර්ථික තත්වය යටතේ, කාර්යක්ෂම, ආරක්ෂා සහිත සහ විශ්වාසදායී ප්‍රවාහන සේවයක් ප්‍රතිසංවිධානය කිරීම ඉතා හදිසි කටයුත්තක් වී ඇත්තේ එවැනි ප්‍රවාහන සේවයක් නොමැති වීමෙන් මහජනයා අපහසුතාවයන්ට පත්වනවා පමණක් නොව එය ආර්ථික කටයුතු අඩාල වීමටද හේතුවන බැවිනි.

මාර්ගස්ථ මගී ප්‍රවාහන අංශය ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් රජය, "ජනතාසන්තක සමාගම් සහ පෞද්ගලික බස් ධාවකයන් ප්‍රතිසංවිධානය" කිරීම සඳහා 1995 දී කමිටුවක් පත් කරන ලදී. මෙම කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ වලට අනුව, ජනතාසන්තක සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. මේ යටතේ, දැනට 93 ක් වන ජනතාසන්තක සමාගම් ගණන එකොලහක් දක්වා අඩුවෙන පරිදි සමාගම් ඒකාබද්ධ කර විශාල ප්‍රාදේශීය ගමනාගමන සමාගම් පිහිටුවීමටත් ඒවා සමාගම් පණත යටතේ ලියාපදිංචි කිරීමටත් යෝජිතය. මේ නිසා ප්‍රාදේශීය ගමනාගමන සමාගම් වලට අදාල ප්‍රදේශයේ වඩාත් කාර්යක්ෂම ඒකාබද්ධ ගමනාගමන සේවයක් පවත්වාගෙන යාමට හැකිවන අතර පරිමානුකූල පිරිමැසුම් ලබාගැනීමටත්, කළමනාකරණය, පුහුණු කිරීම් සහ නඩත්තු කිරීම් හා සම්බන්ධ සම්පත් පොදුවේ ප්‍රයෝජනයට ගැනීමටත් හැකියාව ලැබේ. සමස්ත මගී ප්‍රවාහන වෙළෙඳපොලෙන් සියයට 60 කට පමණ දායක වන පෞද්ගලික බස් ධාවකයන්ට ආසන්න වශයෙන් බස්රථ 12,000 ක් පමණ සතුවූ නමුත් දිනපතා ධාවනයට යෙදවූ සාමාන්‍ය බස්රථ සංඛ්‍යාව 9,000 ක් පමණ විය. පෞද්ගලික බස් රථ ධාවකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් (සියයට 95 ක් පමණ) එක් බස්රියක් පමණක් හිමිකරුවන්ය. බස් ගමනාගමන ප්‍රතිසංවිධාන කමිටුව නිර්දේශ කර ඇති ආකාරයට ඉදිරි වර්ෂ 3 කට පසු පෞද්ගලික බස්රථ ධාවනය සඳහා බලපත්‍ර ලබාදිය යුතු වන්නේ අවම වශයෙන් බස් රථ 50 ක් වත් අයත්වන පරිදි පෞද්ගලික බස්රථ හිමියන් විසින්ම පිහිටුවා ගනු ලබන සමාගම් වලට පමණි. එමෙන්ම ආසන ධාරිතාවය 40 නොඉක්මවන බස්රථ සඳහා නව මාර්ග බලපත්‍ර නිකුත් නොකළ යුතු බවද නිර්දේශ කර ඇත. රජය විසින් මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි නියැලී සිටී.

මගී ප්‍රවාහන අංශයෙහි පවත්නා ප්‍රධාන ගැටළු වලට මිළ ප්‍රතිපත්තිය මුල් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, විශේෂයෙන්ම පෞද්ගලික බස්රථ ධාවකයන්, අධිකලෙස මගීන් පැටවීමෙන් සහ වාසිදායක මාර්ගවල පමණක් ධාවනයෙහි යෙදීමෙන් සේවය පවත්වාගෙන යනු ලැබේ. පොදු ප්‍රවාහන අංශයෙහි පවත්නා අධිකතර මූල්‍යමය අලාභ රාජ්‍ය අය - වැය මත අතිරේක බරක් ඇති කලේය. මෙම කරුණු විමසා බලා පොදු ප්‍රවාහන ගාස්තු කමිටුව සැළකිය යුතු මට්ටමක ප්‍රවාහන ගාස්තු වැඩි කිරීමක් නිර්දේශ කළ ද (බස් මගී ප්‍රවාහන සඳහා සියයට 21 - 40 අතර පරාසයක වැඩි කිරීමක් සහ දුම්රිය ප්‍රවාහනය සම්බන්ධයෙන් සියයට 46 ක වැඩිකිරීමක්) රජය විසින් අනුමත කරනු ලැබුයේ බස් ගමනාගමනය සම්බන්ධයෙන් සියයට 15 ක පමණ වැඩි කිරීමක් සහ දුම්රිය ප්‍රවාහනය සම්බන්ධයෙන් සියයට 20 ක වැඩි කිරීමක් පමණි. පිරිවැය සහ සාධාරණ ලාභ ආන්තිකයක් ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් ගාස්තු වැඩි කිරීමක් අත්‍යවශ්‍ය කරුණක් වී ඇති අතර එවැනි ගාස්තු සංශෝධනයක් සමග සේවා ගුණාත්මක භාවයේ සහ සුරක්ෂිත භාවයේ සතුටුදායක මට්ටමක වැඩිදියුණු වීමක්ද සිදුවිය යුතුය.

## බස් ප්‍රවාහනය

1996 වර්ෂය අවසාන වන විට, ජනතාසන්තක බස් සමාගම් 93 ට බස්රථ 8,845 ක් හිමිවිය. කෙසේ වෙතත්, දිනකට ධාවනය වූ සාමාන්‍ය බස්රථ සංඛ්‍යාව 4,710 ක් (හෙවත් සියයට 53 ක්) වූ අතර එය සතුටුදායක බස් සේවාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය බස්රථ සංඛ්‍යාව වන ආසන්න වශයෙන් බස්රථ 6,200 ට වඩා සැලකිය යුතු තරමින් අඩු සංඛ්‍යාවකි. 1995 වර්ෂයේදී අළුතින් එකතු කරන ලද බස්රථ 1200 සමග සැසැඳීමේදී, ජනතා සන්තක බස් සමාගම් විසින් 1996 වර්ෂයේදී සිය බස් රථ ඇනියට එකතු කරන ලද නව බස්රථ සංඛ්‍යාව 460 ක් පමණක් විය. ධාවනයට යොදවන ලද බස්රථ සංඛ්‍යාව අඩුවීම සහ වෙනත් කළමනාකරණ හා සංවිධාන ව්‍යුහයේ පවත්නා අඩුපාඩු වලත් ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන් 1996 වර්ෂයේ ජනතාසන්තක බස් සමාගම්වල ක්‍රියාකාරීත්වය අසතුටුදායක මට්ටමක පැවැතුණි. මෙම සමාගම්වල ධාවන කිලෝමීටර් ප්‍රමාණය, 1995 දී වාර්තාගත වූ සියයට 15 ක වර්ධනයට ප්‍රතිවිරුද්ධව 1996 දී කිලෝ මීටර් 349 දක්වා ආන්තික වශයෙන් පහත වැටුනි. මීට සමාන ප්‍රවනතාවයක් පෙන්නුම් කරමින්, මගී කිලෝමීටර් ප්‍රමාණය, 1995 දී වැඩිවූ සියයට 24 සමග සැසඳීමේදී 1996 දී වැඩිවුයේ සියයට 5 කින් පමණි. ආසන්න වශයෙන් සියයට 15 කින් බස් ගාස්තු වැඩිකර තිබියදී ද, ජනතා සන්තක බස් සමාගම්වල ආදායම වැඩිවූයේ සියයට 11 කින් පමණි. 1995 දී මෙම සමාගම්වල ආදායම සියයට 21 කින් වැඩිවිය. මේ අතර, ප්‍රධාන වශයෙන් ජනතාසන්තක බස් සමාගම් වල ඉහළ මෙහෙයුම් පිරිවැය 1995 දී රුපියල් දශ ලක්ෂ 5,300 සිට 1996 දී රුපියල් දශලක්ෂ 6,000 දක්වා තියුණු ලෙස වැඩිවිය. මීට ප්‍රධාන වශයෙන් ඉහළ මට්ටමක වූ නඩත්තු පිරිවැය බලපෑවේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජනතාසන්තක සමාගම්වල මෙහෙයුම් අලාභය 1995 දී රුපියල් දශ ලක්ෂ 635 සිට 1996 දී රුපියල් දශ ලක්ෂ 783 දක්වා ඉහළ ගියේය. ජනතාසන්තක බස් සමාගම් ග්‍රාමීය ප්‍රදේශවල අලාභදායක මාර්ගවල බස් ධාවනය කිරීම වෙනුවෙන් සහ පාසැල් ළමුන් සඳහා සහනදායී මිලකට බස් වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 360 ක මුදලක් රජයෙන් ලැබුනි.

මගී ප්‍රවාහන සේවාව හා සම්බන්ධ නියාමක ආයතනය වන ජාතික ප්‍රවාහන කොමිෂම (ජා.ප්‍ර.කො) ප්‍රවාහන පද්ධතිය පුළුල් කිරීමේ සහ ශක්තිමත් කිරීමේ අරමුනින් යුක්තව ව්‍යාපෘති කීපයක් මෙහෙයවනු ලැබිය. ජනතා සන්තක බස් සමාගම් සහ පෞද්ගලික බස් ධාවකයන් අතර බස් සේවාවන් සම්බන්ධීකරණය කිරීමේ කටයුතු ජා.ප්‍ර.කො. විසින් නොකඩවා කරගෙන යන ලදී. විමර්ශණය කෙරෙන වර්ෂය තුලදී බස්නාහිර පලාතේ බස් සේවා 55 ක් ද, වයඹ පලාතේ බස් සේවා 12 ක්ද, සබරගමුව පලාතේ බස් සේවා 45 ක්ද, සම්බන්ධීකරණය කරන ලදී. බස්සේවා සම්බන්ධීකරණය කිරීම ඵලදායිතාවය ඉහළ නැංවීමට හේතුවන අතර, අධික ලෙස මගීන් පැටවීමද අධික වේගයෙන් ධාවනය කිරීම මෙන්ම බස් නැවතුම්පොලවල දිගු කාලයක් බස් නවතාගෙන සිටීමද වලකාලයි. මීටි වහළ සහිත බස්රථ ධාවනය ක්‍රමයෙන් ඉවත් කිරීමේ කාර්යයද ජා.ප්‍ර.කො. අඛන්ඩව කරගෙන ගියේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1996 වර්ෂය අවසානය වන විට මීටි වහළ සහිත බස්රථ, දුරගමන්සේවා වලින් සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදී. මගීන්ගේ සුවපහසුව සඳහා දැනට විශේෂයෙන්ම නගරාන්තර අධි සුඛෝපභෝගී බස් රථවල දක්නට ලැබෙන හැකිලිය හැකි මැද ආසන (Jump Seats) ඉවත් කිරීමටද යෝජනා ඉදිරිපත්ව ඇත. මීට අමතරව, පෞද්ගලික බස්රථ හිමියන් සහ සේවකයන් පුහුණුකිරීමේ වැඩසටහන් පැවැත්වීමට තවදුරටත් දායක විය.

ගමනාගමනය සඳහා මුදුන් පැය වලදී පවතින අධික ඉල්ලුම පසුරාලීම සඳහා සහ කායසීල සේවකයන් සඳහා සුවපහසු ගමනාගමන පහසුකම් සැපයීමේ අපේක්ෂාවෙන් තදාසන්න නාගරික මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් අර්ධ සුඛෝපභෝගී සීමිත නැවතුම් බස් සේවයක් 1996 සැප්තැම්බර් මාසයේ දී හඳුන්වා දෙනු ලැබීය. 1996 වර්ෂය අවසානය වන විට මෙවැනි බස් රථ 200 ක් පමණ ධාවනයේ යොදවා තිබුණි. අධි සුඛෝපභෝගී බස් රථයක ගමන්කිරීම සඳහා අයකරන ගාස්තුව සාමාන්‍ය බස් ගාස්තුව මෙන් දෙගුණයකි. ඉහළ ගාස්තුවක් යටතේ පවා අර්ධ සුඛෝපභෝගී බස් සේවය සඳහා පැවති දිරිගන්වන සුළු ඉල්ලුම මගීන් පහසුකම් සහිත සහ විශ්වාසදායී බස් සේවයක් සඳහා ඉහළ ගාස්තුවක් ගෙවීමට බස් මගීන් ගෙන් කොටසක් සූදානම් බව විදහා දක්වයි.

පෞද්ගලික අංශය විසින්ද අධි - සුඛෝපභෝගී බස්රථ විශාල සංඛ්‍යාවක් විමසුමට ලක් කෙරෙන වර්ෂය තුළදී ධාවනයට යොදවන ලදී. ජා.ප්‍ර.කො. අන්තර් පළාත් අර්ධ සුඛෝපභෝගී මාර්ග බලපත් 17 ක්ද, අති සුඛෝපභෝගී මාර්ග බලපත් 2 ක් ද 1996 වර්ෂය තුලදී නිකුත් කරන ලදී. සුඛෝපභෝගී බස්රථ ධාවනය සඳහා නිකුත්කරන ලද මාර්ග බලපත් සංඛ්‍යාව 1996 දී 635 දක්වා, 106 කින් වැඩිවිය. කෙසේ වෙතත්, අන්තර් පළාත් සාමාන්‍ය බස් සේවා සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 1996 දී 1,532 දක්වා සියයට 16 කින් අඩු විය. එමෙන්ම, උතුරු - නැගෙනහිර පළාත් හැර, අනෙකුත් සියළු පළාත් සභා විසින් නිකුත් කරන ලද මාර්ග බලපත් සංඛ්‍යාවද 1996 දී 8,459 දක්වා සියයට 6 කින් අඩුවිය. සැලකිය යුතු ප්‍රමාණයකින් මෙම බලපත් නිකුත් කිරීම අඩුවූයේ බස්නාහිර (518) උතුරු මැද (65) සහ දකුණ (56) යන පළාත් සභා ප්‍රදේශවලය. මේ අතර, ජනතාසන්තක සහ පෞද්ගලික බස්රථ ධාවකයන් විසින් මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේ අළුතින් ලියාපදිංචි කරන ලද මගී ප්‍රවාහන බස්රථ සංඛ්‍යාව 1,364 දක්වා සියයට 17 කින් අඩු විය.

පෞද්ගලික බස් මගී ප්‍රවාහන සේවයේ අසතුටුදායක ක්‍රියාකාරිත්වයට තරමක් දුරට හේතු වුයේ, පිරිවැය සහ ආරම්භක ආයෝජනයට සාපේක්ෂව ප්‍රමාණවත් ඵලදාවක් නොලැබෙන හෙයින් බස්රථ ධාවනයට යෙදවීම ආකර්ශනීය ආයෝජනයක් නොවන බැවිනි. මෙම තත්ත්වයට මුහුණ දෙනු පිණිස 1996 වර්ෂයේ දී බස් ගාස්තු සියයට 15 කින් පමණ වැඩි කිරීමට අමතරව ප්‍රවාහන අමතරකොටස්වල පිරිවැටුම් බදු නිෂ්පාදන බදු සහ තීරු බදු තවදුරටත් අඩු කරන ලදී. බස් සේවයේ පවත්නා මෙම අසතුටුදායක තත්ත්වය මගහැරවීම පිණිස පෞද්ගලික අංශය සඳහා බස් රථ ආනයනය කිරීමට, ඇ. එ. ජ. ඩොලර් දශ ලක්ෂ 30 ක වටිනාකමින් යුතු ඉන්දියානු ණය මුදලක් ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය.

## දුම්රිය ප්‍රවාහනය

විමර්ශනය කෙරෙන වර්ෂය තුළදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරිත්වයෙහි ප්‍රගතියක් දක්නට නොලැබුනි. 1996 දී දුම්රිය ධාවන කිලෝමීටර් ප්‍රමාණය දශ ලක්ෂ 7.4 දක්වා සියයට 6 කින් පහත වැටුනි. දුම්රිය මගී කිලෝමීටර් ප්‍රමාණය 1994 දී වැඩිවූ සියයට 14 සහ 1995 දී වැඩිවූ සියයට 6 සමග සැසඳීමේදී 1996 දී වැඩිවූයේ සියයට 8 කිනි. 1993 සිට අඩුවන ප්‍රවනතාවයක් පෙන්නුම් කරන දුම්රිය භාණ්ඩ ටොන් කිලෝමීටර් ප්‍රමාණය 1996 දී තවදුරටත් සියයට 9 කින් අඩුවී ටොන් කිලෝමීටර් දශ ලක්ෂ 124 ක් විය.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අසතුටුදායක ක්‍රියාකාරිත්වයට හේතුවී ඇත්තේ පසුගිය වර්ෂවල ප්‍රාග්ධන යෙදවුම් ප්‍රමාණවත් පරිදි සිදු නොකිරීමත් වාණිජ්‍ය මුලධර්මයන් අනුගමනය නොකිරීමත්ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දුම්රිය ධාවන උපකරණ වල තත්ත්වය සීග්‍රයෙන් පිරිහුණ අතර, දුම්රිය යටිතල ව්‍යුහය වැඩිදියුණු කිරීම වසර ගණනාවක් තිස්සේ නොසලකා හැර ඇත. ධාවනයට යෙදවිය හැකි දුම්රිය යන්ත්‍ර සංඛ්‍යාව 1995 දී 84 සිට 1996 දී 76 දක්වා අඩුවූ අතර එය නිරන්තර දුම්රිය අවලංගු කිරීම් වලට හේතු විය. වර්ෂය තුලදී ශ්‍රී ලංකා දුම්රිය සේවයට අයත් දුම්රිය මැදිරි සහ භාණ්ඩ ප්‍රවාහන ගැල් සංඛ්‍යාවේ වෙනසක් සිදු නොවිනි. දුම්රිය මාර්ග නඩත්තු කිරීම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත් තරමින් නොලැබීම නිසා දුම්රිය පීලි පැනීම, දුම්රිය මාර්ග විසන්ධි වීම සහ දුම්රිය වේග සීමා පැණවීම ආදිය හේතුවූ අතර එය දුම්රිය සේවයේ පිරිහීමටද බලපෑවේය. වසර 34 ක් පැරණි මධ්‍යගත දුම්රිය පාලන පද්ධතියේ නිතර සිදුවන ක්‍රියාවිරහිත වීම්ද සාමාන්‍ය දුම්රිය සේවා ප්‍රමාදයන්ට හේතු විය. එමෙන්ම ඉතා පැරනි සන්නිවේදන පද්ධතියේ සිදුවන නිරන්තර ඇණහිටීම් ද ශ්‍රී ලංකා දුම්රිය සේවයේ පණිවුඩ හුවමාරු වලට මෙන්ම එදිනෙදා ධාවන කටයුතු වලටද බාධා පැමිණවිය. අනෙක් අතට පසුගිය වර්ෂ වලදී මෙන්ම තලෙයිමන්නාරම මාර්ගයේද, උතුරු මාර්ගයේ තාන්ඩිකුලම් වලින් ඔබ්බටද දුම්රිය සේවා නොපැවැත්විය.

දුම්රිය සේවය තවදුරටත් පිරිහීම වලක්වාගනු වස් දුම්රිය ප්‍රවාහන යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණය වැඩි කිරීමටත් දුම්රිය යටිතල පහසුකම් පුළුල් කිරීමටත් ව්‍යාපෘති කීපයක් ආරම්භ කරන ලදී. ජපානයේ විදේශ ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර ඇතිව රුපියල් දශලක්ෂ 805 ක පිරිවැයකින් W1 වර්ගයේ දුම්රිය එන්ජින් 10 ක් නැවත අළුත්වැඩියා කිරීමේ කටයුතු කෙරෙමින් පැවතිනි. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රථම දුම්රිය එන්ජිම 1997 අප්‍රේල් මාසයේදී ධාවනය සඳහා මුදාහැරීමට නියමිතය. රුපියල් දශලක්ෂ 400 ක වියදමින් M5 වර්ගයේ තවත් දුම්රිය එන්ජින් 4 ක් අළුත්වැඩියා

කිරීමේ කටයුතු ආරම්භ කොට තිබිණි. 1996 වර්ෂය තුලදී, ඉන්දියානු ණය මුදලක් යටතේ දුම්රිය එන්ජින් දෙකක් මිළට ගෙන ධාවනයට යොදවනු ලැබූ අතර, 1997 වර්ෂයේදී එම ණය වැඩපිළිවෙල යටතේම තවත් දුම්රිය එන්ජින් 4 ක් මිළට ගැනීමට නියමිතය. දුම්රිය යටිතල ව්‍යුහය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන ව්‍යාපෘති 3 ක් ආරම්භ කොට තිබුණි. ජපානයේ විදේශ සහයෝගිතා අරමුදලේ ආධාර ඇතිව, රුපියල් දශලක්ෂ 1,700 ක වියදමින් කිලෝමීටර් 292 ක් ආවරණය වන ගාල්ල/ මහනුවර සහ රාගම/ මීගමුව දුම්රිය මාර්ග කොටස් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන 1996 වර්ෂයේදී ක්‍රියාත්මක වෙමින් පැවැතුනි. රුපියල් දශලක්ෂ 1,180 ක් වැය වන බලවේග කට්ටල අළුත් වැඩියා කිරීමේ නව වැඩ පොලක් ජපානයේ විදේශ සහයෝගිතා අරමුදලේ ආධාර යටතේ රත්මලාන ප්‍රදේශයේ ඉදිවෙමින් පවතී. මේ අතර, ජර්මන් ආධාර යටතේ, රුපියල් දශ ලක්ෂ 500 ක වියදමකින් කළුතර සහ පානදුර දුම්රිය පාළම් දෙකක් නැවත ඉදිකිරීමේ කටයුතු කෙරෙමින් පැවතුනි. මීට අමතරව, කැළණිවැලි දුම්රිය මාර්ගය පුළුල් කිරීමේ වැඩකටයුතු කොස්ගම දක්වා අවසන් කොට තිබු අතර, අවිස්සාවේල්ල දක්වා පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කොට තිබුනි.

1996 මාර්තු මාසයේ සිට දුම්රිය මගී ගාස්තු සියයට 20 කින් වැඩිකර තිබියදීත්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මූල්‍යමය තත්ත්වයේ සැළකියයුතු ප්‍රගතියක් දක්නට නොලැබුණි. 1996 දී මගී ගාස්තුවලින් ලද ආදායම වැඩි වුයේ සියයට 4 කින් පමණක් වන අතර, භාණ්ඩ ප්‍රවාහනයෙන් ලද ආදායම සියයට 8 කින් පහත වැටුණි. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සමස්ත ආදායම 1996 දී සියයට 3 කින් පහත වැටුණු අතර, ඊට දුම්රිය ධාවන පරිමාවේ අඩුවීමත් භාණ්ඩ ප්‍රවාහනයේ පහත වැටීමත් හේතු විය. මේ අතර, දුම්රිය සේවයේ වර්තන පිරිවැය රුපියල් දශලක්ෂ 1,842 දක්වා සියයට 6 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1996 දී දුම්රිය සේවයේ මෙහෙයුම් අලාභය රුපියල් දශලක්ෂ 924 දක්වා සියයට 17 කින් වැඩිවිය. රුපියල් දශ ලක්ෂ 3,640 ක් වන ප්‍රාග්ධන පිරිවැයද සැලකිල්ලට ගත් විට ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සමස්ත අලාභය රුපියල් දශලක්ෂ 4,564 ක් වු අතර එය රාජ්‍ය අය - වැය කටයුතු වලට විශාල බරක් ඇතිකලේය.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දිගින් දිගටම පවත්නා විශාල මට්ටමක මෙහෙයුම් අලාභය පිළිබඳව සැලකීමේ දී, දුම්රිය ක්‍රියාකාරිත්වයෙහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම උග්‍ර අවශ්‍යතාවයක්ව පවතී. තදාසන්න ප්‍රදේශවල මගී ප්‍රවාහනය පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම, පෞද්ගලික අංශයන්ටද අවකාශ සැලසෙන පරිදි භාණ්ඩ ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම සහ ගාස්තු ක්‍රමය හා මගී සහනාධාර සැකසීමේ ක්‍රම විධිමත් කිරීම මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුනු කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිපත්ති වනු ඇත.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ පවත්නා අඩුපාඩු සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුවක රාමුව තුළ විසඳුම් සෙවීමට අපහසු බව අවබෝධ වී ඇත. එම නිසා, වානිජමය ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට වඩා නම්‍යශීලීතාවයකින් යුක්ත දුම්රිය අධිකාරියක් පිහිටුවීමට යෝජනා ඉදිරිපත්ව ඇත. මේ අතර, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය, ගිණුම් කටයුතු හා මිළට ගැනීම් සහ ද්‍රව්‍ය කළමනාකරණය යන අංශ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පැවතුනි. මීට අමතරව, ලෝක බැංකුවේ සහයෝගය සහිතව, දුම්රිය දේපල අංශයේ පරිපාලනය සහ මුල්‍ය පාලනය වැඩිදියුණු කිරීමේ සහ දුම්රිය සේවය සතු ඉඩම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

## වරාය සේවා

1996 දී කොළඹ වරාය ක්‍රියාකාරිත්වයෙහි විශිෂ්ඨ ප්‍රගතියක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හසුරුවන ලද භාණ්ඩ ප්‍රමාණය 1995 දී වැඩි වූ සියයට 8 සමග සැසඳීමේදී 1996 දී සියයට 20 කින් වර්ධනය විය. බහාලුම් හැසිරවීමෙහි සියයට 29 ක පෙර නොවූ විරූ මට්ටමේ වැඩිවීමක් පෙන්නුම් කළ අතර එය කලාපයේ තරඟකාරී වෙනත් වරායයන් වල වර්ධන අනුපාතිකයන් ඉක්මවා ගිය වර්ධන අනුපාතිකයක් විය. එමෙන්ම 1996 දී ප්‍රතිනැව්ගත කිරීම්ද, අඩි විස්සට සමාන බහාලුම් ඒකක (ටී.ඊ.යු) 979,882 දක්වා සියයට 40 ක කැපී පෙනෙන වේගයකින් වර්ධනය විය. හැසිරවූ සමස්ත බහාලුම් ප්‍රමාණයෙන්, ප්‍රතිනැව්ගත කිරීමේ සමානුපාතය 1995 දී 67 සිට 1996 දී 72 දක්වා වැඩි විය. මේ අතර, 1996 දී කොළඹ වරායට සේන්දු වූ නැව් සංඛ්‍යාව 3,467 ක් දක්වා සියයට 6 කින් වැඩි විය. කෙසේවෙතත්, ගාල්ල සහ ත්‍රිකුණාමලය වරායවල ක්‍රියාකාරිත්වයෙහි සැලකිය යුතු ප්‍රගතියක් දක්නට නොලැබුණි.

කොළඹ වරායේදී හැසිරවූ භාණ්ඩ ප්‍රමාණයෙහි සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණද, වරායේ ඵලදායිතා දර්ශක මගින් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. පැයකට ගැන්ට්‍රි දොඹකරයක දළ මෙහෙයුම් ප්‍රමාණයේ සහ ශුද්ධ මෙහෙයුම් ප්‍රමාණයේ සාමාන්‍යය පිළිවෙලින් 13 දක්වා සහ 14 දක්වා පසුගිය වර්ෂයට වඩා එක ඒකකය බැගින් අඩු විය. කෙසේවෙතත්, නැංගුරම්පොළ ක්‍රියාකාරීත්වය විමර්ශණය කෙරෙන වර්ෂය තුළදී ආන්තික වශයෙන් වැඩි දියුණු විය. එක් නැවක් සඳහා නැංගුරම්ලෑමේ සාමාන්‍ය ප්‍රමාදය පැය 41.5 සිට පැය 35.8 දක්වා ද, එක් නැවක් නැංගුරම්පලක රැඳී සිටීමේ සාමාන්‍ය කාලය පැය 159.6 සිට 148.7 දක්වා ද අඩු විය. නැවක් වරායෙහි සාමාන්‍යයෙන් රැඳී සිටින කාලය පැය 16 කින් අඩුවූ අතර නැවක් ආපසු යාමට ගමන් ආරම්භ කිරීමේ ප්‍රමාදය 1995 දී පැය 6.9 සිට 1996 දී පැය 7.4 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

රජයේ දිගු කාලීන අරමුණ වන්නේ, කොළඹ වරාය, කළාපයේ කේන්ද්‍රිය වරායක් ලෙස සංවර්ධනය කිරීමත්, කොළඹ වරායේ පවතින තදබදය අඩු කර ගැනීමට සහ කළාපයේ නාවික පහසුකම් සඳහා වේගයෙන් වර්ධනය වන ඉල්ලුමෙන් කොටසක් ආකර්ශනය කර ගැනීම සඳහා ගාල්ල වරාය අතිරේක වරායක් ලෙස පුළුල් කිරීමත්ය. මෙම අරමුණු සාක්ෂාත් කරගනු පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය 1996 දී සංවර්ධන ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව කරගෙන ගියේය. ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර ඇතිව රුපියල් දශ ලක්ෂ 2,215 ක වියදමින් ඛණිජ තෙල් පර්යන්තයක් ඉදි කරන ලදී. මෙම නව පහසුකම මගින් ද්‍රව භාණ්ඩ හැසිරවීම කාර්යක්ෂම කෙරෙන අතර, කොළඹ වරාය පරිශ්‍රයේ ඉඩම් භාවිතය බොහෝ දුරට වැඩිදියුණු කෙරේ. ජය බහාලුම් පර්යන්තයේ 4 වන අදියරේ ඉදිකිරීම් කටයුතු 1996 වර්ෂයේදී අවසන් කරන ලදී. මේ අතර, ප්‍රධාන පිවිසුම් මාර්ගය මීටර් 15.5 දක්වා ගැඹුරු කිරීම සහ පිවිසුම් මාර්ගය සළකුණු කිරීමේ කටයුතු වර්ෂය තුළදී නිම කරන ලදී. මේ හැර කොළඹ වරායේ සමහර පහසුකම් "ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අත්පත්කර ගැනීම/ ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම" (BOO/BOT) පදනම යටතේ සංවර්ධනය කිරීම සඳහා ඉදිරිපත්ව ඇති යෝජනා අධ්‍යයනය කෙරෙමින් පවතී. එමෙන්ම, ගාල්ල වරාය ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ 350 ක වියදමකින් "ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම හා පැවරීම" (BOT) පදනම යටතේ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියද නුදුරු අනාගතයේදී ආරම්භ කිරීම

**සංඛ්‍යා සටහන 5.7**
**වරාය සේවා ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 1994 | 1995 | 1996 (අ) | ප්‍රතිශත වෙනස 1995 | ප්‍රතිශත වෙනස 1996 |
|---|---|---|---|---|---|
| 1. පැමිණි නැව් සංඛ්‍යාව | 4,294 | 3,612 | 3,857 | -16 | 7 |
| කොළඹ | 3,790 | 3,277 | 3,467 | -14 | 6 |
| ගාල්ල | 223 | 69 | 84 | -69 | 22 |
| ත්‍රිකුණාමලය | 281 | 266 | 306 | -5 | 15 |
| 2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ. ටො. '000) | 18,097 | 19,517 | 22,722 | 8 | 16 |
| කොළඹ | 16,143 | 17,414 | 20,885 | 8 | 20 |
| ගාල්ල | 303 | 237 | 236 | -22 | ... |
| ත්‍රිකුණාමලය | 1,651 | 1,866 | 1,601 | 13 | -14 |
| 3. බහාලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ) | 973 | 1,049 | 1,356 | 8 | 29 |
| කොළඹ | 973 | 1,049 | 1,356 | 8 | 29 |
| 4. අන්තර් නැව් බහාලු ප්‍රමාණය (TEUs '000) (ආ) | 666 | 700 | 980 | 5 | 40 |
| කොළඹ | 666 | 700 | 980 | 5 | 40 |
| 5. ආදායම (රු. දශ ලක්ෂ) | 5,197 | 4,820 | 8,547 | -7 | 77 |
| කොළඹ | 4,964 | 4,582 | 8,319 | -8 | 82 |
| ගාල්ල | 90 | 75 | 79 | -17 | 5 |
| ත්‍රිකුණාමලය | 143 | 163 | 149 | 14 | -9 |
| 6. වියදම (රු. දශ ලක්ෂ) | 4,670 | 5,461 | 6,148 | 17 | 13 |
| කොළඹ | 4,394 | 5,129 | 5,814 | 17 | 13 |
| ගාල්ල | 107 | 128 | 136 | 20 | 6 |
| ත්‍රිකුණාමලය | 169 | 204 | 198 | 21 | -3 |
| 7. ශුද්ධ ලාභය - බදු ගෙවීමට පෙර (රු. දශ ලක්ෂ) | 527 | 1,360 | 2,386 | 158 | 75 |
| කොළඹ | 569 | 1,453 | 2,505 | 155 | 72 |
| ගාල්ල | -17 | -53 | -61 | 212 | 15 |
| ත්‍රිකුණාමලය | -25 | -40 | -58 | 60 | 45 |
| 8. සේවක සංඛ්‍යාව | 16,910 | 16,492 | 17,436 | -2 | 6 |
| කොළඹ | 15,409 | 14,851 | 15,575 | -4 | 5 |
| ගාල්ල | 634 | 779 | 804 | 23 | 3 |
| ත්‍රිකුණාමලය | 867 | 862 | 1,057 | -1 | 23 |
| 9. ඵලදායිතා දර්ශක | | | | | |
| පැයකට ක්‍රේන්ට් දොඹකර මෙහෙයුම් වාරගණන (දළ) | 13 | 14 | 13 | 8 | -7 |
| පැයකට ක්‍රේන්ට් දොඹකර මෙහෙයුම් වාර ගණන (ශුද්ධ) | 14 | 15 | 13 | 7 | -13 |
| වරාය තුළට ඇතුල්වීමේ සාමාන්‍ය ප්‍රමාදය (පැය) | 54 | 42 | 36 | -24 | -14 |
| වරාය තුළ සාමාන්‍ය ප්‍රමාදය (පැය) | ලනො. | 160 | 149 | - | -7 |
| වරාය තුළ රැඳී සිටීමේ සාමාන්‍ය කාලය (පැය) | 197 | 201 | 185 | 2 | -8 |
| නැව් පිටත්වීමේ සාමාන්‍ය ප්‍රමාදය (පැය) | 4.5 | 6.9 | 7.4 | 53 | 7 |

(අ) තාවකාලික
TEUs : අඩි 20 ට සමාන බහාලුම් ඒකක
(ආ) බහාලු හසුරුවනු ලබන්නේ කොළඹ වරායේ පමණි.

මූලය : ශ්‍රී ලංකා වරාය අධිකාරිය

අපේක්ෂිතය. 1996 වර්ෂයේදී යුරෝ - චයිනා කොන්සෙව්ටියම් නම් සමාගමක් විසින් ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අවසාන ශක්‍යතා අධ්‍යයනවල නිරතව සිටියේය. කෙසේ වෙතත් කොළඹ වරාය කලාපයේ කේන්ද්‍රීය වරායක් තත්ත්වයට දියුණු කිරීමේ අභිලාෂය මුදුන් පමුනුවා ගැනීමට නම් වරාය ධාරිතාවය පුළුල් කිරීම පමණක් නොව, එහි තරගකාරිත්වය ඉහළ නංවා ගැනීම, ඵලදායීතාවය, කාර්යක්ෂමතාවය සහ විශ්වාසනීයත්වය ද වැඩිදියුණු කර ගැනීම අවශ්‍යය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු ආදායම 1996 දී සියයට 77 ක සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ අතර, රට ප්‍රධාන වශයෙන් මෑතකදී වරාය ගාස්තු ඉහළ දැමීම හේතුවිය. සමස්ත ආදායමෙන් සියයට 97 ක් කොළඹ වරායේ මෙහෙයුම් වලින් ඉපයුනි. රුපියල් දශලක්ෂ 6,148 ක් වූ මුළු පිරිවැය සියයට 13 ක වැඩි වීමක් වාර්තා කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1996 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බදු ගෙවූ පසු ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 1,369 දක්වා සියයට 89 කින් වැඩි විය. මෙම ලාභය මුළුමනින්ම ජනනය කරන ලද්දේ කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු වලිනි.

## 5.7 වාරිමාර්ග සහ ජනාවාස

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සපයන ලද ඇස්තමේන්තුවලට අනුව, විශාලතම වාරිමාර්ග හා ජනාවාස යෝජනා ක්‍රමය වන මහවැලි ව්‍යාපාරය යටතේ 1996 වර්ෂයේ කරන ලද මුළු වියදම රුපියල් දශලක්ෂ 1,112 ක් විය. මෙම ව්‍යාපාරයේ වැඩ නිම වීමට ආසන්න වී ඇති හෙයින්, වර්ෂය තුළ කරන ලද මුළු වියදමින් සියයට 75 ක් පමණ කලාප සංවර්ධන කටයුතු සඳහා වියදම් කරන ලදී. ඒ අනුව "බී" කලාපයට රුපියල් දශලක්ෂ 384 ක්, "සී" කලාපයට රුපියල් දශ ලක්ෂ 247 ක්, "එච්" කලාපයට රුපියල් දශලක්ෂ 116 ක් සහ "එල්" කලාපයට රුපියල් දශලක්ෂ 93 ක් ද වියදම් කර ඇත. 1996 වගා වර්ෂයේ දී මහවැලි බල ප්‍රදේශය තුළ වගාකරන ලද මුළු බිම් ප්‍රමාණය සියයට 13 කින් පහත වැටී, හෙක්ටයාර 119,100 ක් වූ අතර, 1996 යල කන්නයේ වගාකරන ලද බිම් ප්‍රමාණය සියයට 28 කින් පහත වැටීම මෙයට හේතු විය. 1995/96 වර්ෂයේ ඊසාන දිග මෝසම් වර්ෂාව ප්‍රමාදවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1995/96 මහ කන්නයේ මහවැලි බල ප්‍රදේශය තුළ වී හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කටයුතු සඳහා වැව් ජලය මුදාහැරීමට සිදුවිය. එහෙත් මෙම ප්‍රදේශවල අනිකුත් මහ කන්න වල දී වගා කටයුතු සාමාන්‍යයෙන් කරනු ලබන්නේ වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ වේ. මේ හේතුවෙන් 1996 යල කන්නයේදී වාරිමාර්ග යටතේ වගා කිරීමට ජලාශවල ජලය ප්‍රමාණවත් නොවිය. නිරිත දිග මෝසම් වැසි පමාව තවදුරටත් මෙම තත්ත්වය උග්‍රකිරීමට හේතුවිය. කන්න දෙකෙහි දීම වගාකරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 102,440 ක් වී වගාව යටතේ වූ අතර, හෙක්ටයාර 16,660 ක අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාකර තිබුණි. (සංඛ්‍යා සටහන 32)

මහවැලි සංවර්ධන යෝජන ක්‍රමය යටතේ වන යෝජනා ක්‍රම හැර අනිකුත් සියළුම ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම (හෙක්ටයාර 81 ට වැඩි හෝ අක්කර 200 ට වැඩි) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතී. කුඩා වාරිමාර්ග යෝජනා ක්‍රම හා ප්‍රාදේශීය වාරිමාර්ග යෝජනා ක්‍රම නිල වශයෙන් ඒ ඒ පළාත් සභාවේ පාලනය යටතේ පවතී. එසේ වුවත් එම ව්‍යාපාරයන්හි කටයුතු කරගෙන යනු ලබන්නේ විදේශාධාර යටතේ නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වගකීම යටතට ගැනේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට අනුව, විදේශාධාර යටතේ ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති තුනක වැඩකටයුතු 1996 වර්ෂයේ දී ද තවදුරටත් සිදු කෙරුණි. එනම් මිනිපේ-නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය, වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය සහ ජාතික වාරිමාර්ග ව්‍යාපෘතිය වේ. 1996 වර්ෂයේ දී මෙම ව්‍යාපෘති සඳහා කරන ලද මුළු වියදම රුපියල් දශලක්ෂ 1,168 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

හෙක්ටයාර 7,800 ක බල ප්‍රදේශයක් ඇති මිනිපේ-නාගදීප පුනරුත්ථාපන ව්‍යාපෘතියේ වැඩකටයුතු වලින් සියයට 70 කට වඩා වැඩි ප්‍රමාණයක් නිම කර තිබූ අතර, මේ යටතේ වාරිමාර්ග කටයුතු සඳහා 1996 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 135 ක් වියදම් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ 1996 වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රදේශයක් සමග මහවැලි "සී" කලාපය යා කරමින් මහවැලි ගඟ හරහා පාලමක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර, එම කටයුතුවල සීඝ්‍ර ප්‍රගතියක් අත්කරගන්නා ලදී. මෙම මහවැලි පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් දශලක්ෂ 1,300 ක් පමණ වේ. වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය යුරෝපා ප්‍රජාවගේ ආධාර ලබන අතර. එමගින් වයඹපළාතේ මධ්‍යම හා සුළු පරිමාණ වාරිමාර්ග ජලසම්පාදන යෝජනා ක්‍රම 10 ක් පුනරුත්ථාපනය කිරීම අපේක්ෂා කෙරේ. එමගින් හෙක්ටයාර 1,100ක වී වගා කිරීමටද, හෙක්ටයාර් 1,120 ක අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාකිරීමට ද, පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. මේ මගින් මෙම ව්‍යාපෘතිය යටතේ තඹබෝව වැවට ප්‍රමාණවත් පරිදි ජලය සැපයීමට ද, ව්‍යාපෘතියට අයත් ප්‍රදේශවල ගොවි පවුල් පදිංචි කිරීමට ද අපේක්ෂිතයි. මේ සඳහා රුපියල් දශලක්ෂ 48 ක් වියදම් කර ඇතැයි ඇස්තමේන්තුකර ඇත. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ විශාල හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම 35 ක් සහ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම 1,000 ක් පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. මේ යටතේ දළ වශයෙන් හෙක්ටයාර 37,500 ක ඉඩම් වලට ප්‍රතිලාභ ලැබෙනු ඇත. 1996 වර්ෂයේ දී, විශාල හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම 8 ක සහ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම 404 ක ඉදිකිරීමේ කටයුතු මුළුමනින්ම නිම කිරීමට අපේක්ෂා කරන ලදී. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ, වර්ෂය තුළ දී රුපියල් දශලක්ෂ 562 ක් වියදම් කර ඇත.

**සංඛ්‍යා සටහන 5.8**

**තෝරාගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වූ වියදම්**

| ව්‍යාපෘතිය | ආධාර ලබාගත් මූලාශ්‍රය | මුළු විදේශ විනිමය ලැබීම් (දශ ලක්ෂ) | 1995 වියදම (රු. දශ ලක්ෂ) | 1996 (අ) වියදම (රු. දශ ලක්ෂ) | 1996 (අ) අවසානය දක්වා සමුච්චිත වියදම (රු. දශ ලක්ෂ) |
|---|---|---|---|---|---|
| 1. මිනිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | | | | | |
| (අ) මහවැලි පාලම් | ජපානය | ජපාන යෙන් 2,276 | - | 423.6 | 423.6 |
| (ආ) වාරිමාර්ග | ජපානය | ජපාන යෙන් 1,850 | 98.6 | 134.5 | 649.5 |
| 2. වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය | යුරෝපීය කොමිසම | ඊසීයු. 6.3 | 50.0 | 47.7 | 304.1 |
| 3. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | ජා.සං.ස. | රුපියල් 1,406.9 | 268.0 | 562 | 1,180 |
| | යුරෝපීය ආර්ථික ප්‍රජාව | රුපියල් 622.6 | - | - | - |

(අ) තාවකාලික

මූලය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පසුගිය වර්ෂවල දී මෙන්ම, 1996 වර්ෂයේ දී ද වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ පවුල් පදිංචි කිරීම සිදුවිය. මහවැලි වැඩපිළිවෙල යටතේ "බී" කලාපයේ පමණක් පවුල් 752 ක් (මින් පවුල් 728 ක් ගොවි පවුල් වේ) පදිංචි කරන ලදී. මහවැලි වැඩපිළිවෙළ යටතේ ගොවි පවුල් පදිංචි කිරීම, ප්‍රධාන වශයෙන්ම අයහපත් ආරක්‍ෂක තත්ත්වය නිසා, එක් කලාපයකට පමණක් සීමා විය. 1996 වර්ෂයේ දී, ඉඩම් දිගු කාලයක් පුරා වගා නොකර සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් "බී" කලාපයේ පවුල් 490 ක පදිංචි වීමේ හිමිකම් අවලංගු කරන ලදී. ආරම්භයේ පටන් මහවැලි යෝජනා ක්‍රමය යටතේ, පදිංචිකරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 1996 වර්ෂය අගවන විට පවුල් 91,522 ක් විය (සංඛ්‍යා සටහන 33). උඩවලවේ දකුණු ඉවුර හා වම් ඉවුරු ප්‍රදේශවල ගොවි නොවන පවුල් (වාණිජ මට්ටමේ ගොවීන් හා රජයේ නිලධාරීන්) 1,171 ක් පදිංචි කර ඇත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ "වප් හවුල" වැඩසටහන (වාරිමාර්ග කළමනාකරණ යෝජනා ක්‍රමය) 1996 වර්ෂයේ දී ද නොකඩවා ක්‍රියාත්මක විය. විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම ආවරණය කරනු ලබන වාරිමාර්ග, විදුලිබල සහ බලශක්ති අමාත්‍යංශයේ ඒකාබද්ධ කළමනාකරණ වැඩපිළිවෙල යටතේ ආවරණය නොකරන වාරිමාර්ග මෙම වැඩසටහන යටතේ පවතී. "වප් හවුල" වැඩසටහන මගින්,ප්‍රතිලාභ ලබන ගොවීන්ගේ සහභාගීත්වය තුලින් වාරිමාර්ග ක්‍රමවලට කාර්යක්‍ෂම, ඵලදායී හා තිරසාර කළමනාකරණයක් ලබා ගැනීම මෙන්ම, ඔවුන්ගේ ඵලදාව හා ආදායම වැඩිකිරීමට ද අරමුණු කෙරේ. "වප් හවුල" වැඩසටහන යටතේ, හෙක්ටයාර 64,000 ක බිම් ප්‍රමාණයක් ආවරණය කරමින් මධ්‍යම පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම 150 ක් පමණ ක්‍රියාත්මක වේ. ආසන්න වශයෙන් ගොවි පවුල් 71,000 ක් මෙම වැඩසටහනට සහභාගී වේ. වාරමාර්ග ක්‍රම කළමනාකරණයේ දී ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය තහවුරු කරගැනීමට ගොවි සංවිධාන 585 ක් පිහිටුවා ඇත. මෙම වැඩසටහන මගින් සිදුකරනු ලබන අනිකුත් කටයුතු වලින් සමහරක් වන්නේ, අස්වැන්න නෙළාගැනීමෙන් පසු සකස් කිරීමේ කටයුතු, අලෙවිකරණ කටයුතු, ගොවිපොළ බාහිර කටයුතු, පාරිසරිකන වැඩසටහන් හා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් වලට ආධාර කිරීම හා ඒවා වැඩිදියුණු කිරීම යනාදිය වේ. 1996 වර්ෂයේ දී, පුහුණු වැඩසටහන් 150 ක් පවත්වන ලදී. "වප් හවුල" වැඩසටහන යටතේ වන වැඩකටයුතු සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම හා මෙහෙයවීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අඩවි කාර්යාල වල වාරිමාර්ග කළමනාකරණ අනුකමිටු පිහිටුවන ලදී.

## 5.8 විශේෂ වැඩ සටහන්

### නිවාස

1996 වර්ෂයේදී නිවාස පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූයේ, විශේෂයෙන්ම නාගරික අංශයේ නිවාස සඳහා වර්ධනය වෙමින් පවතින ඉල්ලුම සපුරාලීමටත්, අඩු පහසුකම් වලින් යුතු නිවාස වල තත්ත්වය වැඩිදියුණු කිරීමටත්ය. නිවාස සංවර්ධන ක්‍රමෝපාය වූයේ පෞද්ගලික නිවාස වැඩිදියුණු කරන්නන් දිරිමත් කිරීම හා ස්වශක්තිය මත පදනම් වූ නිවාස ඉදිකිරීම සඳහා තවදුරටත් දිරිදීමයි. නිවාස සංවර්ධනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය මූලික ප්‍රවේශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. පළමු වැන්න නම් අඩු ආදායම් ලබන පවුල් සඳහා සිය හැකියාවන් පදනම් කරගෙන නව නිවාස ඉදිකිරීමට හෝ දැනට ඇති නිවාස වැඩිදියුණු කර ගැනීමට දෙනු ලබන ආධාර පුළුල් කිරීමයි. දෙවැන්න නම් මුඩුක්කු සහ පැල්පත් වැසියන් ප්‍රතිස්ථානගත කිරීම සඳහා විශේෂ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීමෙන් ඉහළ වටිනාකම් ඇති ඉඩම් වානිජමය කාර්යයන් සඳහා නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමයි. පෞද්ගලික අංශයේ නිවාස සංවර්ධන කාර්යයන් නංවාලීමේ අරමුනින් පවත්නා නිවාස ණය ක්‍රම තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිගෙන තිබෙන අතර, විවිධ නව නිවාස සංවර්ධන වැඩ සටහන් කිහිපයක් විමසුමට ලක්කරන කාලපරිච්ජේදය තුලදී හඳුන්වා දී තිබේ. නිවාස අංශ සඳහා සම්පත් සපයා ගැනීමේ අරමුණින් ප්‍රාග්ධන වෙළඳපොළේ ගණුදෙනු කිරීමට අවශ්‍ය නීතිමය බලතල සහිත ව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පූර්ණ බලතල සහිත මූල්‍ය ආයතනයක් ලෙස උසස් කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගන්නා ලදී.

1996 මැයි මස පවත්වන ලද ලෝක ජනාවාස සමුළුවේ ශ්‍රී ලංකා වාර්තාව අනුව, රටේ මුළු නිවාස සංඛ්‍යාව නිවාස ඒකක දශලක්ෂ 3.9 ලෙස ඇස්තමේන්තු කර තිබේ. 1996 වර්ෂයේදී නව නිවාස සඳහා සාමාන්‍ය වාර්ෂික ඉල්ලුම ඒකක 70,000 ක් පමණ වේ යයි ඇස්තමේන්තු ගතකර ඇති අතර නාගරික අංශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී. නව නිවාස ඉදිකිරීම්වලට අමතරව, දැනට පදිංචි නිවාස ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් අධි තාවකාලික හා හදිසියේ ගොඩ නැගූ නිවාස වලින් සමන්විත වීමෙන් පෙන්නුම් කරනු ලබන්නේ, පවත්නා නිවාස වැඩිදියුණු කිරීමට ඉහළ ප්‍රමුඛතාවයක් දීමේ වැදගත් කමයි. නාගරික අංශයේ ප්‍රතිස්ථානගත කළයුතු සහ වැඩිදියුණු කළයුතු පැල්පත් සංඛ්‍යාව 150,000 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙය යුහුසුළුව අවධානය ලක්විය යුතු කරුණකි. නිවාස අංශයේ පැන නැගී ඇති අවශ්‍යතාවයන් සාර්ථක නිවාස ණය ක්‍රමයක් ඇතිකිරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය සුලබ කිරීම සහ ඒවා සාධාරන මිළට ලබාගත හැකි වීම, පෞද්ගලික අංශයේ නිවාස තැනීම් කටයුතු වැනි පහසු කරවනු පිණිස තාක්‍ෂණික දැනුම වැඩි කිරීම වැනි කරුණු කෙරෙහි දැඩි අවධාණය යොමු කිරීමේ අවශ්‍යතාවය අවධාරනය කරයි. සීමිත අයවැය අරමුදල් යටතේ පෞද්ගලික නිවාස සංවර්ධනයන්ට දිරිදීමක් වශයෙන් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සහ යෝග්‍ය දිරිගැන්වීම් ක්‍රම අත්‍යවශ්‍ය වේ.

විමර්ශනයට ලක්වන වර්ෂය තුලදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා. නි. ස. අ.) නව නිවාස ව්‍යාපෘති දෙකක් ද ඇතුළුව රාජ්‍ය අංශයේ නිවාස සංවර්ධන වැඩ සටහන් කීපයක්ම දියත් කරන ලදී. 1996 වර්ෂයේදී ක්‍රියාත්මක වූ නිවාස වැඩ සටහන් අතර, ජන උදාන වැඩසටහන, සෙවන නිවාස ආධාර වැඩ සටහන, ග්‍රාමීය නිවාස වැඩ සටහන, නාගරික නිවාස වැඩ සටහන, වතු නිවාස වැඩ සටහන, සෘජු ඉදිකිරීම් වැඩ සටහන, මුහුදුබඩ නිවාස වැඩසටහන සහ ආපදා නිවාස වැඩසටහන ප්‍රධාන වේ.

1996 වර්ෂය තුලදී, ආරම්භ කළ නිවාය සංඛ්‍යාව සහ නිමකරන ලද නිවාස සංඛ්‍යාව අනුව රාජ්‍ය අංශයේ නිවාස සංවර්ධන වැඩ සටහන්වල ක්‍රියාකාරීත්වයේ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කලේය. රාජ්‍ය අංශයේ නිවාස වැඩ සටහන යටතේ ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව නිවාස ඒකක 34,624 දක්වා සියයට 26 කින් වැඩි වූ අතර, නිම කරන ලද නිවාස සංඛ්‍යා වසර දෙක අතර කාලපරිච්ජේදයේදී සිව් ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් නිවාස ඒකක 29,606 විය. රාජ්‍ය අංශයේ නිවාස වැඩ සටහන යටතේ ලබාදුන් මුළු ණය සහ දීමනා පෙර වර්ෂයට වඩා සියයට 55 ක වර්ධනයක් වාර්තා කලේය. සමූහ ජනාවාස පදනමක් යටතේ

වූ නිවාස වැඩ සටහන් වලට මූලික යටිතල පහසුකම් සැපයීම පහසුවන හෙයින් 1996 දී ජන උදාන, සෙවන සරණ වැනි සමූහ ජනාවාස වැඩ සටහන් වලට ප්‍රමුඛස්ථානය ලැබුනු අතර අනෙකුත් නිවාස වැඩ සටහන් සම්බන්ධව, දැනටමත් ආරම්භ කර ඇති නිවාස නිම කිරීම අරමුණ විය. 1995 වර්ෂයේදී ආරම්භ කළ ජන උදාන වැඩ සටහන එම වසර තුළදී මන්දගාමී ලෙස ක්‍රියාත්මක වුවද, ආරම්භ කළ නිවාස ඒකක (15,599) නිමකරන ලද නිවාස ඒකක (14,061) සහ මුදාහරින ලද ණය ප්‍රමාණය (රුපියල් දශලක්ෂ 230) අනුව 1996 වසරේදී කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කළේය. මෙම වැඩ සටහන යටතේ 1996 වර්ෂය අවසානය වන විට නිවාස ඒකක 15,662 ක් නිමකල අතර ජන උදාන ගම්මාන 62 ක් ජනතා අයිතියට පත්කර ඇත. එක් ඡන්ද කොට්ඨාශයකින් තෝරාගත් පවුල් 100 කට නිවාස තැනීම සඳහා ආධාර කිරීමේ අරමුණින් යුතුව 1996 වර්ෂයේදී ආරම්භ කළ සෙවන සරණ නිවාස වැඩසටහන යටතේ නිවාස ඒකක 15,572 ක් සඳහා මූල්‍ය ආධාර සපයා ඇත. ආරම්භ කළ නිවාස ඒකක වලින් නිවාස 7,315 ක් 1996 වර්ෂය තුලදී නිමකරන ලදී. රුපියල් දශලක්ෂ 78 ක මුදලක් මෙම නිවාස වැඩසටහන යටතේ මුදා හැර තිබේ. ග්‍රාමීය සහ නාගරික නිවාස වැඩසටහන් යටතේ නව නිවාස ණය සැපයීම පහත වැටීමේ උපනතියක් වාර්තා කළද, පසුගිය වර්ෂය හා සලකා බල විට නිමකරන ලද නිවාස ඒකක සංඛ්‍යාව අනුව සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි. ග්‍රාමීය සහ නාගරික නිවාස වැඩ සටහන් යටතේ 1996 වර්ෂයේදී මුදාහරින ලද ණය සහ දීමනා වල වටිනාකම රුපියල් දශලක්ෂ 63 ක් විය. මීට සමාන උපනතියක් පිළිබිඹු කරමින් 1995 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 144 වියදමින් සෘජු ඉදිකිරීම් වැඩසටහන යටතේ නිමකළ නිවාස 275 හා සසඳන කළ පහළ සහ මධ්‍යම මට්ටමේ ආදායම් ලබන පවුල් සඳහා රුපියල් දශලක්ෂ 133 වියදමකින් නාගරික ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද මහල් නිවාස ඒකක සංඛ්‍යාව 459 කි. වතු නිවාස වැඩ සටහන යටතේ 1995 දී ආරම්භ කළ නිවාස ඒකක නිම කිරීම සඳහා සැලකිය යුතු අවධානයක් යොමු කරන ලදී. මේ හේතුවෙන් 1995 වර්ෂයේ නිමකරන ලද නිවාස 48 සහ සසඳන කල ඉදි කිරීම් කටයුතු අවසන් කරන ලද නිවාස සංඛ්‍යාව 792 දක්වා වැඩි වී තිබේ. මුහුදුබඩ නිවාස වැඩ සටහන යටතේ නිමකරන ලද මුළු නිවාස සංඛ්‍යාව 1995 දී 48 සිට 1996 දී 192 දක්වා වැඩි විය. 1996 වර්ෂයේදී මුහුදුබඩ නිවාස වැඩ සටහන සඳහා දරන ලද පිරිවැය රුපියල් දශලක්ෂ 14 කි. උතුරු නැගෙනහිර පලාත්ද ඇතුළුව 1980 දශකයේ පසු භාගයේ සහ1990 දශකයේ මුල් භාගයේ අභ්‍යන්තර අරගල නිසා අවතැන් වී සිටින පවුල් විශේෂයෙන්ම දකුණු පළාතේ පදිංචි කරවීම සඳහා ආධාර සැපයීමට නව ආපදා නිවාස වැඩ සටහන පිහිටුවන ලදී. මෙම වැඩ සටහන යටතේ නිවාස ඒකක 186 ක් සඳහා ණය මුදල් සපයා ඇති අතර, විමර්ශනය කරනු ලැබූ වර්ෂය තුළදී ඉදිකිරීම් කටයුතු නිමකළ නිවාස සංඛ්‍යාව 25 කි. නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන වැඩ කටයුතු තව දුරටත් ප්‍රසාරනය කිරීම සඳහා අහිතකර ලෙස බලපාන ලද සාධක අතර, සම්පත් හිගතාවය, පහළ මට්ටමේ පවතින ණය ආපසු අයකර ගැනීමේ අනුපාතය, විශේෂයෙන්ම ආපදා නිවාස වැඩ සටහන හා වතු නිවාස වැඩ සටහනට අදාලව නිවාස සෑදීමට යෝග්‍ය ඉඩම් වල හීගතාවය සහ ගොඩනැගිලි ද්‍රව්‍ය මිළ අධිකවීම ප්‍රධාන වේ.

මේ අතර, වතු නිවාස හා සමාජ සුභාසාධන භාරය සහ මහවැලි අධිකාරිය වැනි වෙනත් ආයතන විසින්ද වර්ෂය තුලදී නිවාස සංවර්ධන වැඩ සටහන් ස්වාධීනව ක්‍රියාත්මක කරන ලදී. සමාජ සුභ සාධන වැඩ සටහන 11 (ස.සු.වැ.11) යටතේ වතු නිවාස සහ සමාජ සුභසාධන භාරය විසින් සපයන ලද ආධාර යටතේ නිමකරන ලද සහ වැඩිදියුණු කරන ලද නිවාස සංඛ්‍යාව 1995 දී 231 වු අතර, 1996 වර්ෂයේදී එය 460 දක්වා වැඩි විය. 1995 වර්ෂයේ ඉදිවෙමින් පැවති නිවාස සංඛ්‍යාව වු 1,553 හා සසඳන කල 1996 දී ඉදිවෙමින් පැවති නිවාස සංඛ්‍යාව 1432 කි. වර්ෂය තුළදී දෙවන සමාජ සුභසාධන වැඩ සටහන (ස.සු.වැ.11) යටතේ වැය කළ මුළු පිරිවැය රුපියල් දශලක්ෂ 133 ක් වේ. මේ අතර, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 1995 වර්ෂයේ දී නිමකරන ලද නිවාස ඒකක 1,189 හා සැසඳීමේදී විමර්ශනයට භාජනය වන වර්ෂයේදී නිමකරන ලද නිවාස සංඛනාව 2283 කි.

රාජ්‍ය ආයතන මගින් ආරම්භ කරන ලද නිවාස ණය වැඩසටහන් වලට අමතරව, රාජ්‍ය වානිජ බැංකු, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සමුපකාර ග්‍රාමීය බැංකු විසින් දීප ව්‍යාප්තව නිවාස ණය ලබාදීම නොකඩවා ක්‍රියාත්මක කරන ලදී.

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව විසින් මුදාහරින ලද ණය සංඛ්‍යාව 10,290 දක්වා සියයට 52 කින් වැඩි වු අතර, මුදාහරින ලද ණය මුදල් වල වටිනාකම රුපියල් දශලක්ෂ 1,194 දක්වා සියයට 37 කින් වර්ධනය විය. පවත්නා නිවාස ණය පහසුකම් වලට අමතරව, රාජ්‍ය උකස් හා ආයෝජන

**සංඛ්‍යා සටහන 5.9**
**රාජ්‍ය අංශයේ නිවාස වැඩසටහන**

| උප වැඩ සටහන | ආරම්භ කළ ඒකක (සංඛ්‍යාව) | | සම්පූර්ණ කළ ඒකක (සංඛ්‍යාව) | | මුදාහරින ලද ණය ප්‍රමාණය (රු. දල) | |
|---|---|---|---|---|---|---|
| | 1995 | 1996(අ) | 1995 | 1996 (අ) | 1995 | 1996 (අ) |
| 1. ජන උදාන වැඩ සටහන | 11,229 | 15,599 | 1,601 | 14,061 | 105 | 230 |
| 2. සෙවන නිවාස ණය වැඩසටහන | - | 15,572 | - | 7,315 | - | 78 |
| 3. ග්‍රාමීය නිවාස වැඩ සටහන | 12,492 | 2,086 | 4,310 | 5,791 | 62 | 52 |
| 4. නාගරික නිවාස වැඩ සටහන | 1,535 | 342 | 389 | 971 | 11 | 11 |
| 5. වතු නිවාස වැඩසටහන | 1,410 | 631 | 48 | 792 | 7 | 10 |
| 6. සෘජු ඉදිකිරීම් වැඩසටහන | 615 | 208 | 275 | 459 | 144 | 133 |
| 7. මුහුදුබඩ නිවාස වැඩසටහන | 192 | 0 | 48 | 192 | 11 | 14 |
| 8. ආපදා නිවාස වැඩසටහන (දකුණු පළාත) | - | 186 | - | 25 | - | 1 |
| එකතුව | 27,473 | 34,624 | 6,671 | 29,606 | 340 | 529 |

මූලය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

(අ) තාවකාලික

බැංකුව වතු කම්කරුවන් සඳහා ස්වශක්තිය මත පදනම් වූ නිවාස ණය ක්‍රමයක් සහ දිවිපියස ජීවිත රක්ෂණ ක්‍රමය හා සම්බන්ධ නිවාස ණය වැඩ සටහන් නමින් නව නිවාස වැඩ සටහන් දෙකක් හඳුන්වා දෙන ලදී. මහජන බැංකුව ප්‍රධානතම ණය සැපයුම් කරුවෙක් වශයෙන් නිවාස ණය අයදුම්කරුවන් 12,932 ක් සඳහා 1996 අගෝස්තු අවසාන වන විට රුපියල් දශලක්ෂ 594 ණය මුදල් ප්‍රදානය කර ඇත. මෙයට අමතරව, විශේෂයෙන්ම ගුරුවරුන් උදෙසා ආරම්භ කළ ගුරුසෙත ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 1,860 ක මුදලක් ණය ලාභීන් 41,459 කට ප්‍රදානය කරන ලද අතර, වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා සකස් කර තිබෙන සුව සෙවන ණය යෝජනා ක්‍රමය යටතේ 1996 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 457 ක ණය මුදල් ණයලාභීන් 10,914 ප්‍රදානය කර තිබේ. සති 6 ක කාලපරිච්ඡේදයක් තුලදී ණය මුදලක් අනුමත කිරීමට හැකිවන අයුරින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තීරණ ගැනීමේ බලය විමධ්‍යගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1996 වර්ෂය තුල ප්‍රදානය කරන ලද ණය මුදල් වල සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. මුදාහරින ලද ණය සංඛ්‍යාව 1995 දී 827 ක් වූ අතර, 1996 දී 1,171 දක්වා වැඩිවී සියයට 42 ක වැඩිවීමක් පෙන්නුම් කලේය. මේ අතර, විමසුමට ලක්වන වර්ෂයේදී මුදාහරින ලද ණය මුදල් පසුගිය වර්ෂය හා සැසඳීමේදී පස් ගුනයකින් වැඩිවී රුපියල් දශලක්ෂ 1,060 ක් විය. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව මහජනතාවට නිවාස ණය සැපයීම සඳහා අවශ්‍ය මුදල් ආසියානු සංවර්ධන බැංකුව සහ එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ ආධාර යටතේ සම්පාදනය කරන ණය ආධාර මගින් ලබාගනී. විමර්ශිත වර්ෂය තුලදී ප්‍රදානය කරන ලද මුළු ණය සංඛ්‍යාව සියයට 24 කින් වැඩිවී 4,967 ක් වූ අතර, ප්‍රදානය කරන ලද මුළු ණය මුදල් වල වටිනාකම 1996 දී සියයට 37 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 579 ක් විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මූල්‍ය පහසුකම් සැපයූ රක්ෂණ සෙවන නිවාස ණය ක්‍රමය යටතේ නිවාස ණය 806 ක් සඳහා ප්‍රදානය කළ රුපියල් දශලක්ෂ 193 ක ණය මුදලක්ද යට කී සංඛ්‍යාවේ ඇතුලත්ය.

නිවාස ගොඩනැගීමේ කටයුතු හා සම්බන්ධව ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි, පෞද්ගලික නිවාස සංවර්ධකයින්ගේ නිවාස ඉදිකිරීමේ කටයුතුවල යම් ප්‍රමාණයක වැඩිදියුණු වීමක් 1996 වර්ෂයේදී දක්නට ලැබුනි. 1996 වර්ෂය අවසානයේදී ආයෝජන මණ්ඩලය නිවාස ඒකක 11,166 ක ඉදිකිරීමට නිවාස සංවර්ධන ව්‍යාපෘති 20 ක් අනුමත කර ඇත. සමාගම් 9 ක් නව නිවාස ඒකක 2,996ක් සෑදීම සඳහා ගිවිසුම් අත්සන් කර ඇති අතර සමාගම් 15ක් විසින් නිවාස ඒකක 4,742 ක් ඉදි කිරීම පිණිස වැඩ කටයුතු ආරම්භ කර ඇත.

## නාගරික සංවර්ධනය

ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය ආසන්න වශයෙන් සියයට 22 ක් හෙවත් දශලක්ෂ 4 ක් පමණ වේ. රටේ බොහෝ නාගරික මධ්‍යස්ථාන, ආර්ථික සහ සමාජ යටිතල ව්‍යුහ පහසුකම් වල අඩුපාඩු, පාරිසරික හා අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ප්‍රශ්ණ, නාගරික දුගී භාවය සහ සේවා වියුක්ති ප්‍රශ්ණ වැනි විවිධ ගැටලු වලට මුහුණ දෙමින් සිටී. නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ මූලික වගකීම අදාල නාගරික පළාත් පාලන ආයතන වලට පැවරෙන නමුදු 1978 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය (නා.සං.අ.) ස්ථාපිත කළ වකවානුවේ සිටම, එය නාගරික මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරමින් සිටී. ඊට ප්‍රධාන හේතුව වන්නේ නාගරික පළාත්පාලන ආයතන වලට එවැනි සංවර්ධන කටයුතු මෙහෙයවීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍යමය සම්පත් නොමැති වීමයි. 1996 වර්ෂයේදී නා.සං.අ. විසින් පරිපාලන, වානිජ සහ කාර්මික සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘති, නගර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, ඒකාබද්ධ නාගරික ව්‍යාපෘති, සමාජ සහ සංස්කෘතික ව්‍යාපෘති, ඉඩම් බැංකු ව්‍යාපෘතිය සහ සේවා දායකයන් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘතිද ක්‍රියාත්මක කරනු ලැබිය. 1996 දී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සමස්ත පිරිවැය රුපියල් දශ ලක්ෂ 540 ක් විය.

නා.සං.අ. සිය සේවාදායකයන් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘති සඳහා කරන ලද ආයෝජනය මුළු ආයෝජන පිරිවැයෙන් සියයට 86 ක් හෙවත් රුපියල් දශලක්ෂ 464 ක් විය. මෙම ව්‍යාපෘති වලින් නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය සඳහා රුපියල් දශලක්ෂ 392 ක් යෙදවිණි. මෙම නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ ඇ. එ. ජ. ඩොලර් දශ ලක්ෂ 36 ක වියදමකින් නාගරික මධ්‍යස්ථාන 17 ක් සංවර්ධනය කිරීම සඳහා සකස් කරන ලද්දකි. මෙම ව්‍යාපෘතිය යටතේ ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම, අඩු ආදායම් නිවාස, මාර්ග, පාළම් හා කාණු පද්ධති ඉදිකිරීම, ඝණ අපද්‍රව්‍ය පාළනය කිරීම සහ කුඩා පරිමාණ කාර්මික ජනාවාස පිහිටුවීම ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය. මීට අමතරව, රටේ සමස්ත නාගරික අංශයම ආවරණය වන නාගරික අංශ ප්‍රතිපත්ති ක්‍රියාකාරී සැලැස්ම 1996 වර්ෂයේදී පිළියෙල කරන ලදී. නාගරික අංශ ප්‍රතිපත්ති ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන පරමාර්ථ වන්නේ නාගරික පළාත් පාලන ආයතන වලට බලතල පැවරීම පහසු කරවීම, එම ආයතන වල තාක්ෂණික සහ මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම, පෞද්ගලික අංශය විසින් කරනු ලබන ආයෝජන පහසු කිරීම සහ පාරිසරික ගැටළු පිළිබඳව කටයුතු කිරීම යනාදියයි. මේ අතර, නා. සං. අ. විසින් ඉඩම් බැංකුව සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට රුපියල් දශ ලක්ෂ 30 ක වියදමක් දරන ලදී. එමෙන්ම, බත්තරමුල්ල සහ පැලවත්ත පරිපාලන සංකීර්ණ සඳහා රුපියල් දශ ලක්ෂ 14 ක්ද, ඒකාබද්ධ ව්‍යාපෘති සඳහා රුපියල් දශලක්ෂ 23 ක්ද නා.සං.අ. විසින් යොදවන ලදී. රත්මලාන සහ හෝමාගම පිහිටි කර්මාන්ත සංකීර්ණ සඳහා රුපියල් දශලක්ෂ 3 ක පිරිවැයක් දරන ලදී.

සවිස්තරාත්මක නාගරික සහ ප්‍රාදේශීය සංවර්ධන සැලසුමක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිගෙන ඇති අතර, ඒ අනුව නා.සං.අ. විසින් මුළු බස්නාහිර පළාතම ආවරණය වන පරිදි "කොළඹ නාගරික ප්‍රදේශ ව්‍යුහ සැලැසුම" සම්පාදනය කරන ලදී. මෙම සැලසුම, 1974 - 79 කාලපරිච්ඡේදයේ දී සකස් කරන ලද කොළඹ නගරය සඳහා වූ ප්‍රධාන සැලසුමෙහි සංශෝධනයකි. කොළඹ නාගරික ප්‍රදේශ ව්‍යුහ සැලසුමෙහි අවසන් කෙටුම්පතෙහි වැඩකටයුතු දැනට නිමකර ඇති අතර, අවසන් වාර්තාව 1997 වර්ෂයේ මුල් භාගයේදී නිකුත් කිරීමට අපේක්ෂිතය. මෙම සැලසුමෙහි ප්‍රධාන අරමුණු අතර ප්‍රදේශයේ ආර්ථික කටයුතු, සේවා නියුක්තිය හා නාගරික ජීවන තත්ත්වය නගා සිටුවීමත්, ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කරීම තුළින් භෞතික පිවිසුම් ඉහළ නැංවීම හා නඩත්තු කිරීම, ස්වභාවික පරිසරය වැඩිදියුණු කිරීම හා ආරක්ෂා කිරීම, කොළඹ නගරය වාණිජ සහ කාර්යාල පහසුකම් සපයනු ලබන කේන්ද්‍රස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම සහ නිවාස සැපයුම වැඩි කිරීම ආදිය වේ. ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා, මීගමුව, ගම්පහ, බියගම, හෝමාගම සහ හොරණ යන නගර 5 වෘද්ධි මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය. ඒ සඳහා දුම්රිය සහ මහා මාර්ග පද්ධති, සංවර්ධනය කිරීමද, පරිසරයට අහිතකර නොවන ආකාරයට යටිතල පහසුකම් පුළුල් කිරීමද කරනු ඇත.

## ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

ජල සම්පාදන පහසුකම් සැපයීම සහ එම පහසුකම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව වගකිව යුතු ප්‍රමුඛ ආයතනය වශයෙන් ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මංඩලය (ජා.ජ.ස.ජ.ම.) කටයුතු කරනු ලැබේ. 1996 වර්ෂයේදී ජා.ජ.ස.ජ.ම. මගින් ජල ඝණ මීටර් දශලක්ෂ 280 ක් සැපයීම සඳහා ජල සන්ධි කිරීම් 353,830 ක් ජල සැපයුම් ව්‍යාපෘති 264 ක් යටතේ ක්‍රියාත්මක කළේය. විශේෂයෙන්ම මහ කොළඹ ආර්ථික බල ප්‍රදේශය තුල ගෘහස්ත නොවන පාරිභෝගිකයින්ගේ කැපී පෙනෙන වැඩි වීමක් පිළිබිඹු කරමින්, 1996 වර්ෂය තුලදී ජල පහසුකම් සඳහා පැවති ඉල්ලුම ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන දෙඅංශයෙන්ම වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජා.ජ.ස.ජ.ම. මගින් සපයනු ලබන නව ජල සන්ධි කිරීම සංඛ්‍යාව 1995 දී 28,680 හා සසඳන කල විමර්ශිත වර්ෂයේදී එම ප්‍රමාණය 30,570 ක් විය. මුළු ජල සන්ධි කිරීම් සංඛ්‍යාවෙන් 16,508 ක් හෝ සියයට 50 කට වැඩි ප්‍රමාණයක් සපයා ඇත්තේ ග්‍රාමීය අංශයට වන අතර, ඉතිරිය සපයා ඇත්තේ මහ නගර සභා සහ නගර සභා සීමා තුල වූ නාගරික අංශයටය. ජල සැපයුම් සන්ධි කිරීම් වල වර්ධනයත් සමගම 1996 වර්ෂයේදී නල ජල සැපයුම ජල ඝණ මීටර් දශලක්ෂ 280 ක් දක්වා සියයට 2 කින් වර්ධනය විය. ජා.ජ.ස.ජ.ම. අනුව 1996 වර්ෂය අවසාන වන විට මුළු ජනගහනයෙන් සියයට 61 කට පිරිසිදු පානීය ජල පහසුකම් (නල ජලය, නල ළිං සහ ආරක්ෂිත ළිං) ලබා ගත හැකිව පැවතුණි. නාගරික ජන සංඛ්‍යාවෙන් සියයට 90 ක්ම පිරිසිදු පානීය ජල පහසුකම් ලබා ගත හැකිවිය. ග්‍රාමීය ජන සංඛ්‍යාවෙන් සියයට 60 කට පමණක් පිරිසිදු පානීය ජල පහසුකම් ලබා ගත හැකිව තිබුණු අතර එම ප්‍රමාණය පකිස්ථානය (සියයට 71), ඉන්දියාව (සියයට 79) සහ මැලේසියාව (සියයට 66) වැනි කලාපීය රටවල් සමග සසඳන කළ තරමක් පහත් මට්ටමක පවතී.

වැඩිවන නාගරික ජන ගහනය සහ කාර්මික හා වාණිජ කටයුතු වල අපේක්ෂිත වර්ධනය ගැන සලකා බලන කල ජල සම්පාදන පහසුකම් සඳහා ඉල්ලුමෙහි සැලකිය යුතු වර්ධනයක් ඇතිවීමට ඉඩකඩ ඇත. ග්‍රාමීය අංශයේ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීමට ඇති නොවැලැක්විය හැකි අවශ්‍යතාවය හේතුවෙන් මෙම ඉල්ලුම තවදුරටත් ඉහළ යා හැක. මේ අනුව, ජල සම්පාදන කටයුතු මත වන ආයෝජන අවශ්‍යතා බෙහෙවින් ඉහළ මට්ටමක පවතින අතර 1996 වර්ෂයේ රාජ්‍ය ආයෝජන වැඩ සටහන මගින් සපයන ලද ඇස්තමේන්තු අනුව, වර්ෂ 2010 දී සැමට පානීය ජලය සම්පාදනය කිරීමට මෙම අංශය රුපියල් දශලක්ෂ 8000 ක වාර්ෂික ප්‍රාග්ධන ආයෝජනයක් අවශ්‍ය වේ. කෙසේ වුවද, 1996 වර්ෂයේදී ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතීන්හි ආයෝජිත මුළු මුදල රුපියල් දශ ලක්ෂ 3,068 ක් පමණ වූ අතර, එය අපේක්ෂිත ප්‍රමාණයට වඩා පහත් මට්ටමක පැවතුණි. ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණ සහ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණයෙන් දළ වශයෙන් සියයට 53 ක්ම ලැබී ඇත්තේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.ස.) (IDA) ආසියානු සංවර්ධන බැංකුව (ADB), අන්තර්ජාතික ආර්ථික සහයෝගිතා අරමුදල (OECF) සහ අන්තර් ජාතික සංවර්ධන සංවිධානය (ODA) වැනි විදේශීය මූලාශ්‍ර වලිනි. ජල සම්පාදන අංශය සඳහා වන ආයෝජන පුළුල් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීමක් සමගම රජය විසින් නව ජල සම්පාදන යෝජනා ක්‍රම ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය ආයෝජන සහනදායී ක්‍රමයට (ග්‍රාමීය අංශයේ ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන පිරිවැයෙන් සියයට 85 ක් සහ නාගරික අංශයේ ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන පිරිවැයෙන් සියයට 60 ක්) තවදුරටත් ලබා දෙන ලදී. අඹතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය, නැගෙනහිර කොළඹ සඳහා ජල සම්පාදන ව්‍යාපෘතිය, මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය, කොළඹ දකුණ ව්‍යාපෘතිය සහ උඩු නුවර - යටිනුවර ව්‍යාපෘතිය විදේශ ආධාර මගින් පවත්වා ගෙන යනු ලැබූ ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතීන්ය. ග්‍රාමීය ප්‍රදේශවල පවතින ජල සම්පාදන සහ සනීපාරක්ෂක තත්වය පිළිබඳ ගැටළු සඳහා පිළියමක් වශයෙන්, ජා.සං.සං. මූල්‍ය පහසුකම් සපයනු ලබන මහජන ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ම.ජ.ස.ස.ව්‍යා.) විමර්ශිත කාල පරිච්ඡේදය තුළදී ප්‍රගතියක් පෙන්වන ලදී. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ 6,50,000 ජන සංඛ්‍යාවක් ආවරණය වන පරිදි රත්නපුර, බදුල්ල, සහ මාතර දිස්ත්‍රික්කවල කුඩා නගර 17 ක සහ ගම්මාන 2,700 ක් සඳහා ජල සම්පාදන පහසුකම් සැපයීමයි. ම.ජ.ස.ස. වැඩසටහන, ප්‍රධාන උපවැඩසටහන් තුනක් යටතේ එනම් ග්‍රාමීය ජල සම්පාදන සහ සනීපාරක්ෂක වැඩසටහන, පාසැල් සඳහා ජල සම්පාදන සහ සනීපාරක්ෂක වැඩ සටහන සහ කුඩා නගර ජල සම්පාදන සහ සනීපාරක්ෂක වැඩ සටහන යටතේ ක්‍රියාත්මක විය. විමර්ශිත වර්ෂයේදී ප්‍රධාන උප වැඩ සටහන වන ග්‍රාමීය ජල සම්පාදන සහ සනීපාරක්ෂක වැඩ සටහන යටතේ, ජල සම්පාදන ව්‍යාපෘති 170 ක ඉදිකිරීම් කටයුතු නිම කර ඇති අතර, ව්‍යාපෘති 790 ක ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු තව දුරටත් කරගෙන යන ලදී. 1996 වර්ෂය අවසන් වන විට ම.ජ.ස.ස. වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල ජල සම්පාදන පහසුකම් තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 653 ක් වැය කර ඇත.

ඉහළ මට්ටමක පවතින ආයෝජන අවශ්‍යතාවය, වැඩිවන මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය (1996 වර්ෂයේදී සියයට 23 කින් වැඩිවී ඇත) සහ ඉහළ යන ණය සේවා බර (පාරිභෝගිකයින් ගෙන් එකතු කර ගන්නා ලද මුදලින් සියයට 19 කි) යන වාතාවරණයක් යටතේ ජා.ජ.ස.ජ.ම. යේ මූල්‍යමය ශක්‍යතාවය වැඩි දියුණු කිරීම අවධානයට යොමු විය යුතු මූලික කරුණකි. දැනට ජල බද්ද සකස් කර ඇත්තේ මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සහ ලබා ගත් ආයෝජන ණය වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල් ආවරණය වන අයුරිනි. බල ශක්ති අංශයේදී මෙන්ම මෙහිදීද කර්මාන්ත සහ වාණිජ අංශයේ පාරිභෝගිකයින් විසින් ගෘහස්ත අංශයේ පාරිභෝගිකයින් වෙත හරස් සහනාධාර සපයනු ලැබිය. 1994 සිට මේ දක්වා ජල බදු සංශෝධනය කර නොමැත. මේ අනුව, හරස් සහනාධාර අඩු කිරීම, ක්‍රමානුකූල ජල බදු සංශෝධන ක්‍රියාත්මක කිරීම සහ ආදායම් එකතු කිරීමේ ක්‍රම වැඩි දියුණු කිරීම මෙහිදී අවධානයට යොමු කළ යුතුව ඇත. මේ අතර ජල කාන්දු වීම්, ගාස්තු නොගෙවා කරනු ලබන ජල පරිභෝජනය, නීති විරෝධී ලෙස ජල සම්බන්ධතා ලබා ගැනීම සහ නඩත්තු කටයුතු විධිමත් ලෙස කිරීමෙහිලා දක්නට ලැබුණු අඩුපාඩු යනාදියේ ප්‍රතිඵලයක් ලෙස ඉහළ අනුපාතයක්ව පැවති අහිමිවූ ජල සම්පත් ප්‍රමාණය හෝ නිෂ්පාදන අලාභය (සියයට 40) අවධානය යොමු කල යුතු ප්‍රධාන අංශයක් වේ. මේ සඳහා නිසි පිළියම් යෙදුවහොත්, ජලසම්පාදන අංශයේ මූල්‍යමය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කල හැක.

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

ප්‍රාදේශීය මූලිකත්වය තුලින් ආර්ථික ඉඩ ප්‍රස්ථාවන් පුළුල් කිරීම මගින් ග්‍රාමීය ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජීවන තත්ත්වය ඉහළ නැංවීම, 1979 දී ආරම්භ කෙරුන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනෙහි අරමුණ වේ. තවද දිස්ත්‍රික්ක තුළ මෙන්ම දිස්ත්‍රික්ක අතර පවත්නා අසමතාවයන් නැති කිරීම සඳහා තුලනාත්මක වර්ධනයක් ඇති කිරීමට ද අපේක්ෂා කෙරේ. යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා විශාල

ලෙස ආයෝජනය කරමින් දිස්ත්‍රික්ක පදනමක් මත ඇරඹුණු ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, 1989 න් පසු පෞද්ගලික අංශය සමග සම්බන්ධ වී සහභාගිත්ව ප්‍රවේශයක් මගින් ග්‍රාමීය අංශයේ ඉතා නොදියුණු ප්‍රදේශවල රැකියා සම්පාදනය සහ ආදායම් උත්පාදනය කිරීම උදෙසා යොමු විය.

1996 වර්ෂය තුළ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 16 ක් ක්‍රියාත්මක කෙරුණි. මෙය දිස්ත්‍රික්ක ව්‍යාපෘති 12 කින් ද, පළාත්බද ව්‍යාපෘති 3 කින් ද, මානව සම්පත් හා ආයතනික සංවර්ධන වැඩසටහනකින් ද සමන්විත විය. මේ සඳහා වාර්ෂික ප්‍රතිපාදන වලින් සියය 97 ක් හෙවත් රුපියල් දශලක්ෂ 1,092 ක් වැය කර ඇත. (සංඛ්‍යා සටහන 34)

කුඩා ඉඩම් හිමියන්, ඉඩම් නොමැති දිළිඳු පවුල් සහ කාන්තාවන් වෙනුවෙන් වැඩි අවධානය යොමු කළ කෑගල්ල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 1996 දී අවසන් කෙරුණි. කුඩා තේ වතු සහ සුළු අපනයන භෝග නිෂ්පාදකයන් සඳහා ඇසුරුම් ව්‍යාපෘතියක් ඇති කිරීම, කාන්තාවන් සඳහා ආදායම් ජනනය කරන වැඩකටයුතු, සුළු වාරිමාර්ග වැඩ, ග්‍රාමීය පාරවල්, කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත හා ගෘහ කර්මාන්ත සහා ණය ලබාදීම මෙමව්‍යාපෘතියයටතේ කරනු ලැබූ වැඩකටයුතු, සමහරක් වේ. කළුතර දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 1995 දී අවසන්වීමට නියමිතව තිබුණ ද, 1996 දී ද එහි ඉතිරි වැඩ කොටස ක්‍රියාත්මක කරන ලදී. "සීඩා" (CIDA) - කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය, "යුනිසෙෆ්" සහ ශ්‍රී ලංකා රජය යන පාර්ශව තුන අතර ඇති කරගත් ඒකාබද්ධ ප්‍රයත්නයක් වූ පුත්තලම් දිස්ත්‍රික් ඒකාබද්ධ මූලික සේවා සැපයීමේ ව්‍යාපෘතිය 1996 ජුනි මස අවසන් කරන ලදී. මේ සෞඛ්‍ය සේවා පහසුකම් දියුණු කිරීම, ළමුන්ගේ හා කාන්තාවන්ගේ පෝෂණ මට්ටම් උසස් කිරීම සහ දිස්ත්‍රික්කයේ ඉතා දුෂ්කර ප්‍රදේශවල ළදරු සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා සේවාවන් සමූහයක් ලබා දුණි.

මාතර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනෙහි අවසන් අදියරේ සැහෙන ප්‍රගතියක් 1996 වසර තුළ දී වාර්තා කරන ලදී. 1996 වර්ෂයේ ප්‍රතිපාදන වලින් සියයට 60 ක් වියදම් කර ඇත්තේ, මූලික සෞඛ්‍යය ආරක්ෂාව, කෘෂිකාර්මික සංවර්ධනය, ණය පහසුකම් සැපයීම සහ පානීය ජලය ලබාදීම සඳහා ය. හම්බන්තොට දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සඳහා 1996 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද මුදලින් සියයට 50 කටත් වඩා වැඩි ප්‍රමාණයක් වියදම් කරන ලද්දේ ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් නැංවීම සඳහා ය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන යටතේ කරගෙන ගිය අනෙකුත් කටයුතු වූයේ කුඩා පරිමාණ ව්‍යාපාර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම, ශිල්පීය කුසලතා සංවර්ධනය කිරීම, වාරිමාර්ග සංවර්ධනය, කර්මාන්ත අංශය නගා සිටුවීම සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම වේ. නුවරඑළිය ඒකාබද්ධ ග්‍රාමීය වැඩසටහනේ අරමුණ වූයේ දුගී බව තුරන් කිරීම සහ ආර්ථිකමය හා පාරිසරිකමය තිරසාර සංවර්ධනයක් ඇති කිරීමයි. 1996 වර්ෂය සඳහා මෙම වැඩසටහනට වෙන් කරන ලද මුළු මුදලින් වැඩි ප්‍රමාණයක් අධ්‍යාපන සහ සෞඛ්‍යය සඳහා වෙන් කරන ලදී. බදුල්ල දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන මගින් එම දිස්ත්‍රික්කය තුළ දුගී බව තුරන් කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ දිළිඳු ගැමි පවුල් අතර පෝෂණය සහ ආහාර සුරක්ෂිත භාවය ඇති කිරීමට උත්සාහ දරන ලදී. තව ද මෙම කටයුතු කරගෙන යාම සඳහා සහයෝගිතා සැලසුම් සහ සම්පත් වෙන් කිරීමේ ක්‍රියා පිළිවෙළක් ඇතිකිරීමට රජයට ආධාර කරන ලදී. රත්නපුර දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය වැඩසටහන අවසන් අදියර 1996 දී ආරම්භ කෙරුණ අතර එමගින් මෙතෙක් ක්‍රියාත්මක වූ වැඩසටහන් වල පැවැත්ම සහතික කිරීම සහ ඒවායෙහි වගකීම ජනතා සංවිධානවලට පැවරීමට කටයුතු කරන ලදී. මොණරාගල දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන මගින්, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතියෙහි සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කරන ලදී. මොණරාගල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය, ක්‍රියාමාර්ගවල පැවතුණු ගැටළු නිසා 196 වර්ෂය තුළ දී ක්‍රියාත්මක නොවුණි. ග්‍රාම සංවර්ධන කටයුතු හා ග්‍රාමීය මට්ටමේ පෞද්ගලික ව්‍යාපාර වැඩි දියුණු කිරීම, මහනුවර දිස්ත්‍රික් ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. 1995 වසරේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන වලින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් වැය කර තිබුණේ ගම්පහ දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සඳහා ය. 1996 දී මෙම වැඩසටහන යටතේ ග්‍රාමීය පෙදෙස්වල පාලම් 16 ක් ඉදිකළ අතර, ආර්ථිකමය සහ සමාජීය වශයෙන් සංචලනය පහසු කිරීම සඳහා ගම්බද පාරවල්වල තත්ත්වය දියුණු කිරීමට උපකරණ සපයන ලදී. තව ද කෘෂිකර්ම ව්‍යාප්ති සේවාව දියුණු කිරීම සඳහා අවධානය යොමු කිරීම ද මෙම වැඩසටහනේ අරමුණක් විය.

1996 වසරේ දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල සඳහා කරන ලද මුළු වියදමින් සියයට 47 ක් වැය කරනු ලැබුවේ 6 වැනි වසරටත් ක්‍රියාත්මක වෙමින් පැවතුණු දකුණු පළාතේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙළ සඳහාය. ක්‍රියාත්මක කිරීමේ මූලික අවධානය යොමු වූයේ අළුත් ආදායම් මාර්ග බිහි කිරීම, නව රැකියා ප්‍රවේශයන් ඇති කිරීම, ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් ඇති කිරීම සඳහා වේ. අනුරාධපුර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 1995 වර්ෂයේ දී අවසන් කිරීමෙන් පසුව උතුරු මැද පළාත් සහයෝගිතා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය 1996 ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක් ඊට ඇතුළත් වේ. මධ්‍යම පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම 10 ක් පුනරුත්ථාපනය කිරීම, පිවිසුම් මාර්ග ගොඩනැගීම, සත්ව පාලනය සහ ස්වයං රැකියා ඇති කිරීම සහ මූලික සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ කරනු ලැබූ කටයුතු වේ. වයඹ පළාතේ වියළි කලාපීය සහයෝගිතා සංවර්ධන ව්‍යාපෘතිය, තිරසාර ගොවිතැන් ක්‍රමයක් වර්ධනය කිරීමට අදහස් කරන ලදී. එමගින් එහි ප්‍රතිලාභ ලබන ග්‍රාමීය ජනතාවගේ සහභාගීත්වයෙන් ව්‍යාපෘති සැලසුම් කිරීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත් ඒ තුළින් එම ජන කොට්ඨාශයේ ජීවන තත්ත්වය නගා සිටුවීමත් අදහස් කරයි.

මානව සම්පත් සහ ආයතනික සංවර්ධන වැඩසටහනෙහි අරමුණ වන්නේ ප්‍රාදේශීය සංවර්ධන වැඩකටයුතුවල යෙදී සිටින නිලධාරීන්ගේ හැකියාවන් දියුණු කිරීම වේ. මේ යටතේ 1996 වසර තුළ දී සහකාර අධ්‍යක්ෂවරුන් 43 දෙනෙකුට දේශීය පුහුණුවක් ද, 30 දෙනෙකුට විදේශීය පුහුණුවක් ද ලබා දෙන ලදී. ඊට අමතරව, සමාජ සජීවීකාරකයන් 20 දෙනකුට දේශීය පුහුණුව ලබාදෙන ලදී.

## සමෘද්ධි වැඩසටහන

දරිද්‍රතාවයෙන් පෙලෙන දුගී කොටස්වල ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා සහ දිළිඳුකම තුරන් කිරීම සඳහා රජය මැදිහත්වීමේ ප්‍රධාන ක්‍රමෝපාය වූයේ 1995 ජූනි මාසයේදී ආරම්භ කරන ලද සමෘද්ධි වැඩ සටහනයි. මෙම සමෘද්ධි වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ක්‍රමෝපායයන් වූයේ ආදායම් පරිපූරක වැඩ සටහන සහ රැකියා අවස්ථා පුළුල් කරන

සමාජ සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යි. 1996 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 238 ක් ආවරණය කෙරෙමින් දිස්ත්‍රික්ක 18 ක සමෘද්ධි වැඩ සටහන් ක්‍රියාත්මක විය. මූලික ඉලක්කය වූ දශලක්ෂ 1.2 පවුල් සංඛ්‍යාව ඉක්මවමින් 1996 වර්ෂය අවසානයේ දී සුභසාධක ඩැඩසටහන් යටතේ මූලපමය ආධාර ලැබූ පවුල් සංඛ්‍යාව දශලක්ෂ 1.5 ක් විය. මෙම වැඩසටහන සඳහා දැඩි තෝරාගැනීමේ හා සුපරීක්ෂන ක්‍රියාවලියක අවශ්‍යතාවය මෙයින් සනිටුහන් කෙරේ. මේ අතර, ජනසවිය වැඩ සටහනින් පළමු අදියර හතර තුලදී මාසිකව පොලී ආදායම වශයෙන් රුපියල් 250 බැගින් රජයෙන් ලබාගත් පවුල් සංඛ්‍යාව 381,578 ක් වූ අතර, උතුරු - නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වූ වියලි සළාක ක්‍රමය මගින් පවුල් 163,000 ක් ප්‍රතිලාභ ලබා ඇත. මේ අනුව, ඉහත සඳහන් කළ සුභසාධන වැඩ සටහන් යටතේ ආවරණය වූ මුළු පවුල් සංඛ්‍යාව දශලක්ෂ 2.1 ක් හෝ මුළු ජනගහනයෙන් සියයට 50 කට ආසන්න වේ.

සමෘද්ධි ආදායම් ප්‍රතිපූර්ණ වැඩ සටහන යටතේ ප්‍රතිලාභ ලැබූ මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 62 ක් වන පවුල් 902,654 ක් අතර, මාසිකව රුපියල් 500 බැගින් ලැබූ අතර, සියයට 2 ක් වන පවුල් 23,311 මාසිකව රුපියල් 1,000 බැගින් ලබාගන්නා ලදී. ඉතිරි පවුල් සංඛ්‍යාව මාසිකව රුපියල් 200 හෝ රුපියල් 100 බැගින් ලැබූ අතර, එය පවුල් සාමාජික සංඛ්‍යාව සහ ආදායම් මට්ටම මත තීරණය වේ. ආදායම් පරිපූරක වැඩ සටහන සඳහා විමර්ශිත වර්ෂයේදී වැය කරන ලද මුලු පිරිවැය රුපියල් දශලක්ෂ 6,729 කි. තමන් ලබාගත් ආදායම් සහනයෙන් කොටසක් ඉතිරි කිරීම සඳහා සියළුම සමෘද්ධි ප්‍රතිලාභීන් උනන්දු කරන ලදී. මෙම ක්‍රමය යටතේ 1996 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 1,513 ඉතිරි කර ඇත.

සමෘද්ධි අධ්‍යක්ෂක ජනරාල් යටතේ පාලනය වන සමෘද්ධි අධිකාරිය 1996 මාර්තු මස ආරම්භ විය. සමාජයේ වරප්‍රසාද නොලත් තරුණ, තරුණියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන වැඩ සටහන් සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම සහ සුපරීක්ෂණය මෙන්ම දිළිඳු කම පිටුදැකීමේ රජයේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමද සමෘද්ධි අධිකාරියේ වගකීම් වේ. දිළිඳු බව තුරන් කරලීමේ වැඩසටහන් පහසු ලෙස ක්‍රියාත්මක කිරීම පිණිස ඇතැම් අමාත්‍යාංශ සහ ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම පිළිබඳව සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මූලිකව වගකිව යුතු වේ. 1996 අවසානය වන විට දිස්ත්‍රික්ක 18 ක ග්‍රාම නිලධාරී කොට්ඨාශ 12,093 කට සමෘද්ධි නියාමකයින් 23,648 ක් පත් කර තිබුණි.

කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර සඳහා ණය ආධාර සැපයීම සහ සමෘද්ධි ප්‍රතිලාභීන් ගේ කෙටිකාලීන පාරිභෝගික අවශ්‍යතා සඳහා ආධාර කිරීමේ පරමාර්ථයෙන් සමෘද්ධි ණය නියාමක නමින් නව වැඩ සටහනක් 1996 ජුනි මස හඳුන්වා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය බැංක දෙක මගින් අරමුදල් සපයනු ලබන අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ක් ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 18 ක ක්‍රියාත්මක වේ. මෙම ණය ක්‍රමය යටතේ සියයට 5 ක පොලී අනුපාතයක් මත උපරිම වශයෙන් රුපියල් 1,000 ක් ආදායම් උත්පාදන කටයුතු සඳහාද ආපදා සහ පාරිභෝගික කටයුතු සඳහා රුපියල් 500 ක්ද ලබාදෙනු ලැබේ. ණය ක්‍රමය යටතේ ණය මුදල් සැපයීමට එක් එක් සමෘද්ධි නියාමකයකුට රුපියල් 25,000 ක අත්තිකාරමක් සපයනු ලැබේ. 1996 වර්ෂයේදී මෙම ණය ක්‍රමය යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන් 22,522 ක් අතර, රුපියල් දශ ලක්ෂ 18 ක වටිනාකමින් යුත් ණය මුදල් බෙදාහැර තිබේ. අඩු ආදායම් ලබන පුද්ගලයින් සඳහා ස්වයං රැකියා වැඩි කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 1996 වර්ෂය තුල නව ණය යෝජනා ක්‍රම දෙකක් වන සුරතුර දිරිය සහ ස. ස. ණ. (සමෘද්ධි සංවර්ධන ණය යෝජනාක්‍රමය) සකස් කරන ලදී. 1996 සැප්තැම්බර් 15 දින ක්‍රියාත්මක කරන ලද සුරතුර, සමෘද්ධි ප්‍රතිලාභීන් නොවන අඩු ආදායම් ලබන කණ්ඩායම් උදෙසා සකස් කර ඇත. මෙම ණය ක්‍රමය යටතේ කෘෂිකාර්මික සහ කර්මාන්ත කටයුතු, වෙළඳාම් සහ අනෙකුත් සේවාවන් සඳහා ණය අයැදුම් කළ හැකි වේ. වෙළඳපලක් සොයාගැනීමේ හැකියාව, සහ පවත්නා කුසලතා මත පදනම්ව ව්‍යාපෘති ආරම්භ කරනු ලබන තරුණයන්ට උපරිමය රුපියල් 50,000 ක වටිනාකමකින් යුත් ණය මුදල් මේ යටතේ ලබාදෙනු ලැබේ. 1996 වර්ෂය අවසාන වන විට කොළඹ, කළුතර, මාතර, හම්බන්තොට, ගාල්ල, සහ ගම්පහ යන දිස්ත්‍රික්ක තුල මෙම ණය ක්‍රමය හඳුන්වා දී තිබූ අතර, රුපියල් දශලක්ෂ 78 ක වටිනාකමකින් යුත් ණය මුදල් තරුණයින් 2,400 අතර, බෙදා හැර ඇත. මහ බැංකු අධීක්ෂණය යටතේ ණය දෙන ආයතන (ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක සහ හැටන් නැෂනල් බැංකුව) තුලින් ණය මුදල් බෙදා හැරීම වර්ධනය කිරීමේ අරමුණින් රජය රුපියල් දශලක්ෂ 350 වෙන්කර ඇත. සමෘද්ධි ප්‍රතිලාභීන් අතර ස්වයං රැකියා අවස්ථා වැඩි කිරීමට අවශ්‍ය ණය පහසුකම් සපයමින් සසණ ණය ක්‍රමය නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක වනු ඇත.

උප වැඩසටහන් යටතේ සමෘද්ධි කටයුතු තවදුරටත් පුළුල් කරනු ලැබිය. ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන යටතේ පොදු සහභාගිත්වයෙන් පවත්වාගෙන යනු ලබන මාර්ග, වාරිමාර්ග, ජල සම්පාදන, සංවර්ධන ව්‍යාපෘති, ගොඩනැගිලි ඉදිකිරීම සහ ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් මිළදී ගැනීම උදෙසා රුපියල් 15,000 - රුපියල් 30,000 දක්වා මුදලක් එක් එක් සමෘද්ධි බලකායන්ට ලබාදෙනු ලැබේ. 1996 වර්ෂය තුලදී දිස්ත්‍රික්ක 18 ක ව්‍යාපෘති 11,422 ක් (මාර්ග ව්‍යාපෘති 6,132, වාරිමාර්ග ව්‍යාපෘති 1,094, ජල සම්පාදන ව්‍යාපෘති 3,445, ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති 727, කර්මාන්ත ව්‍යාපෘති 127 සහ අනෙකුත් ව්‍යාපෘති 144) සම්පූර්ණ කලේය. මෙම ව්‍යාපෘති සඳහා වැය වූ මුළු පිරිවැය රුපියල් දශලක්ෂ 211 කි. මෙයට අමතරව රජයේ දායකත්වය යටතේ කුඩා පරිමාණයේ ශ්‍රම සූක්ෂම ග්‍රාමීය ඉදිකිරීම් ව්‍යාපෘති විවෘත මිළ ගණන් කැඳවීම තුලින් සමෘද්ධි බලකායන්ට ලබාදෙන ලදී.

ස්වයං රැකියා සඳහා මග පෙන්වීම සහ අතිරේක ආදායම් ඉපැයීමේ උපක්‍රමයක් ලෙස අඩු ආදායම් ලබන පවුල් අතර, රෙදි මසන යන්ත්‍ර 5,000 ක් බෙදා දී ඇත. ග්‍රාමීය ජනතාව අතර ඉතිරි කිරීම් හා ආයෝජන පුරුදු ඇති කිරීම පිණිස ඉතිරි කිරීම්, ආයෝජන හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩ සටහන හඳුන්වා දෙනු ලැබුණි. මෙම වැඩ සටහන යටතේ සාමාජිකයින් 100,000 දායකත්වය මගින් බැංකු 125 ක් 1996 වර්ෂය තුළ පිහිටවූ අතර, සමෘද්ධි කළමනාකරුවන් 125 දෙනෙකු බැංකු සමාජ කටයුතු සඳහා පුහුණු කරන ලදී. මෙයට අමතරව, විශේෂයෙන්ම සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා රක්ෂණ ක්‍රමයක් 1996 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබුණි. මාසිකව රක්ෂණ වාරිකය එක් පවුලක් සඳහා රුපියල් 20 ක් වේ. මෙම රක්ෂණ ක්‍රමය වෙනුවට 1997 දී සමාජ රක්ෂණ අරමුදල ආදේශනය කරන අතර එමගින් සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වඩාත් පුළුල් ප්‍රතිලාභ ලබා ගත හැකි වේ. සමෘද්ධි සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අතිරේක අරමුදල් සම්පාදනය කිරීම සඳහා අතිරේක ආදායම් ඉපයීම් පිණිස සමෘද්ධි ලොතරැයි අරමුදලද 1996 දී පිහිටුවනු ලැබිය. මෙම ලොතරැයි විකිණීමෙන් 1996 වර්ෂයේදී උපයන ලද මුළු ආදායම රුපියල් දශලක්ෂ 281 කි. මේ අතරින් රුපියල් දශ ලක්ෂ 56 ක් සමෘද්ධි සමාජ යටිතල සංවර්ධන වැඩ සටහන හා අදළව ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වූ වෘත්තීය පුහුණු ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පෝෂණය, සෞඛ්‍යය සහ පාරිසරික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීම් අපේක්ෂා කෙරේ.

මේ අතර, ජාතික සංවර්ධන භාරකාර අරමුදල (ජා. ස. භා. අ.) සහභාගීත්ව ආයතනවල ආධාර ඇතිව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 43 ක සුළු පරිමාණ ව්‍යාපාර 20,844 ක් පිහිටුවීම සඳහා රුපියල් දශලක්ෂ 198 ක අරමුදල් සපයා ඇත. ජා. ස. භා. අ. මගින් 1996 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 54 ක පිරිවැයක් දරමින් පෝෂණ වැඩ සටහන් ග්‍රාම නිළධාරී කොට්ඨාශ 2,747 ක ක්‍රියාත්මක කර ඇත. මේ අතර, 1996 දී ප්‍රජා ව්‍යාපෘති (සමෘද්ධි හා අදාල ව්‍යාපෘති 284 ක්ද ඇතුලත්) 419 ක් ආරම්භ කළේය. ජා. ස. භා. අ. මගින් දියත් කරන ලද පුහුණු වැඩ සටහන් යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 245 ක ප්‍රතිලාභීන් 59,454 ක් පුහුණුව ලබා ඇත.

## 5.9 පරිසරය

ලංකාවේ පරිසරය හා සම්බන්ධ ප්‍රධාන නීතිය වන ජාතික පරිසර පණත 1980 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදී. ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම ඇගයීම සඳහා සහ පරිසර සංරක්ෂණ බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීම සඳහා අවශ්‍ය විධි විධාන ඇතුලත් කිරීම සඳහා මෙම පනත 1988 දී සංශෝධනය කරන ලදී. ජාතික පරිසර ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම, මධ්‍යම පරිසර අධිකාරියෙහි (ම. ප. අ.) වගකීම වන අතර, පරිසර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පාරිසරික කටයුතු සම්බන්ධීකරණය කිරීම අදාල අමාත්‍යාංශයේ වගකීම වේ.

1996 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය සිය ව්‍යාවස්ථාපිත වගකීම් ඉටුකරන අතරතුර ස්වභාවික පරිසරය ආරක්ෂාකර ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා ව්‍යාපෘති කීපයක්ම ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පරිසරය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමේ වැඩමුළු, පුහුණු වැඩසටහන්, ප්‍රදර්ශණ, සිනමා සහ වීඩියෝ දර්ශන නිෂ්පාදනය වැනි වැඩසටහන් කීපයක්ම ම.ප.අ. විසින් වර්ෂය තුළදී ඉටුකරනලදී. මේ අතර, ම. ප. අ. විසින් 1995 වර්ෂයේදී නිකුත් කරන ලද පරිසර සංරක්ෂණ බලපත්‍ර 187 සමග සැසඳීමේදී 1996 වර්ෂයේ මෙවැනි බලපත්‍ර 256 ක් නිකුත් කරන ලදී. මීට අමතරව 1996 වර්ෂයේදී පරිසර සංරක්ෂණ බලපත්‍ර 305 ක් නැවත දීර්ඝ කරන ලදී. 1995 කරන ලද එවැනි දීර්ඝකිරීම් සංඛ්‍යාව 232 කි. තවද 1996 ජාතික පරිසර (ශබ්ද පාලන) විධිවිධාන අංක 2 සහ 1990 ජාතික පරිසර (සංරක්ෂණ සහ තත්ත්ව) විධිවිධාන අංක 1, 1996 මැයි මාසයේදී ගැසට් පත්‍රය මගින් ක්‍රියාත්මක බව නිවේදනය කරන ලදී. එමෙන්ම ම. ප. අ. විසින් පසුගිය දෙවර්ෂය තුලදී ජලජීවී ව්‍යාපෘති 12 ක්ද, විදුලිබල සහ බලශක්ති ව්‍යාපෘති 4 ක්ද, කාර්මික ව්‍යාපෘති 6 ක්ද, හෝටල් ව්‍යාපෘති 2 ක්ද, පතල් ව්‍යාපෘති 11 ක්ද, කෘෂිකර්ම සහ වන වගා ව්‍යාපෘති 2 ක්ද, අනුමත කරන ලදී. කෙසේ වෙතත් ම. ප.අ. විසින් මෙම කාලපරිච්ජේදය තුලදී පාරිසරික හේතු මත ජල ජීවී ව්‍යාපෘතියක් සහ ජල විදුලිබල ව්‍යාපෘතියක් ප්‍රතික්ෂේප කරන ලදී. මේ අතර ප්‍රවාහන පාරිසරික සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් ජාතික පරිසර ක්‍රියාත්මක සැලසුම 1996/ 97 යථාවත් කිරීමේ කාර්යයෙහි නියැලුණි. එමෙන්ම මෙම අමාත්‍යාංශය විසින් මොන්ට්‍රියල් සන්ධානය, දේශගුණ විපර්යාස සහ බාසෙල් සම්මුතිය වැනි ජාත්‍යන්තර සන්ධානවල බැඳීම් ක්‍රියාත්මක කිරීම නොකඩවා කරගෙන යන ලදී. නෝරාඩ් පාරිසරික සහයෝගිතා වැඩසටහනද අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ යටතේ ආයතනික සංවර්ධනය හා පුහුණුව, පරිසර සංරක්ෂණය හා කළමනාකරණය, පරිසර දූෂණය පාලනය කිරීම හා පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ පාරිසරික පර්යේෂණ සඳහා ආධාර සැපයේ. පාරිසරික නීතිරීතිවලට දක්වන අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා කුඩා පරිමාණ කර්මාන්ත වලට පරිසර සංරක්ෂණ බල පත්‍ර නිකුත් කිරීම වැනි බලතල පළාත් පාලන ආයතන වලට පැවරීම සඳහා අවශ්‍ය පියවරයන්ද අමාත්‍යාංශය විසින් ගන්නා ලදී.

පාරිසරික ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථා පිළිබඳ පුළුල් රාමුවක් පැවැතියද, ඒවා ක්‍රියාත්මක කිරීම සහ ඊට අනුකූලතාවය දැක්වීම හා සම්බන්ධ ගැටළු නිතර නිරීක්ෂණය කරනු ලැබීය. පාරිසරික නීතිරීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයන් නව කර්මාන්තශාලා සම්බන්ධයෙන් පහසුවන අතර, පැරණි කර්මාන්ත සම්බන්ධව විවිධ අපහසුතා මතුවී ඇත. පැරණි කර්මාන්ත බොහෝ විට නුසුදුසු ස්ථානවල ස්ථානගතව තිබෙන අතර ඒවායෙහි අපද්‍රව්‍ය අවමකිරීමේ හෝ නිසිලෙස බැහැර කිරීමේ පහසුකම් නොමැත. පාරිසරික නීතිරීති ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අනුකූලතාවය දැක්වීමේ ගැටළු වනාන්තර, ජෛව විවිධත්වය, නාගරික පරිසර දූෂණය, ඉඩම් සහ ජලය, වෙරළ සහ මුහුදු සම්පත් සහ පතල් කැනීමේ යන අංශවලද දක්නට ඇත. මානව සහ තාක්ෂණික සම්පත්, නියාමක අධිකාරීන් සතුව ප්‍රමාණවත් තරමින් නොපැවතීම, පාරිසරික පරීක්ෂණ සහ පසුවිපරම් කටයුතු වලට සහ අවශ්‍ය අවස්ථාවලදී නීතිමය පියවර ගැනීමට බාධාවක් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පාරිසරික ප්‍රශ්ණ හා සම්බන්ධ විශාල ප්‍රමාණයක මහජන පැමිණිලි සංඛ්‍යාවක් වර්ෂයක් පාසා නිසි පරිදි අවධානයට යොමු නොවී පවතී. එමෙන්ම පාරිසරික ගැටළු සම්බන්ධ විශ්වාස කටයුතු උපදේශක සේවයක් නොමැතිවීමේ අඩුපාඩුව පාරිසරික විධිවිධාන වලට අනුකූලතාවය දැක්වේමේදී සහ මග පෙන්වීම් අනුගමනය කිරීමේදී, කර්මාන්ත කරුවන් මුහුණ දෙන දැඩි සීමාවක්ව පවතී. දැනට පෞද්ගලික අංශයේ උපදේශක ආයතන 60 කට අධික සංඛ්‍යාවක් ඇතත්, පාරිසරික ගැටළු සම්බන්ධ ඵලදායී ලෙස උපදෙස් සැපයීමට අවශ්‍ය තාක්ෂණික හා විශේෂඥ දැනුම ප්‍රමාණවත් ලෙස ඔවුන් වෙත නැත. එහෙයින්, ශක්තිමත් සහ ස්වාධීන පාරිසරික උපදේශක ආයතන පිහිටුවීම කර්මාන්තකරුවන්ට මෙන්ම නියාමක ආයතනවලට ද මහෝපකාරී වනු ඇත. කර්මාන්තකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය පහසුකම් වලින් සමන්විත පරිසර විද්‍යාගාර පිහිටුවීමත්, පරිසර තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම් සහ අධ්‍යාපනික වැඩ සටහන් පැවැත්වීමත්, පාරිසරික නීතිරීතිවලට අනුකූලතාවය දැක්වීමේ ප්‍රමාණය ඉහළ නංවා ගැනීමට ඉවහල් වනු ඇත. ඊට අමතරව සිය කර්මාන්තශාලා වල පරිසරයට හානිකර නොවන තාක්ෂණික ක්‍රම ස්ථාපනය කිරීම සඳහා කර්මාන්තකරුවන් ධෛර්යමත් කරනුවස් ඵලදායී ආර්ථික දිරිගැන්වීම් ක්‍රමයක් හඳුන්වා දීම කළයුතුව ඇත. ඒ සමගම, ප්‍රාදේශීය මට්ටමේ පාරිසරික කළමණාකාරිත්වය සහ පාරිසරික ගැටළු සුපරීක්ෂණය ඵලදායක ලෙස ඉටු කිරීම සඳහා පළාත්පාලන ආයතනවල තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කළ යුතුව ඇත.

පාරිසරික විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ මෑත කාලීනව මුහුණදුන් ප්‍රධාන අභියෝගය වූයේ බලධාරීන් විසින් සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමේදී ඒවා ක්‍රියාත්මක කිරීමෙන් හෝ ක්‍රියාත්මක නොකිරීමෙන් ඇතිවන ආර්ථික සහ පාරිසරික ප්‍රතිවිපාක පිළිබඳ මැදිහත් තුලනාත්මක බවක් පවත්වා ගැනීමට හැකි වූයේද යන්නයි. යෝජිත ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පාරිසරික බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමත් සමග මෙවැනි ගැටළු මතුවිය.


## ආර්ථික වෘද්ධිය සහ පරිසරය

**විශේෂ සටහන 5**

ආර්ථික විද්‍යාවට අනුව පරිසරය සලකනු ලබන්නේ, පෘථිවියෙහි ජීවත්වන මිනිස් සහ වෙනත් විවිධ වර්ගවලට අයත් ජීවීන්ට විවිධාකාරයේ සේවා සපයනු ලබන, විවිධ සම්පත් වලින් සංයුක්ත වූ වත්කමක් වශයෙනි. පරිසරය සුවිශේෂ වූ වත්කමක් පමණක් මෙන්ම ඉතා වැදගත්ම වත්කම ද වන්නේ එය අපගේ පැවැත්ම සඳහා අවශ්‍ය ජීවපදාර්ථයන් සපයනු ලබන එකම මූලාශ්‍රය බැවිනි. වාතය, ජලය සහ සූර්යාලෝකය වැනි සෘජු වශයෙන් සැපයෙන සේවාවලට අමතරව, පරිසරය විසින් ආර්ථිකයට අමුද්‍රව්‍ය, බලශක්තිය සහ වෙනත් නිෂ්පාදන සම්පත් සපයනු ලබන අතර, ආර්ථිකය ඒවා භාවිතා කරමින් භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කරයි. මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ දී, යෙදවුම් වල ශේෂය අපද්‍රව්‍ය වශයෙන් පරිසරයට නැවත එකතු වේ. මෙම අපද්‍රව්‍ය නිසා සහ අධික ලෙස පරිසරයෙන් සම්පත් උකහා ගැනීම නිසා බාහිරතා ජනිත වන අතර එය නිෂ්පාදන අවස්ථාවේදී මෙන්ම පරිභෝජන අවස්ථාවේදී ද ඇතිවිය හැකිය. බාහිරතා යනු යම්පුද්ගලයෙකුගේ ක්‍රියාකාරමක් වෙනත් පුද්ගලයකුගේ සුභසාධනයට කෙරෙන බලපෑමයි. අවාසනාවකට මෙන් යහපත් බාහිරතාවලට වඩා අපට නිතර දකින්නට ලැබෙන්නේ අයහපත් බාහිරතා වන අතර, අයහපත් බාහිරතා පරිසරයේ වටිනාකම ක්ෂය කිරීමට හේතු වේ. එහෙයින් පරිසරයේ වටිනාකම පහත වැටීම වළක්වා ගැනීම හෝ අවම කරගත යුතු වන අතර එසේ කිරීමෙන් වත්මන් සහ අනාගත පරම්පරා වලට නොකඩවා සේවා සැපයීමට පරිසරයට හැකිවනු ඇත.

ආර්ථික වර්ධනය යන්නෙන් අදහස් කරනු ලබන්නේ, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය භෞතික වශයෙන් පුළුල් වීමයි. රටකට ආර්ථික වර්ධනයක් අවශ්‍ය වන්නේ ජීවන තත්ත්වය උසස් කර ගැනීම සඳහා සහ වැඩිවන ජනගහනය පෝෂණය කිරීම සඳහාය. ආර්ථික වර්ධනයක් මූලික වශයෙන් ක්‍රම දෙකකට සිදුවිය හැකිය. ප්‍රථමයෙන් අමුද්‍රව්‍ය, බලශක්තිය, ශ්‍රමය සහ වෙනත් නිෂ්පාදන සම්පත් යෙදවුම් ප්‍රමාණය වැඩිකිරීම තුලින් ආර්ථික වර්ධනය ලඟාකර ගත හැකිය. කෙසේ වෙතත් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පරිසරයෙන් අධික ලෙස සම්පත් උකහා ගැනීම යනු පරිසරය සීඝ්‍ර ලෙස ක්ෂය වීමයි. මෙය යොදාගන්නා තාක්ෂණය මත තවදුරටත් රඳා පවතී. අනෙක් අතට සම්පත් ද සීමාසහිත වේ. (උදා. ඛනිජ තෙල් නිධි) එම නිසා යෙදවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන් උදාකරගනු ලබන ආර්ථික වර්ධනය නිසා අනාගත පරම්පරාවලට හිමිවන සම්පත් ප්‍රමාණය ක්‍රමයෙන් ක්ෂය වේ. දෙවනුව තාක්ෂණික ප්‍රගතිය තුලින් ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම තුලින් ද ආර්ථික වර්ධනයක් ළඟාකරගත හැකිය. පරිසරයට හානිකර නොවන තාක්ෂණයක් භාවිතා කරන්නේ නම් මෙම ක්‍රමයෙන් ළඟා කරගනු ලබන ආර්ථික වෘද්ධියෙන් පරිසරයට සිදුවන බලපෑම් අල්පය. කෙසේ වෙතත් තාක්ෂණික ප්‍රගතියෙහි ද සීමා පවතී. එම නිසා, ආර්ථිකයේ නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ හා සේවා වල ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම සහ හිග හා ඉහළ මට්ටමක පරිසර දූෂණයක් ඇති කරනු ලබන සම්පත් වෙනුවට විකල්ප සම්පත් වර්ග ආදේශනය කිරීම පරිසරයට අවම බලපෑමක් සහිතව ආර්ථික වෘද්ධිය ළඟා කරගත හැකි වෙනත් උපක්‍රම ලෙස සලකනු ලැබේ. පරිසරය කෙරෙහි නිසි අවධානයකින් තොරව ළඟා කර ගනු ලබන ආර්ථික වර්ධනය නිසා පරිසරයට සිදුවන හානිය කඩිනම් කරනවා මෙන්ම අනාගත ආර්ථික වර්ධන හැකියාවට ද පීඩා ඇති කරයි. එහෙයින් පරිසරයට අවම හානියක් සහිතව හෝ හානි රහිතව ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමේ මාර්ගය වන්නේ අඩුවෙන් නිෂ්පාදනය කිරීම නොව කාර්යක්ෂම ලෙස නිෂ්පාදනය කිරීමයි. තිරසාර සංවර්ධනය එනම් 'අනාගත පරම්පරාවල අවශ්‍යතා ඉටුකර ගැනීමට ඇති හැකියාවට හානිකර නොවන ආකාරයට වර්තමාන පරම්පරාවේ අවශ්‍යතා ඉටු කර ගැනීම' යන්නට පදනම මෙයයි.

පාරිසරික ප්‍රශ්න රටින් රටට වෙනස්වන අතර එය එම රටවල සංවර්ධන අවස්ථාව, ආර්ථික ව්‍යුහය සහ ඔවුන්ගේ පාරිසරික ප්‍රතිපත්ති හා සම්පත් හිමිකම මත රඳා පවතී. ආර්ථික ක්‍රියාකාරකම් ආශ්‍රිත පාරිසරික ප්‍රශ්න, වායු දූෂණය, ජල දූෂණය, ඉඩම්වල ආර්ථික වටිනාකම පහත හෙළීම සහ වන සම්පත් විනාශයේ සිට ජෛවීය විවිධත්වය අහිමි වීම, දේශගුණ විපර්යාස සහ ලෝක ගෝලය උණුසුම්වීම දක්වා වූ පරාසයකට වැටේ. රටවල් කීපයක් සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයන වලින් පරිසර හානිය සහ ආදායම් අතර ධන සම්බන්ධතාවයක්, අඩු ආදායම් මට්ටම් වලදී ඇති බවත් සෘණ සම්බන්ධතාවයක් ඉහළ ආදායම් මට්ටම්වල දී පවතින බවත් අනාවරණය කරගෙන ඇත. මෙම තත්ත්වය පහත ප්‍රස්ථාරය මඟින් පෙන්නුම් කර ඇත. පළමුවෙන් ආදායම වැඩිවීමත් සමග පරිසර හානිය A සිට B දක්වා වැඩිවන අතර, ඉන්පසු තවදුරටත් ආදායම වැඩිවීමේ දී පරිසර හානිය ක්‍රමයෙන් අඩු වේ. එහෙයින්, අඩු දියුණු රටවල් සම්බන්ධයෙන් යෝජනා වී ඇත්තේ, ප්‍රස්ථාරයේ සඳහන් පරිදි ආරක්ෂිත කලාපය නොඉක්මවන ලෙස D සිට E දක්වා යා හැකි මාර්ගයක් සොයා ගැනීමයි.




ඉහතින් දක්වා ඇති පරිදි සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වල පරිසර දූෂණය සඳහා දුගී බව ප්‍රධාන හේතුවක්ව පවතී. සැබැවින්ම, දිළිඳු පුද්ගලයන් පරිසර දූෂණයේ නියෝජිතයන් මෙන්ම එහි පීඩනයට ගොදුරුවන්නෝ ද වෙති. පාංශු ඛාදනය, වෙරළබඩ දූෂණය, පරිසර දූෂණය හා සම්බන්ධ රෝගාබාධ සහ ගෘහ අපද්‍රව්‍ය නිසා පෘථිවි තලයෙහි සහ අභ්‍යන්තරයෙහි ඇති ජලය දූෂණය වීම ආදී පාරිසරික ගැටළු ඇති වීමට හෝ ඒවා උග්‍රවීමට දුගීභාවය හේතු වේ. දුගී බව තුරන් කිරීමේ දිගු කාලීන ක්‍රමෝපාය විය යුත්තේ සේවා නියුක්ති අවස්ථාවන් වැඩි වැඩියෙන් ජනිත කිරීම තුළින් දුගී ජනතාවගේ ආදායම් මට්ටම් ඉහළ නැංවීමයි. ඒ සඳහා ආර්ථික වෘද්ධිය සෘජු වශයෙන් මෙන්ම වක්‍ර ආකාරයෙන් ද බලපායි. ආර්ථික වෘද්ධිය නිසා සේවා නියුක්ති

විශේෂ සටහන 5 (සම්බන්ධයි)

අවස්ථාවන් බිහිවේ. එමෙන්ම සමස්ත ආදායම වර්ධනය වීමත් සමග ආදායම් පැවරීම වඩාත් පහසු කාර්යයක් වන බව පොදුවේ පිළිගැනේ. කෙසේ වෙතත්, ඉහතින් සඳහන් කළ පරිදි වර්ධන ක්‍රියාවලියේ දී පාරිසරික බලපෑම් පිළිබඳව නිසි අවධානයක් යොමු නොකළහොත් දිගුකාලීන ආර්ථික වර්ධනයට බාධා ඇතිවිය හැකිය. මින් අදහස් වන්නේ ආර්ථික වර්ධනය සහ පරිසරය එකිනෙකට අනුපූරක වනවා පමණක් නොව, අන්‍යෝන්‍ය වශයෙන් ආධාර වන බවත් ය.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වල ආර්ථික වර්ධනය සඳහා කෘෂිකාර්මික අංශය වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. ශ්‍රී ලංකාවේ වන සම්පත් සහ ධීවර අංශය ද ඇතුළත් කෘෂිකාර්මික අංශය දේශීය නිෂ්පාදිතයට සියයට 20 කින් පමණ දායක වේ. ආසන්න වශයෙන් සේවා නියුක්ති ශ්‍රම බලකායෙන් සියයට 40 ක් පමණ මෙම අංශයේ රැකියාවල නියැලී සිටී. එහෙයින් කෘෂිකාර්මික සංවර්ධනය ආර්ථික වෘද්ධිය සඳහාත් දුගීබව තුරන් කිරීම සඳහාත් ප්‍රබල බලපෑමක් ඇතිකරයි. පැවැති රජයයන් විසින් පාරිසරික බලපෑම් පිළිබඳව නිසි අවධානයකින් තොරව, වේලි ඉදිකිරීම, විශාල සහ සුළු පරිමාණයේ වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, වනාන්තර කුඹුරු ඉඩම් බවට පරිවර්තනය කිරීම, කෘෂි යෙදවුම් සඳහා සහනාධාර ලබාදීම සහ කෘෂිකාර්මික නිමවුම් සඳහා මිල පාලන ක්‍රම පැනවීම වැනි ක්‍රියාමාර්ග සඳහා වැඩි වැඩියෙන් සම්පත් වෙන් කරන ලද්දේ එහෙයිනි. කෘෂිකාර්මික අංශයේ සැලසුම් රහිත ඉඩම් භාවිතය, සීමා රහිත ලෙස රසායනික පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය, පාංශු ඛාදනය, අකාර්යක්ෂම ජල භාවිතය, වගකීම් රහිත ලෙස වනාන්තර එළිපෙහෙළි කිරීම යනාදිය බැරෑරුම් පාරිසරික ප්‍රශ්න ඇති කරයි. වැඩිවන ජනගහනය පෝෂණය කිරීම සඳහාත්, ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහාත්, ආහාර සැපයුම් ප්‍රසාරණය කළයුතු බව සත්‍යයක් නමුත් මෙම ප්‍රසාරණය කළ යුතු වන්නේ ස්වාභාවික පරිසරය අනවශ්‍ය ලෙස විනාශ වන ආකාරයට නොවේ. එමෙන්ම කෘෂිකාර්මික ප්‍රසාරණයකදී සිදුවන බොහෝ අයහපත් පාරිසරික ප්‍රතිඵල ශක්තිමත් කෘෂිකාර්මික ප්‍රතිපත්ති අනුගමනය කිරීම, දේපල අයිතිය තහවුරු කිරීම, ඵලදායී ව්‍යාප්ති සේවා සැපයීම සහ තාර්කික මිල ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ආදිය තුළින් මගහරවාගත හැකිය. නිදසුනක් ලෙස බහුබෝග වගාව, ජීව - තාක්ෂණය භාවිතය, නව වාරිමාර්ග ක්‍රම හඳුන්වාදීම, ජලය සහ ඇතැම් කෘෂිකාර්මික යෙදවුම් සඳහා තාර්කික සහනාධාර ක්‍රමයක් ඇතිකිරීම, දේපල අයිතිය තහවුරු කිරීම ආදී ක්‍රියාමාර්ග තුළින් කෘෂි ඵලදායීතාව ඉහළ නංවා ගැනීම, කෘෂි රසායන භාවිතය අඩු කිරීම, පාංශු ඛාදනය අඩුකර ගැනීම සහ ජලය කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම වැනි පරිසරයට යහපත් ප්‍රතිඵල ඇතිකරලනු ඇත.

විවිධ වූ හේතු මත සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ රටවල් වල සංවර්ධන ක්‍රියාවලියේ දී කාර්මික ප්‍රසාරණයට ප්‍රමුඛ ස්ථානයක් ලබා දී ඇත. සංවර්ධනය වෙමින් පවත්නා කුඩා රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ දිගුකාලීන වර්ධන අපේක්ෂාවන් සහ සේවා නියුක්ති අවස්ථා උත්පාදනය ද කාර්මික ප්‍රසාරණය මත රඳ පවතී. ශ්‍රී ලංකාවේ ද දේ.නි.යේ කාර්මික අංශයේ දායකත්වය 1960 දී සියයට 11 සිට 1996 දී සියයට 20 දක්වා වැඩිවී ඇත. කෙසේ වෙතත්, කාර්මික ප්‍රසාරණය මෙන්ම එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන නාගරීකරණය ද බැරෑරුම් පාරිසරික ගැටළු වලට හේතු වේ. වායු දූෂණය, ජල දූෂණය, අනිසි අපද්‍රව්‍ය බැහැර කිරීම, නාගරික රථවාහන තදබදය එවැනි පාරිසරික ගැටළු කිපයකි. ඇත්ත වශයෙන්ම වර්තමානයෙහි බොහෝ දියුණු රටවල් වල පාරිසරික ගැටළු මතු වූයේ 18 වන සියවසේ සිදු වූ කාර්මික විප්ලවයන් සමගය. කාර්මික ප්‍රසාරණය නිසා සිදුවන පරිසර හානිය අඩුකර ගැනීම සඳහා යෝග්‍ය තාක්ෂණයක් භාවිතය පිණිස දිරි ගැන්වීම කිරීම, පාරිසරික තත්ත්ව නියමයන් පැණවීම, කාර්මික ජනපද පිහිටුවීම, නාගරික සේවා භාවිතා කරන්නන්ගෙන් ගාස්තු අයකිරීම වැනි ප්‍රතිපත්ති යෝජනා වී ඇත. මෙවැනි ප්‍රතිපත්ති නිසා ආර්ථික වර්ධනයට බාධා පැමිණවිය හැකියයි සමහරකුට තර්ක කළ හැකි වුව ද, අධ්‍යයන වලින් හෙළිවී ඇත්තේ එම බලපෑම ඉතා සුළු බවත් කෙටි කාලීනව පමණක් පවතින බවත් ය. කෙසේ වෙතත් පාරිසරික ක්‍රියාකාරකම් වලින් සැලකිය යුතු තරමේ ව්‍යාපාර කටයුතු එකතුවක් සහ සේවා නියුක්ති අවස්ථාවන් ප්‍රමාණයක් ද ජනනය වේ.

දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම සහ බලශක්ති පරිභෝජනය අතර සමානුපාතික සම්බන්ධතාවයක් පවතින බව නිරීක්ෂණය කර ඇත. ආර්ථික වර්ධන ක්‍රියාවලියේ දී කාර්මික අංශයේ දායකත්වය වැඩිවන විට මෙම සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් ස්වරූපයක් ගනී. දැව, පොසිල බලශක්තිය, ගල් අඟුරු, තාප බලශක්තිය, ජල විදුලි බලය, න්‍යෂ්ටික බලය, ප්‍රධාන බලශක්ති මූලාශ්‍ර වේ. අකාර්යක්ෂම ලෙස මෙම බලශක්ති මූලාශ්‍ර උපයෝජනය කර ගැනීම ආශ්‍රිතව වායු දූෂණය දේශගුණික විපර්යාසය, ආම්ලික වර්ෂා, ජලසම්පත් අහිමිවීම වැනි බැරෑරුම් පාරිසරික ප්‍රශ්න මතුවියහැකිය. කාර්යක්ෂම උසස් තාක්ෂණික ක්‍රම යොද ගැනීම මගින් බලශක්ති පරිභෝජනය වැඩිනොකර නිෂ්පාදනය වැඩිකර ගැනීමේ ක්‍රම ඇත. නිදසුන් වශයෙන් උසස් තාක්ෂණයෙන් යුත් වැඩිදියුණු කරන ලද මෝටර් රථයක්, පෙට්‍රල් ලීටරයකට කිලෝ මීටර් 25 ක් තරම් දුරක් ධාවනය කළ හැකිවන අතර, සාමාන්‍ය මෝටර් රථයක කිලෝ මීටර් 7 කට වඩා ධාවනය නොවේ. ශ්‍රී ලංකාවේ දැනට සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට 80 ක් පමණ ජල විදුලිබල මූලාශ්‍ර වලින් ජනනය වන අතර ඉතිරිය තාප බල මූලාශ්‍ර වලින් ලැබේ. ඉදිරියේ දී ජල විදුලිබල උත්පාදනයේ සැළකිය යුතු තරම් වැඩිවීමක් අපේක්ෂා කළ නොහැකි බැවින් වැඩිවන විදුලිබල ඉල්ලුම සපුරාලීමට හැකිවන්නේ ගල් අඟුරු, ඩීසල් හෝ ගෑස් භාවිතා කරන තාප බලය උත්පාදන ව්‍යාපෘති මගිනි. මෙවැනි ව්‍යාපෘති වල පාරිසරික බලපෑම, යෝග්‍ය ජලවිදුලිබල ව්‍යාපෘතිවලට වඩා උග්‍ර විය හැකිය. එමෙන්ම ඉහළ යන ආර්ථික ක්‍රියාකාරීත්වයටත් සමග වැඩිවන කර්මාන්තශාලා වල සහ මෝටර් වාහන ඉන්ධන පරිභෝජනය වැඩිවීම වායු දූෂණයේ ප්‍රධාන මූලාශ්‍රයක් වේ. එහෙයින් පරිසරයට හානිකර නොවන සුළං බලය, සූර්ය තාපය, ජීව වායුව සහ සුළු පරිමාන ජලවිදුලි ව්‍යාපෘති හඳුන්වාදීම, කාර්යක්ෂම හා පරිසරයට යෝග්‍ය තාක්ෂණයක් යොද ගැනීම, තාර්කික බලශක්ති මිල ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ බලශක්තිය සඳහා ඇති වැඩිමනත් ඉල්ලුම පාලනය කිරීම ඉහත දැක්වූ ආකාරයේ පාරිසරික හානි අවම කරගැනීම සඳහා යෝජනා වී ඇති ප්‍රතිකර්ම වේ. කෙසේ වෙතත් පාරිසරික හේතූන් මත බලශක්ති අංශයේ ප්‍රසාරණයට බාධා ඇතිවීම ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපෑ හැකිය.

සාමාන්‍යයෙන් සාර්ව ආර්ථික ස්ථාවරභාවය සඳහා අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති ආර්ථික වර්ධනයට මෙන්ම පරිසරයට ද හිතකර වී ඇත. එම නිසා, මිල විකෘතිතා හා අපූර්ණ වෙළෙඳපොළ තත්ත්වයන් ඉවත් කිරීම, වෙළෙඳපොළ මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳ බාධක ලිහිල් කිරීම වැනි ප්‍රතිපත්ති පාරිසරික සහ ආර්ථික වාසි ඇතිකිරීමට හේතු වේ. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපත්ති. වලින් අපේක්ෂිත ප්‍රතිඵල ආර්ථිකයේ වෙනත් අංශවල පවත්නා දෘඪතාවයන් නිසා නොලැබී යාමට ඉඩ ඇත. එම නිසා ආර්ථික වර්ධනය සහ පාරිසරික කරුණු අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති වලට වැඩිමනත්ව ආයතනික, නීතිමය සහ සුපරීක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය දැඩි ලෙස ඉස්මතු වේ.